# සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීම

එස්. ඇපාසිංහ

රසිකා විජේසිංහ




8.03
)

HARTI

2014/12
2015/11

# සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීම

එස්. ඇපාසිංහ

රසිකා විජේසිංහ

සිංහල පර්යේෂණ වාර්තා අංක: 56 2013 සැප්තැම්බර්

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත

කොළඹ 07

24258

24258

පුස්තකාලය
LIBRARY

ප්‍රථම මුද්‍රණය : 2013 සැප්තැම්බර්

© හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

සියලුම හිමිකම් ඇවරිණ

ISBN : 978-955-612-157-5

පරිඝනක ගත කිරීම: ජී.එම්. විජිතා පද්මිණී

පරිඝනක පිටු සැකසුම හා කවර නිර්මාණය: ජී.පී. උදේනි කරුණාරත්න

# පෙරවදන

වී ගොවීන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම තුළින් ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය ඉහළ නැංවීම ප්‍රධාන අරමුණ කොට ගනිමින් පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් හඳුන්වා දුන් සංකල්පයකට අනුව මෙම සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය පූර්ව ඇගයීමකට ලක් කරමින් එහි ඵලදායීතාවය සහ තිරසාරභාවය පිළිබඳව අධ්‍යයනය කොට එම ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථකව පවත්වා ගෙන යාමට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනය තුළින් සිදු කෙරේ.

අධ්‍යයන සොයා ගැනීම් තුළින් දක්වන ආකාරයට ග්‍රාමීය මට්ටමෙන් ගෘහාශ්‍රිත සහල් වෙළඳපොළ ස්ථාපිත කිරීමේ අරමුණ සැලකිල්ලට ගැනීමේ දී සහල් සැකසුම් ගම්මාන සංකල්පය ශ්‍රී ලංකාවේ ගුණාත්මයෙන් යුත් සහල් නිෂ්පාදනය, වී අලෙවිය සහ රැකියා වියුක්තිකයන්ට ආදායම් උත්පාදනය යන අංශවල පවතින ගැටලූ ගණනාවකට විසඳුම් සපයන වඩාත් උචිත ක්‍රමවේදයක් වෙයි. ගෘහාශ්‍රිත මට්ටමෙන් සහල් සැකසුම සිදු කිරීමේ ක්‍රියාවලිය විශාල වශයෙන් පවුලේ ශ්‍රමය මත රඳා පවතින අතර කර්මාන්තයේ ලාභය තීරණය කරන ප්‍රධාන නිර්ණායකය වන්නේ නිතරම වෙනස් වන වී මිලයි. මෙම ගැටලුවට එක් විසඳුමක් වන්නේ කර්මාන්තකරු විසින් ම නිපදවන වී භාවිතා කිරීමයි. අස්වනු නෙලන කාලයේ වී ගබඩා කර තබා ගැනීම ඊට විකල්පයක් වුව ද, මූල්‍යමය සහ ගබඩා පහසුකම් නොමැති වීම එයට බාධාවකි.

මෙම වැඩි දියුණු කළ සහල් සැකසුම් ක්‍රමය මඟින් නාඩු සහල් කිලෝ එකක නිෂ්පාදන වියදම රු.40.20ක් වන අතර සම්බා සහල් කිලෝ එකක නිෂ්පාදන වියදම රු.40.70ක් වේ. ඒ අනුව, අලෙවි කිරීමේ දී සම්බා කිලෝ එකකින් රු.13.50ක් ද නාඩු කිලෝ එකකින් රු.9.80ක ලාභයක් ද ලබා ගත හැකි බව අධ්‍යයනය මඟින් පෙන්වා දෙයි.

ඌණ උපයෝගී පවුලේ ශ්‍රමය, විශේෂයෙන් කාන්තා ශ්‍රමය අර්ථාන්විත ආකාරයකට යොදවා ගැනීමේ හැකියාවක් පවතින කෘෂි ආශ්‍රිත කර්මාන්තයක් ලෙස මෙම සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඉහළ වැදගත්කමක් පෙන්නුම් කරයි. එබැවින්, සහල් සැකසුම්කරුවන්ගේ පවතින ගැටලුවලට නිසියාකාර විසඳුම් ලබා දෙමින් සහල් සැකසීම වාණිජ මට්ටමේ කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම ප්‍රතිපත්ති සම්පාදකයන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන්ට මෙම අධ්‍යයන වාර්තාවෙහි අන්තර්ගතය මනා පිටුවහලක් සපයනු ඇතැයි අපේක්ෂා කරමි.

ජේ.එම්. අභයරත්න

අධ්‍යක්ෂ

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

# ස්තුතිය

'දේශීය සහල් වෙළෙඳපොළ ප්‍රාදේශීයකරණය කිරීම සඳහා "සහල් සැකසුම් ගම්මාන" ව්‍යාපෘතිය ක්‍රියාවට නංවමු' යන 'මහින්ද චින්තන' ප්‍රතිපත්ති (පිටු අංක 42) ප්‍රකාශන වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීමට මෙම අධ්‍යයනය පිටුවහලක් වනු නො අනුමාන ය. එම අවශ්‍යතාව හඳුනාගනිමින් ඒ සඳහා අවැසි ආයතන ප්‍රතිපාදනයන් සපයා දෙමින් අප උනන්දු කළ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ නිතිඥ ලලිත් කාන්ත ජයසේකර මහතාට අපි අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු.

මෙම අධ්‍යයනයේ පවතින කාලීන වැදගත්කම හඳුනාගෙන පර්යේෂණ වාර්තාවක් ලෙස පිළිගැන්වීමට අවශ්‍ය උපදෙස් ලබා දුන් වර්තමාන අධ්‍යක්ෂ ජී.එම්. අභයරත්න මහතාට ද, අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය දක්වා නිසි මඟ පෙන්වීම ලබා දෙමින් අප මෙහෙය වූ අතිරේක අධ්‍යක්ෂක ආචාර්ය එල්.පී. රූපසේන මහතාට ද, නිරන්තර උපදෙස් හා සහයෝගය ලබා දුන් කෘෂිසම්පත් කළමනාකරණ අංශයේ අංශ ප්‍රධාන පී.ආර්. වීරක්කොඩි මහත්මියට ද අපි අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

අධ්‍යයනයේ අවසාන කෙටුම්පත උසස් තත්ත්වයකට රැගෙන ඒම සඳහා වඩාත් ඵලදායී අදහස් හා යෝජනා ලබා දුන්, කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එස්.පී. ප්‍රේමරත්න මහතා සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩී.එම්.කේ. අනුරුද්ධ මහතාව ද ස්තුති පූර්වකව සිහිපත් කරමු.

අධ්‍යයනයේ ප්‍රාථමික දත්ත ලබා ගැනීමේ දී සහාය ලබා දුන් අනුරාධපුර පසු අස්වනු තාක්ෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ඩී.පී. ස්වර්ණසිරි මහතා සහ ව්‍යාප්ති නිලධාරිනී සී.අයි.කේ. දිසානායක මහත්මිය ඇතුළු එම ආයතන නිලධාරී මණ්ඩලයට ද, සහල් සැකසුම් ගම්මානවලට අදාළ සේවයේ නියුතු කෘෂි නිෂ්පාදන හා පර්යේෂණ සහකාර නිලධාරී මහතුන්ට ද විශේෂ ස්තුතිය පිරි නමමු.

දත්ත රැස් කිරීමේ දී විශේෂ සහායක් ලබා දුන් සංඛ්‍යාන නිලධාරී එන්.ඒ.කේ.එස්. අනුරසිරි මහතා, සංඛ්‍යාන සහකාර එස්.ඩී.පී. සුදර්ශනී මිය, දත්ත සැකසුම් ඒකකයේ එස්.එස්.ජේ. රෝසා සහ හංස යසරත්න යන මහත්වරුන්ට ද, අනියම් විමර්ශන නිලධාරීන් ලෙස සහාය ලබා දුන්, කේ.එච්.යූ.එස්. මල්කාන්ති, ඩී.එම්. ලක්ෂිකා දිල්රුක්ෂි, සී.එම්.ශ්‍යාමා දීපානි, එම්.ජී.එස්. ප්‍රියදර්ශනී, එච්.ඒ. ඉන්දුකා සංජීවනී සහ ජී.ඒ. ඉෂංකා සඳමාලි යන මෙනවියන්ට ද අපි අපගේ ස්තුතිය පිරි නමමු.

ද්විතියික දත්ත ලබා ගැනීමේ දී සහාය ලබා දුන් සන්ධ්‍යා සේනානායක මිය, පුස්තකාලයාධිපති ශ්‍රීමා කටුගම්පල, සහකාර පුස්තකාලයාධිපති වයි.කේ.පී. වීරරත්න මහත්මියටත්, දත්ත විශ්ලේෂණය කටයුතු සිදු කළ දත්ත සැකසුම් ඒකකයේ ඒකක ප්‍රධාන, එම්.ඩී.එල්. සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, වාර්තා පිටපත පරිඝනක ගත කළ ජී.එම්. විජිතා පද්මිණී මහත්මියටත්, පිටකවරය නිර්මාණය කළ උදේනි කරුණාරත්න මහත්මියටත් අපි අපගේ ස්තුතිය පිරි නමමු.

තව ද, සෝදුපත් බැලීමෙන් සහාය වූ ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකයේ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී එස්.ඒ.සී.යූ. සේනානායක මහතාටත්, මුද්‍රණ අංශයේ ඩී.ජී. ධර්මපාල මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ප්‍රවාහන අංශයේ සියලු කාර්ය මණ්ඩලයටත්, නන් අයුරින් සහාය වූ සියලු දෙනාටත් කෘතඥ පූර්වකව ස්තුතිය පිරි නමමු.

එස්. ඇපාසිංහ
රසිකා විජේසිංහ

# සංක්ෂිප්තය

පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් දියත් කළ සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඇගයීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. අනෙකුත් විශේෂිත අරමුණු වූයේ, පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය ඇගයීමත්, ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා අධ්‍යයනය කිරීමත්, සහල් සැකසුම්කරුවන්ගේ ආදායම් හා වියදම් තිමානය කිරීමත්, ව්‍යාපෘතියේ තිරසරභාවය හා බැඳුණු සාධක විශ්ලේෂණය කරමින් එම වැඩසටහන සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කිරීමත් ය.

මෙම අධ්‍යයනයේ දත්ත රැස් කිරීම සඳහා සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක නවය අතුරින් අහඹු ලෙස දිස්ත්‍රික්ක හතරක් තෝරා ගන්නා ලද අතර එම දිස්ත්‍රික්කයන් හි පවතින සියලුම සහල් සැකසුම් ගම්මාන වලින් 50%ක් නියෝජනය වන ලෙස ගම්මාන 67ක් තෝරා ගන්නා ලදී. එක් කර්මාන්තකරුවෙක් නියැදි ඒකකයක් ලෙස සලකා තෝරා ගත් ගම්මානවල කර්මාන්තකරුවන්ගෙන් 15%ක නියැදියක් තෝරා ගන්නා ලදී. මේ අනුව, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 184ක් ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 81ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 95ක් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ 9ක් ලෙස සම්පූර්ණ නියැදිය 369ක් විය.

අධ්‍යයනයේ සොයා ගැනීම්වලට අනුව, පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් හඳුන්වා දෙන ලද ගුණාත්මක සහල් සැකසීමේ තාක්ෂණය පිළිබඳ පුහුණුලාභීන් අතරින් අහඹු ලෙස තෝරා ගත් 369ක නියැදියෙන් 41%ක් පුහුණුලාභීන් පාරිභෝජනය සඳහා පමණක් ද, 47% පුහුණුලාභී හු පාරිභෝජනය හැරුණු කොට අලෙවිය සඳහා ද සහල් සැකසීමේ නියැලෙමින් සිටිය හ. ඒ අනුව, ග්‍රාමීය මට්ටමේ දී ගුණාත්මක සහල් නිෂ්පාදනය හා පාරිභෝජනය ඉහළ නැංවීම සඳහාත්, ඒ ආශ්‍රිත ව්‍යවසායකයන් බිහි කිරීම සඳහාත් පසු අස්වනු තාක්ෂණ ආයතනය ලබා දුන් පුහුණුව ඵලදායී ප්‍රයත්නයක් බව සඳහන් කළ හැකි ය.

නියැදියේ බහුතරය එනම් 82% (302) කාන්තාවන් ය. ඉන් 48%ක් ම (145) ගුණාත්මක සහල් සැකසුම, පාරිභෝජනය හා අලෙවිය යන අරමුණු දෙක උදෙසා පමණක් සිදු කරනු ලබයි. ඉන් 59% (86) කගේ ම ප්‍රධාන ආදායම් මාර්ගය සහල් සැකසීම වේ. මේ අනුව, ග්‍රාමීය කුටුම්භවල කාන්තාවන් තමන්ට සුදුසු ස්වයංරැකියාවක් ලෙස සහල් සැකසීම තෝරා ගෙන ඇත. ඔවුන් ගෘහස්ථ කටයුතු වල නියැලෙන අතර අමතර ආදායමක් ලබා ගැනීම සඳහා උනන්දු වන කාන්තාවන්ට මෙය කදිම ආදායම් මාර්ගයකි. එබැවින්, මෙම කර්මාන්තය සඳහා පිරිමි පාර්ශවයේ වැඩි යොමුවීමක් දක්නට නො ලැබෙන නමුත් සමස්ත නියැදියෙන් 1%ක් පමණ සහල් සැකසුම් කර්මාන්තය තම ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස තෝරා ගෙන ඇත.

සහල් සැකසුම් ගම්මාන සංකල්පය අනුව, මෙම වැඩසටහන දියත් කිරීම නිසා එක් ගමක් තුළ සහල් සැකසුම්කරුවන් රාශියක් බිහිවීමත්, ඔවුනොවුන්ට මහා පරිමාන සහල් සැකසුම්කරුවන් සමඟ තරඟ කිරීමට නො හැකිවීමත් හේතුවෙන් තම නිෂ්පාදන අලෙවි කිරීමට නිශ්චිත වෙළෙඳපොළක් නිර්මාණය වී නැත. ඒ අනුව, වාණිජ මට්ටමේ ව්‍යාවසායකයන් බිහිවීම පුහුණුලාභීන්ගෙන් 15%කට පමණ සීමා වී තිබේ. එබැවින්, වැඩසටහනෙන් අපේක්ෂිත පරිදි සහල් සැකසුම් ගම්මාන බිහි කිරීමේ ප්‍රයත්නය එතරම් සාර්ථකත්වයක් පෙන්වා නැත.

ගුණාත්මක සහල් නිෂ්පාදන තාක්ෂණය ප්‍රචාරණය වීමත්, එමගින් ග්‍රාමීය මට්ටමේ ගුණාත්මක සහල් නිපදවීම හා ග්‍රාමීය ජනතාව ඒවා පාරිභෝජනයට පෙළඹීමත් මෙම වැඩසටහනේ ධනාත්මක ප්‍රතිඵල වේ. සහල් සැකසුම් ගම්මාන ක්‍රමයේ ප්‍රගතිය දෙආකාරයකින් විග්‍රහ කළ හැකි ය. යැපුම් මට්ටමේ දී ගුණාත්මක සහල් පාරිභෝජනය දිරිගැන්වීම සඳහා ගුණාත්මක සහල් නිපදවීමේ තාක්ෂණය ප්‍රචලිත කිරීම හා වාණිජ මට්ටමේ දී සහල් සැකසුම් කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම එම දෙ ආකාරයයි.

ගුණාත්මක තත්ත්වයේ සහල් පාරිභෝජනය දිරි ගැන්වීම සඳහා මෙම තාක්ෂණය දිවයින පුරා ව්‍යාප්ත කළ යුතු අතර ඒ සඳහා ගුණාත්මක සහල් සැකසුම් ක්‍රමය පිළිබඳව කෘෂි ව්‍යාප්ති නිලධාරීන් හරහා ගම් මට්ටම දක්වා දැනුවත් කොට ග්‍රාමීය සංවිධානවල ඉල්ලුම මත පදනම් වෙමින් කණ්ඩායම් ප්‍රවේශයක් ඔස්සේ පුහුණු වැඩසටහන් දියත් කළ යුතු ය.

ගුණාත්මක සහල් සැකසීම වාණිජ මට්ටමේ කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගල ප්‍රවේශයක් අනුගමනය කළ යුතු ය. ඒ සඳහා විභවතා ඇති කර්මාන්තකරුවන් හඳුනා ගැනීමේ දී ව්‍යවසායකත්ව කුසලතා සහිත සහල් සැකසීම කර්මාන්තයක් වශයෙන් පවත්වා ගෙන යාමට කැමැත්ත හා කැපවීම ඇති, ප්‍රාග්ධනය සපයා ගත හැකි පුද්ගලයන් තෝරා ගත යුතු ය. ඔවුන් මෙම කර්මාන්තය වෙත යොමු කිරීම හා පසු විපරම් කොට ඔවුන් මුහුණපාන ගැටලු නිරාකරණය කිරීම සඳහා පියවර ගැනීම කළ යුතු ය. ගුණාත්මක සහල් නිෂ්පාදන කර්මාන්තයේ අඛණ්ඩ වර්ධනය උදෙසා මෙන් ම ගුණාත්මක සහල් පාරිභෝජනය ජනප්‍රිය කරවීම සඳහා රාජ්‍ය ප්‍රචාරක වැඩසටහන්වල දී මෙම තාක්ෂණය ප්‍රචාරණය කිරීමට පියවර ගැනීම වැදගත් වේ.

පටුන

පෙරවදන iii
ස්තුතිය iv
සංක්ෂිප්තය v

පළමුවැනි පරිච්ඡේදය
1.1 හැඳින්වීම 1
1.2 අධ්‍යයන ගැටලු 2
1.3 ප්‍රධාන අරමුණු 3
1.3.1 විශේෂිත අරමුණු 3
1.4 අධ්‍යයනයේ වැදගත්කම 3
1.5 පර්යේෂණ ක්‍රමවේදය 3
1.5.1 තොරතුරු රැස් කිරීමට පදනම් කර ගත්තා දර්ශක 3
1.5.2 දත්ත රැස් කිරීම 4
1.5.2.1 ප්‍රාථමික දත්ත ලබා ගැනීම 4
1.5.2.2 ද්විතීයික දත්ත ලබා ගැනීම 5
1.6 දත්ත විශ්ලේෂණය 5
1.7 පරිච්ඡේද සැකසුම 6

දෙවැනි පරිච්ඡේදය
සාහිත්‍ය විමර්ශනය 7
2.1 හැඳින්වීම 7
2.2 න්‍යායාත්මක විශ්ලේෂණය 7
2.2.1 ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය සහ අලෙවිය 7
2.2.2 වී අලෙවිය 9
2.2.3 සහල් සැකසුම් ගම්මාන වැඩසටහන 9
2.3 ආනුභාවික විශ්ලේෂණය 14
2.3.1 සහල් සැකසුම් ගම්මාන වැඩසටහන සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන් 14
2.3.2 අන්තර්ජාතික මට්ටමේ සහල් සැකසුම් ගම්මාන 15

තෙ වැනි පරිච්ඡේදය
කර්මාන්තකරුවන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය 17
3.1 හැඳින්වීම 17
3.1.1 අධ්‍යයන ප්‍රදේශය 17
3.2 නියැදියේ සමාජ-ආර්ථික තොරතුරු 18
3.2.1 වයස් කාණ්ඩ අනුව සහල් සැකසුමට සහභාගිත්වය 18
3.2.2 අධ්‍යාපන තත්ත්වය අනුව නියැදි ව්‍යාප්තිය 19



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

3.2.3 කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියාව 20
3.2.4 පවුලේ සාමාජික සංඛ්‍යාව 21
3.2.5 කුඹුරු ඉඩම් භාවිතය හා අස්වනු සහල් සැකසුමට යොදා ගැනීම 22
3.3 ගෘහස්ථ ආදායම 24
3.3.1 අලෙවිය සිදු කරන කුටුම්භ පමණක් සලකා බැලීම 25
3.3.2 ලෝරන්ස් වක්‍ර විග්‍රහය අනුව ගොවි ආදායම් මට්ටම් 26

**සිව්වැනි පරිච්ඡේදය**
**ප්‍රතිඵල හා සාකච්ඡා** 27
**අරමුණ 1** 27
4.1 සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ ක්‍රියාත්මක ක්‍රමවේදය ඇගයීමකට ලක් කිරීම 27
4.1.1 හැඳින්වීම 27
4.1.2 ගම්මානය සහ පුහුණුලාභීන් තෝරා ගැනීම 28
4.1.3 ගම්මානය සහ පුහුණුලාභීන් තෝරා ගැනීම සාර්ථක ද? 31
**අරමුණ 2** 32
4.2 සහල් සැකසුම පිළිබඳ පුහුණු වැඩසටහන්වල ඵලදායිතාවය ඇගයීම 32
**අරමුණ 3** 36
4.3 ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා පිළිබඳ ඇගයීම 36
4.3.1 ණය ලබාදුන් ආයතනවල සබඳතාව 38
4.3.2 සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා සාර්ථක ද? 42
**අරමුණ 4** 43
4.4 සහල් සැකසුම්කරුවන්ගේ ආදායම් හා වියදම් නිමානය කිරීම 43
4.4.1 ආරම්භයේ හා වාර්තමාන කාල පරිච්ඡේද කර්මාන්තකරුවන් විසින් සකසන ලද සහල් වර්ග 43
4.4.2 සහල් සැකසුම් ගම්මාන ආරම්භ කළ පසු පවතින වී මෝල් නවීකරණය වූයේද? 44
4.4.3 සහල් සැකසුම්කරුවන්ගේ ආදායම 46
4.4.4 නිෂ්පාදන ධාරිතාවය පුළුල් වීම 49
4.4.5 සහල් අලෙවිය 50
4.4.6 සහල් ණයට ලබා දීම 53
**අරමුණ 5** 53
4.5 සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ තිරසරභාවය හා බැඳුණු සාධක ඇගයීම 53
4.5.1 මූලික ඉදිකිරීම් සහ උපකරණ සම්බන්ධ ගැටලු 54
4.5.2 යෙදවුම් සම්බන්ධ ගැටලු 55
4.5.3 සහල් සැකසීමේ දෛනික කාර්යයන් පිළිබඳ ගැටලු 57
4.5.4 නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම 58

පස් වැනි පරිච්ඡේදය

**ප්‍රතිඵල හා සාකච්ඡා** 59

**සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ සාර්ථක අසාර්ථක බව විමසුම** 59

5.1 හැඳින්වීම 59

5.2 ග්‍රාමීය මට්ටමේ උසස් තත්ත්වයේ සහල් නිපදවීම 60

5.3 ග්‍රාමීය මට්ටමේ ස්වයංරැකියා අවස්ථා බිහි කිරීම 60

5.4 කාන්තාවන් සඳහා සුදුසු ස්වයංරැකියාවක් වීම 60

5.4.1 සහල් සැකසුම් කාර්යාවලියේ වගකීම් බෙදී යාම 63

5.5 සහල් සැකසුම් ගම්මාන වැඩසටහන සහ වී අලෙවි ගැටලුව 64

5.6 වීරැකියාවට සහල් සැකසුම් ගම්මාන විසඳුමක් වේ ද? 64

5.7 සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවී ද? 67

5.8 සහල් සැකසුම් ගම්මානවල සාර්ථකත්වය විමසීම 70

5.8.1 නිර්නායක කිහිපයක් අනුව මේ පිළිබඳ සලකා බැලීම 70

5.9 කර්මාන්තකරුවන්ගේ පොදු ආකල්ප 75

5.10 සිද්ධි අධ්‍යයනය 78

සය වැනි පරිච්ඡේදය

**නිගමන සහ යෝජනා** 89

6.1 සොයාගැනීම් 89

6.2 නිගමන 93

6.3 නිර්දේශයන් 94

වගු සටහන්

2.1 වී වගාවේ නිෂ්පාදන වියදම (2009/2010 මහ, රු./කි.ග්‍රෑම්) 7

2.2 වී අලෙවිය සහ සහල් අලෙවිය 8

2.3 උසස් තාක්ෂණය භාවිතයෙන් සැකසූ සහල්වල පෝෂ්‍ය ගුණය 12

3.1 පුම්තිරිභාවය අනුව කර්මාන්තකරුවන් සහල් සැකසුමට සහභාගිත්වය 18

3.2 වයස් කාණ්ඩ අනුව සහල් සැකසුමට සහභාගිත්වය 19

3.3 කර්මාන්තකරුවන්ගේ අධ්‍යාපන මට්ටම 19

3.4 කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියාව 20

3.5 පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව නියැදි ව්‍යාප්තිය 22

3.6 කුඹුරු ඉඩම් භාවිතය 23

3.7 වගා කළ ඉඩම් ප්‍රමාණ අනුව ලබාගත් අස්වනු 23

3.8 කුටුම්භයක සාමාන්‍ය මාසික ආදායම 25

3.9 සහල් අලෙවිය සිදු කරන කුටුම්භ ආදායම 25
4.1 ගොවීන් තෝරා ගැනීම සහ සංවිධාන කටයුතු සිදුකළ ආයතන 28
4.2 සහල් සැකසුම්කරුවන් තෝරා ගැනීම 32
4.3 සහල් සැකසුම් කර්මාන්තය ආරම්භයට පෙර කර්මාන්තකරුවන් ලබා ඇති පුහුණුවීම් 33
4.4 සහල් සැකසුම් කාර්යය සඳහා ආයතනික සේවා සැපයුම 36
4.5 ණය ලබා ගැනීම් 39
4.6 සහල් සැකසුමට ණය ලබාගත් කුටුම්භ සාමාජිකත්වය 39
4.7 තවදුරටත් ණය අවශ්‍ය කරුණු 40
4.8 සැකසූ සහල් වර්ග 43
4.9 සහල් සැකසුම් ගම්මාන තුළ සාම්ප්‍රදායික වී මෝල් සහ නවීකරණය කරන ලද වී මෝල් 44
4.10 සහල් කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම් (රුපියල්/කි.ග්‍රෑම්) 47
4.11 වර්ෂයකට කර්මාන්තකරුවන් ලබන ලාභ ප්‍රතිශත 49
4.12 සහල් සැකසුම් ගම්මාන ආරම්භයේ සහ වර්තමානයේ සහල් අලෙවිය වෙනස්වීම 51
4.13 අලෙවිය සිදු කරන ආකාරය 53
4.14 සහල් සැකසුම් කර්මාන්තයේ යෙදවුම් හා උපකරණ සම්බන්ධ ඇති වූ ගැටලු 54
5.1 සහල් සැකසුම් කර්මාන්තය සිදු කරන ආකාරය 59
5.2 ප්‍රධාන ආදායම් මාර්ග හා ද්විතියික ආදායම් මාර්ග 60
5.3 කාන්තාවන්ට සුදුසු ස්වයංරැකියාවක් ද 62
5.4 වගකීම් බෙදීයාම 63
5.5 ග්‍රාමීය ව පවතින වීරැකියාවට සහල් සැකසුම් ගම්මාන විසඳුමක් වේ . 65
5.6 සහල් සැකසුමට පුහුණු කළ අය 67
5.7 සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු නියැදි ප්‍රතිචාර 68
5.8 අලෙවිය සිදු කරන කර්මාන්තකරුවන්ගේ සාර්ථක අසාර්ථකභාවය 74

ප්‍රස්ථාර සටහන්

3.1 අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියා 21
3.2 වී වගාවේ අස්වනු භාවිතය 24
3.3 සහල් සැකසුම් කර්මාන්තය කෙරෙහි කුටුම්භයන්ගේ ආදායම් ව්‍යාප්ති විෂමතාවයේ බලපෑම 26
4.1 ලබා දුන් පුහුණුවේ ඵලදායීතාවය 34
4.2 පසු අස්වනු තාක්ෂණ ආයතනය සහ සහල් සැකසුම් ගම්මාන සම්බන්ධතාවය 35
4.3 වාර්ෂික සකස් කරන සහල් ප්‍රමාණය සහ සැකසීමේ වියදම් 50
5.1 ස්වයංරැකියාවක් ලෙස කාන්තා පිරිමි නියෝජනය 61
5.2 සහල් සැකසුම් කර්මාන්තය සඳහා නියැදියේ හැසිරීම 70

රූප සටහන්

1 සහල් තැම්බීමේ උපකරණ 11
2 වී තැම්බීමේ ලිප 11
3 වී පෙඟවීම සඳහා යොදා ගන්නා ටැංකි සහ වේලීමට භාවිතා කරන කමත 12

පළමුවැනි පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මිලියන 20කට ආසන්න ජනගහනයෙන් 32%ක් පමණ සෘජුව ම කෘෂිකර්මාන්තයේ නියැළෙන අතර වී වගාවට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. වර්තමානයේ දී, වී වගාව ආශ්‍රිත අධික නිෂ්පාදන වියදම මෙන් ම ලබා ගන්නා අස්වැන්න සාධාරණ මිලකට අලෙවි කර ගත නො හැකිවීම හේතුවෙන් වී වගාව ලාභදායී ව්‍යාපාරයක් නොවන බව ගොවි ජනතාව දරන අදහස වේ. වී අස්වනු නෙලාගත් විගස අලෙවි කිරීමට සිදුවීමත්, අතරමැදියන් හා වී මොල්හිමියන් විසින් වී මිල දී ගැනීමත් හේතුවෙන් වැඩි ලාභ ප්‍රතිශතයක් හිමි කර ගන්නේ අතරමැදියන් හෝ සහල් මෝල් හිමිකරුවන් විසින් ය.

වී අස්වනු සහල් වශයෙන් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා ගොවි ජනතාව සමත් වේ නම් එමඟින් ගොවීන්ට වැඩි ලාභයක් අත් කර ගත හැකි ය. මේ සඳහා උසස් තත්ත්වයේ සහල් අඩු පිරිවැයකින් නිපදවීමේ ක්‍රමෝපායයන් හඳුන්වාදීම එක් විකල්පයකි. ඒ හැරුණු කොට පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් සහල් සැකසුම් ගම්මාන ස්ථාපිත කිරීම, සහල්වල තත්ත්වය ජාත්‍යන්තර මට්ටමට උසස් කිරීම හා සහල් මෝල් නවීකරණය ආදී ක්‍රමෝපායයන් ඉදිරිපත් කිරීම සඳහා පියවර ගෙන තිබේ.

ඉහත ක්‍රමෝපායයන් සියල්ල පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් හඳුන්වා දුන් "සහල් සැකසුම් ගම්මානය" තුළින් පිළිබිඹු වේ. වී ගොවියාගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම තුළින් ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකය නගා සිටුවීම ප්‍රධාන අරමුණ කොට මෙම සහල් සැකසුම් ගම්මාන පිහිටුවා ඇත. ඉතා අඩු ප්‍රාග්ධනයකින් ආරම්භ කළ හැකි මෙම ව්‍යාපෘතියේ අනෙකුත් විශේෂිත අරමුණු වන්නේ,

1. ග්‍රාමීය මට්ටමේ කෘෂි ස්වයංරැකියා අවස්ථා ඇති කිරීම
2. පිරිසිදු හා ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ සහල් ග්‍රාමීය මට්ටමින් නිෂ්පාදනය කිරීම
3. වෙළෙඳපොළ පවතින මිලට වඩා අඩු මිලකට පාරිභෝගිකයා වෙත උසස් තත්ත්වයේ සහල් ලබා දීම
4. උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ සහල් මෝල් වැඩි දියුණු කිරීම

අදාළ වැඩසටහන දියත් කිරීම මඟින් අපේක්ෂිත ප්‍රතිඵල පහත දක් වේ.

- වෙළෙඳපොළ වී අලෙවි කරනු වෙනුවට, එම වී සහල් බවට පත් කිරීමෙන් අගය එකතු කළ නිෂ්පාදනයන් තුළින් වී ගොවියාගේ ආදායම ඉහළ නැංවීම
- වී අලෙවියේ දී සිදුවන "මිල අඩු ය" යන ගැටලුවට යම් ප්‍රමාණයක විසඳුමක් ලබාදීම

- ගෘහනියන් වෙත ගෙදර දොර රාජකාරි සමඟ සිදු කළ හැකි ස්වයංරැකියාවක් ලෙස හඳුන්වාදීම
- විශේෂ ණය ක්‍රම හඳුන්වා දීම තුළින් ගොවියාගේ අස්වනු තෙලන ලද වීගස අලෙවි නො කොට, ගබඩා (ගබඩා කරන ලද වී ක්‍රමයෙන් සහල් බවට පත් කිරීමට) කිරීමට යොමු කරවීම

මෙම කාර්යයන් සිදු කර ගෙන යාම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් අනුග්‍රාහක දායකත්වය හා දැනුම ලබා දී ඇති අතර සහල් තැම්බීමේ උපකරණ, නවීන වී කෙටීමේ යන්ත්‍ර, ණය පහසුකම් සඳහා රජරට සංවර්ධන බැංකුවට යොමු කිරීම ආදී කාර්යයන් රාශියක් වැඩසටහන ආරම්භයේ දී සිදු කොට තිබේ. මෙම වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිලාභීන් ලෙස වී ගොවීන්, රැකියා විරහිත තරුණ තරුණියන්, සමෘද්ධිලාභීන්, ගොවි සංවිධානවල සාමාජික සාමාජිකාවන්, ග්‍රාමීය කාන්තාවන් හා මේ සඳහා උනන්දුව හා කැමැත්ත ඇති වෙනත් පුද්ගලයින් නම් කර ඇත.

දැනට මෙම ව්‍යාපෘතිය අනුරාධපුර, පොළොන්නරුව, හම්බන්තොට, මහනුවර (මිනිපේ), කුරුණෑගල, අම්පාර, බදුල්ල (මහියංගනය), පුත්තලම යන දිස්ත්‍රික්කවල ආරම්භ කොට ඇති අතර මෙම වැඩසටහනේ මූලික ඉලක්කය වන්නේ වාර්ෂිකව ගම්මාන 50ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි. 2005 වසරේ සහල් සැකසුම් ගම්මාන 14කින් ආරම්භ කළ මෙම වැඩසටහන 2011 වසර අවසාන වන විට ගම්මාන 2193ක් දක්වා ව්‍යාප්ත ව පවතී.

## 1.2 අධ්‍යයන ගැටලු

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය 2005 වසරේ ආරම්භ කොට දැනට වසර හතක කාලයක් අවසන් වී තිබේ. වර්තමානය වන විට, පළමු ආරම්භ කළ ගම්මාන කිහිපයක් අක්‍රිය තත්ත්වයේ පවතින අතර ගම්මාන රාශියක් ක්‍රියාකාරීව මෙම කාර්යයේ නියැලෙමින් සිටියි. මෙම ව්‍යාපෘතිය අරඹා ගත වූ වසර හතක කාලය තුළ ව්‍යාපෘතිය ගොවි ජනතාව වෙත හඳුන්වාදීම තුළින් අපේක්ෂිත අරමුණු කරා ළඟා වී ඇති ප්‍රමාණයත්, එම අපේක්ෂාවන් කරා ගමන් කිරීමේ දී මුහුණ දුන් ගැටළු පිළිබඳවත් දැනුවත්වීම තුළින් සුදුසු පියවර ගැනීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ අවශ්‍යතාව බවට පත් ව තිබේ.

තව ද, සහල් සැකසුම් කර්මාන්තය පිළිබඳ සැලකීමේ දී තාක්ෂණ ක්‍රමවේදය නිසි අයුරින් භාවිතා කිරීම වැදගත් සාධකයකි. සුළු වශයෙන් (Small Scale) සහල් සැකසුමේ යෙදී සිටින පිරිස් වී කෙටීම සඳහා භාවිතා කරන යන්ත්‍ර අනුව ද වෙනස්කම් දැකිය හැකි විය. සහල් සැකසුම් ගම්මාන වැඩසටහන සඳහා ලබා දුන් පුහුණුව එම කාර්යයේ සාර්ථකත්වයට පිටුවහලක් වී ඇත් ද? යන්න විමසා බැලිය යුතු තවත් වැදගත් අංගයකි.

## 1.3 ප්‍රධාන අරමුණු

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වෙයි.

### 1.3.1 විශේෂිත අරමුණු

i සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ ක්‍රියාත්මක ක්‍රමවේදය ඇගයීමකට ලක් කිරීම

ii සහල් සැකසුම පිළිබඳ පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය ඇගයීම

iii සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා පිළිබඳ ඇගයීම

iv විවිධ පරිමාණයෙන් ක්‍රියාත්මක වන සහල් සැකසුම්කරුවන්ගේ ආදයම් හා වියදම් නිමානය කිරීම

v සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ තිරසාර භාවය හා බැඳුණු සාධක විමර්ශනය කිරීම

vi කර්මාන්තකරුවන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය හා විරැකියාව කෙරෙහි මෙම ව්‍යාපෘතියේ බලපෑම ඇගයීමට ලක් කිරීම

vii සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථකව පවත්වා ගෙන යාමට අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම

## 1.4 අධ්‍යයනයේ වැදගත්කම

1. 'මහින්ද චින්තන' සංවර්ධන ක්‍රියාදමය තුළින් සහල් සැකසුම් ගම්මාන ක්‍රියාත්මක කිරීමට විශේෂ පිටුවහලක් සපයා ඇත. එහි සඳහන් වන ආකාරයට, දේශීය සහල් වෙළෙඳපොළ ප්‍රාදේශීයකරණය කිරීම සඳහා 'සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය' ක්‍රියාවට නංවමි (පිටු අංක 42). මෙම වැඩසටහන සාර්ථක කරලීමට මෙම ව්‍යාපෘතියේ ඇගයීම් ක්‍රියාවලිය වැදගත් වේ.
2. මෙම සහල් සැකසුම් ගම්මානවල තිරසරභාවය කෙරෙහි බලපාන හේතු පිළිබඳ විමසා බැලීම වැදගත් වන අතර ඒ තුළින් ඉදිරියේ දී මෙම වැඩසටහන සාර්ථකව පවත්වා ගෙන යාමට හැකි තත්ත්වයන් හදුනා ගැනීමට හැකියාව ලැබේ.

## 1.5 පර්යේෂණ ක්‍රමවේදය

### 1.5.1 තොරතුරු රැස් කිරීමට පදනම් කර ගත්තා දර්ශක

තොරතුරු රැස් කිරීමට පහත සඳහන් කරුණු පදනම් කර ගත්තා අතර මේ තුළින් 2005 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ සහල් සැකසුම් ගම්මාන පිළිබඳ ඇගයීමට ලක් කෙරේ.

- සහල් නිෂ්පාදන ගම්මාන තෝරා ගැනීම
- නිෂ්පාදන කණ්ඩායම් තේරීම
- ලබාදුන් පුහුණු
- කර්මාන්තකරුගේ වර්තමාන රැකියාව
- ගෘහයේ තොරතුරු/ශ්‍රම භාවිතය
- ඉඩම් අයිතිය /කුඹුරු ඉඩම් අයිතිය/සහල් සැකසුම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය

- සහල් නිෂ්පාදනයේ මූලික වියදම්
- වී මිලට ගැනීම
- අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම (කමත, ලිප, බැරල්, ටැංකි, සීලර්, සල්ලඩි)
- වී මෝල් (නවීන/අර්ධ නවීන/සාම්ප්‍රදායික)
- වී කෙටීම /ප්‍රවාහන වියදම්
- සහල් අලෙවිය/සහල් මිල/පාරිභෝගික අවශ්‍යතා
- සහල්වල ගුණාත්මක තත්ත්වය
- ණය ලබා ගැනීම/ගබඩාකරණය
- ආයතන විසින් ලබා දෙන සේවය

### 1.5.2 දත්ත රැස් කිරීම

අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීම ද්විතියික දත්ත හා ප්‍රාථමික දත්ත රැස් කිරීම මත පදනම් ව සිදු කරන ලදී.

#### 1.5.2.1 ප්‍රාථමික දත්ත ලබා ගැනීම

මේ සඳහා ක්‍රමෝපායයන් කිහිපයක් භාවිතා කොට ඇත.

**1. විධිමත් ප්‍රශ්නාවලියක් මඟින් තොරතුරු රැස් කිරීම**

මෙම පර්යේෂණයේ සඳහන් අරමුණුවලට අදාළව ප්‍රශ්නාවලිය සැකසුන අතර නියැදියේ එක් එක් සාමාජිකයාගෙන් අදාළ දත්ත ලබා ගෙන ඇත. මෙහි දී, එක් කුටුම්භයක් එක් නියැදි ඒකකයක් ලෙස සැලකේ.

**2. පුද්ගල සම්මුඛ සාකච්ඡා**

ප්‍රශ්නාවලි දත්තවලට අමතරව පුද්ගල සම්මුඛ සාකච්ඡා සිදු කොට ඇත. මේ මඟින් ගොවිජන ප්‍රාදේශීය නිලධාරීන්, කෘෂිකර්ම උපදේශකවරුන්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් හා ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට දත්ත ලබා ගෙන තිබේ. මෙහි දී, අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලි අත්වැලක් (Question Guide) භාවිතා කරන ලදී.

**3. සිද්ධි අධ්‍යයනය (Case Study)**

මෙහි දී, 2005 වර්ෂයේ කර්මාන්තය ආරම්භ කොට මේ දක්වා එය සාර්ථකව සිදු කර ගෙන යන කර්මාන්තකරුවන් හා කර්මාන්තය අත්හැර ඇති පුද්ගලයන් පිළිබඳව සිද්ධි අධ්‍යයනය තුළින් දත්ත ලබා ගෙන ඇත. ඒ තුළින් කර්මාන්තයේ තිරසාරභාවය පවත්වා ගෙන යාමට ඉවහල් වී ඇති කරුණු පිළිබඳව සමාලෝචනය කිරීමට හැකි විය.

4. **සමූහ ගොවි සාකච්ඡා (Focused Group Discussion)**

සහල් නිෂ්පාදන ගම්මාන තෝරා ගැනීම, කර්මාන්තකරුවන් තෝරා ගැනීම, පුහුණු ක්‍රමවේද පිළිබඳව දත්ත ලබා ගැනීමේ දී ගොවි නියෝජනය වැඩි කර ගැනීම සඳහා සමූහ ගොවි සාකච්ඡා මගින් දත්ත ලබා ගැනීම සිදු කොට තිබේ.

**1.5.2.2 ද්විතීයික දත්ත ලබා ගැනීම**

මේ සම්බන්ධ පොත්පත් සඟරා හා ලිපිවලින් අවශ්‍ය ද්විතීයික දත්ත ලබා ගෙන ඇත. විශේෂයෙන් පසුඅස්වනු තාක්ෂණ ආයතනය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා රේගු දෙපාර්තමේන්තුව යන ආයතන හා දෙපාර්තමේන්තුවලින් දත්ත ලබා ගෙන ඇත.

**නියැදිය තෝරා ගැනීම**

අධ්‍යයනය සඳහා නියැදිය තෝරා ගැනීමේ දී බහු පියවර නියැදි ක්‍රමය (Multi-Stage Random Sampling Technique) අනුගමනය කෙරිණි.

**1 වන පියවර - අධ්‍යයන ප්‍රදේශ තේරීම (දිස්ත්‍රික්ක තෝරා ගැනීම)**

මෙම සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක නවයක ක්‍රියාත්මක වන අතර අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්ක නියැදිය සඳහා අහඹු ලෙස තෝරා ගන්නා ලදී.

**2 වන පියවර: සහල් සැකසුම් ගම්මාන තෝරා ගැනීම**

තෝරාගත් දිස්ත්‍රික්කවල පවතින සියලුම සහල් නිෂ්පාදන ගම්මාන වලින් 50%ක් නියෝජනය වන ලෙස සහල් නිෂ්පාදන ගම්මාන 67ක් තෝරා ගැණුනි.

**3 වන පියවර: නියැදි ඒකක තෝරා ගැනීම**

එක් කර්මාන්තකරුවෙක් නියැදි ඒකකයක් ලෙස සලකා තෝරා ගත් ගම්මානවල කර්මාන්තකරුවන්ගෙන් 15%ක නියැදියක් තෝරා ගන්නා ලදී.

මෙහි දී, අනුරාධපුර දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 184ක් ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 81ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 95ක් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ කර්මාන්තකරුවන් 9ක් ලෙස මුළු නියැදිය 369 දෙනෙකුගෙන් යුක්ත විය.

## 1.6 දත්ත විශ්ලේෂණය

ප්‍රශ්නාවලි මාර්ගයෙන් ලබා ගත් දත්ත හා තොරතුරු පරිඝනක ගත කොට සංඛ්‍යාත්මක වගු ප්‍රස්තාර හා සංඛ්‍යාත්මක විශ්ලේෂණ මගින් සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීමට ලක් කරන ලදී.

## 1.7 පරිච්ඡේද සැකසුම

අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය තුළින් මූලික හැඳින්වීම, අධ්‍යයනයේ අරමුණු සහ ක්‍රමවේදයත් විස්තරාත්මකව ඉදිරිපත් කොට ඇති අතර දෙවන පරිච්ඡේදය මඟින් සාහිත්‍ය විමර්ශනයත් ඉදිරිපත් කෙරේ. තෙවැනි පරිච්ඡේදය මඟින් කර්මාන්තකරුවන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය හා ආදායම්/වියදම් පිළිබඳ සාකච්ඡා කර ඇත.

අධ්‍යයනයේ අරමුණු ඔස්සේ ප්‍රතිඵල සාකච්ඡාවට බඳුන් කොට ඇත්තේ සිව්වැනි පරිච්ඡේදය මඟිනි. පස්වැනි පරිච්ඡේදය මඟින් ව්‍යාපෘතියේ සාර්ථකත්වය විමසීමට භාජනය කරන ලද අතර මෙහි දී, සිද්ධි අධ්‍යයන මඟින් ඒ ඒ අවස්ථාවන් පැහැදිලි කෙරේ. හයවැනි පරිච්ඡේදය මඟින් නිගමන හා යෝජනා ඉදිරිපත් කෙරෙයි.

දෙවැනි පරිච්ඡේදය

# සාහිත්‍ය විමර්ශනය

## 2.1 හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනයට අදාළ සාහිත්‍යමය විමර්ශනය, න්‍යායාත්මක (Conceptual reviews) විශ්ලේෂණයක් සහ ආනුභවික විශ්ලේෂණයක් (Emperical review) ලෙස ඉදිරිපත් කෙරේ. න්‍යායාත්මක විශ්ලේෂණය යටතේ ශ්‍රී ලංකාවේ වී ගොවිතැන, අලෙවිය සහ එහි ලාභදායීතාවය පිළිබඳව සාකච්ඡා කෙරෙයි. ඉන්පසුව, වී අලෙවියේ පවතින ගැටලු වලට එක් විසඳුමක් ලෙස සහල් සැකසුම් ගම්මාන වැඩසටහනේ ආරම්භය සහ වර්තමාන තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කෙරේ. ආනුභවික විශ්ලේෂණය යටතේ සහල් සැකසුම් ගම්මාන වැඩසටහන් සම්බන්ධයෙන් වූ පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳව විග්‍රහ කර ඇත.

## 2.2 න්‍යායාත්මක විශ්ලේෂණය

### 2.2.1 ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය සහ අලෙවිය

2010 වසරේ ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.87ක් වූ අතර දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය 11.2%ක් විය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011). වී ගොවිතැන බහුතරයක් ග්‍රාමීය ජනතාවගේ ප්‍රධාන ආදායම් මාර්ගය වන අතර උපකාරක සේවා සපයන්නන්, වී මෝල් හිමියන් සහ වී මෙන් ම සහල් විකිණීම සිදු කරන වෙළෙඳුන්ගේ වක්‍ර ආදායම් මාර්ගයක් වී ඇත (ගමවෙලගෙදර සහ පිරිස, 2011). වී බෝගය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික බෝගයක් වන අතර වාර්ෂික වී නිෂ්පාදනයෙන් 50%කට ආසන්න ප්‍රමාණයකට දායක වන්නේ අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011). කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තිකුත් කළ දත්ත අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රධාන දිස්ත්‍රික්ක තුනක වී වගාවේ නිෂ්පාදන වියදම වගු අංක 2.1 මඟින් දැක් වේ.

**වගු අංක 2.1: වී වගාවේ නිෂ්පාදන වියදම (2009/2010 මහ, රු./අක්කර)**

| විස්තරය | අනුරාධපුරය | කුරුණෑගල | පොළොන්නරුව |
|---|---|---|---|
| ශ්‍රමය | 18,868.00 | 19,098.00 | 18,424.00 |
| යන්ත්‍ර කුලිය | 8,664.00 | 7,741.00 | 9,903.00 |
| යෙදවුම් | 7,112.00 | 6,494.00 | 6,695.00 |
| මුළු වියදම | 34,644.00 | 33,333.00 | 35,022.00 |
| සාමාන්‍ය අස්වැන්න (කි.ග්‍රෑ) | 2,221.00 | 2,050.00 | 2,437.00 |
| අලෙවි මිල (රු./කි.ග්‍රෑ.) | 29.68 | 32.33 | 28.50 |
| දළ ආදායම (රු/අක්කර) | 65,919.00 | 66,277.00 | 69,455.00 |
| ලාභය පවුලේ ශ්‍රමය රහිතව (රු/අක්කර) | 31,275.00 | 32,944.00 | 34,433.00 |
| ඒකක මිල (රු./කි.ග්‍රෑ.) | 15.60 | 16.26 | 14.37 |

මූලාශ්‍රය: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2009/2010



පුස්තකාලය
LIBRARY
හෙ.කො ගො,ප.පු.ආ
HARTI

වී වගාව සඳහා පොහොර සහනාධාරය ලබාදීම හේතුවෙන් වී වගාවේ දී අක්කරයකට යෙදිය යුතු පොහොර සඳහා වැය වන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවන අතර ඒ අනුව වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම ද අඩු වී ඇත. තව ද, නිෂ්පාදන වියදම සැලකිල්ලට ගැනීමේ දී තම පවුලේ ශ්‍රමය භාවිතයට ගැනීමෙන් නිෂ්පාදන වියදම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කර ගත හැකි ය (කුමාර එස්.කේ. සහ පිරිස, 2008). වගු අංක: 2.1 සැලකීමේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ අක්කර එකක වී වගා කිරීමෙන් පවුල් ශ්‍රමය රහිතව රුපියල් 31,275.00ක ලාභයක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ රු.32944/- ක ලාභයක් ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රු.34,433/- ක ලාභයක් ද ලැබිය හැක.

එසේ වුව ද, සමීක්ෂණ දත්ත ලබා ගත් 2012 වර්ෂයේ දී අනුරාධපුර, කුරුණෑගල හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල පැවති වී මිල පිළිවෙළින් රු.24.00ක්, රු.24.40ක් හා රු.25.20ක් දක්වා අඩු වී පැවති අතර ගොවීන්ට ඉහත ලාභ අනුපාත ලබා ගැනීමට නො හැකි වී තිබේ. කෙසේ වෙතත්, මෙම ගොවීන් තම අස්වනු සහල් සැකසුමට යෙද වූයේ නම්, අලෙවි වූ සහල් මිල ගණන් අනුව ලැබිය හැකි වූ ලාභය ඉතා ඉහළ අගයක් ගන්නා බව වගු අංක: 2.2 මගින් පැහැදිළි වේ.

වගු අංක 2.2: වී අලෙවිය සහ සහල් අලෙවිය

| විස්තරය | අනුරාධපුරය | කුරුණෑගල | පොළොන්නරුව |
|---|---|---|---|
| ලබා ඇති සාමාන්‍ය අස්වැන්න (කි.ග්‍රෑ./අක්කර) | 2,221.00 | 2,050.00 | 2,437.00 |
| ලබා ගත හැකි සහල් කිලෝ ගණන | 1,555.00 | 1,435.00 | 1,706.00 |
| සහල් අලෙවි මිල (රු/කි.ග්‍රෑ.) | 50.00 | 49.00 | 51.00 |
| සහල් අලෙවි ආදායම (රු./අක්කර) | 77,750.00 | 70,315.00 | 87,006.00 |
| සහල් සැකසුමේ වියදම (රු./අක්කර) | 12437.60 | 14760.00 | 12428.70 |
| සහල් අලෙවියෙන් ලාභය (රු./අක්කර) | 65,312.40 | 55,555.00 | 74,577.30 |
| වී අලෙවියෙන් ලාභය (රු./අක්කර) | 31,275.00 | 32,944.00 | 34,433.00 |
| සහල් අලෙවි ලාභ වෙනස (රු./අක්කර) | 28307.40 | 22611.00 | 40144.00 |

මූලාශ්‍රය: කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2009/2010

මේ අනුව, පැහැදිළි වන්නේ අක්කර එකක් වගා කොට ලැබෙන අස්වැන්න සහල් බවට පත් කර සහල් අලෙවිය තුළින් වී අලෙවියට වඩා ඉහළ ආදායමක් ලබාගත හැකි බවයි. මෙම තත්ත්ව යටතේ ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙස ග්‍රාමීය මට්ටමෙන් වී වලට අගය එකතු කිරීමක් සිදු කිරීම ප්‍රමුඛ වැදගත්කමක් ඇති කාර්යයක් වෙයි (ගමවෙලගෙදර සහ පිරිස, 2011).

### 2.2.2 වී අලෙවිය

වී සඳහා නිසියාකාර අලෙවි ප්‍රවාහයක් නොමැති වීමේ ප්‍රතිඵල ලෙස දැකිය හැකි ඉහළ නිෂ්පාදන වියදම සහ අඩු ආදයම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු දෙක වෙයි. රජය මඟින් නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සඳහා කුමන ක්‍රියාමාර්ග අනුගමනය කළ ද, තමන්ගේ නිෂ්පාදනවලට සාධාරණ මිලක් නො ලබන බහුතරයක් ගොවීන් මුහුණ දෙන උග්‍ර ගැටලුවක් බවට පත්ව ඇත්තේ වී අලෙවි යයි. වී අලෙවිකරණ ප්‍රවාහය ආරම්භ වන්නේ ගොවිපලේ දී වී එකතු කරන පුද්ගලයන් විසින් වී මිල දී ගැනීමෙනි. ඉන්පසු, ඒවා මෝල්වල දී සකස් කර අවසානයේ දී තොග වෙළඳුන් සහ සිල්ලර වෙළඳුන් විසින් පාරිභෝගිකයන් වෙත අලෙවි කරනු ලැබේ. ගොවියා සහ පාරිභෝගිකයා අතර අතරමැදියෙකු ලෙස ක්‍රියා කරන මහා පරිමාණ මෝල් හිමියන් වී අලෙවි කර්මාන්තයේ ප්‍රධාන තීරකයෙකු ලෙස ක්‍රියා කරයි (කුමාර එස්.කේ සහ පිරිස, 2008).

වී අලෙවි මණ්ඩලය 1986 දී සිදු කරන ලද සමීක්ෂණයට අනුව 7000කට වැඩි වී මෝල් සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ පවතින අතර ඒවා ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය සතු වේ. වෙළෙඳපොළ සම්බන්ධතාවය පරීක්ෂා කිරීමේ දී පෙනී යන්නේ ගොවිපළ සහ තොග වෙළඳපොළ සම්බන්ධතාවය අඩු අතර තොග මෙන් ම සිල්ලර වෙළඳපොළ ඉහළ වෙළෙඳපොළ සම්බන්ධතාවයක් පෙන්නුම් කරන බවයි. තොග මිලෙ හි සිදු වන වෙනස්කම් ගොවිපළ මිල දක්වා සම්ප්‍රේෂණය වන්නේ දුර්වල ලෙසයි. එබැවින්, තොග මිලෙ හි වැඩි වීමක් සිදු වුව ද ගොවිපළ මිල අඩු අගයකම පවතී (රෆීක් එම්.අයි.එම්. සහ පිරිස 2008). වී අලෙවියේ පවතින ගැටලු අවම කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි එක් උපක්‍රමයක් වන්නේ නිෂ්පාදන අලෙවි කිරීමට වඩා වී වලට අගය එකතු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමයි. මෙම බොහොමයක් ගැටලු ආමන්ත්‍රණය කරන නව ක්‍රමවේදයක් වන්නේ කලාපීය සහල් වෙළෙඳපොළවල් ඇති කිරීමේ නව සංවර්ධන උපාය මාර්ගයයි. මෙම උපාය මාර්ගය ක්‍රියාත්මක කරනු ලැබුවේ ගෘහස්ථ මට්ටමෙන් ගුණාත්මක සහල් සකසා සහල් සැකසුම් ගම්මාන වැඩසටහන යටතේ අලෙවි කිරීමටයි (කුමාර එස්.කේ. සහ පිරිස, 2008).

### 2.2.3 සහල් සැකසුම් ගම්මාන වැඩසටහන

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පසු අස්වනු තාක්ෂණ ආයතනය 2000 වර්ෂයේ ජූනි මස 19 වන දින සංස්ථාපිත කර ඇත. පර්යේෂණ, පුහුණු කිරීම, ව්‍යාප්ති සේවා හා අනෙකුත් සංවර්ධන කාර්යයන් තුළින් වී, සහල් ඇතුළු අනෙකුත් බෝගවල පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීමෙ හි නිරත ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වශයෙන් පසු අස්වනු තාක්ෂණ ආයතනය සැල කේ (පසු අස්වනු තාක්ෂණ ආයතනය.2006). මෙම ආයතනය විසින් සංවර්ධනය කරන ලද පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේදයන් දිවයින පුරා ප්‍රචලිත කිරීමේ අරමුණින් සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය හඳුන්වා දී තිබේ. මේ තුළින් ආයතනයේ ප්‍රධාන අරමුණු දෙකක් ඉටුකර ගැනීමට උත්සාහ දරා ඇත.

එනම්,

1. කෘෂිකාර්මික ද්‍රව්‍යයන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කිරීමේ අරමුණින් අඩු ශ්‍රමයකින් කළ හැකි, වැඩි දියුණු කළ පසු අස්වනු තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.

2. ග්‍රාමීය ගොවි ජනතාවගේ ආදායම මෙන් ම රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ කෘෂිකර්මය මත පදනම් වූ සාධනීය කර්මාන්ත සංවර්ධන කිරීම සහ ඒවා ගම් මට්ටමෙන් යොමු කිරීම තුළින් ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.


සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය හඳුන්වාදීම තුළින් වී වෙනුවට, උසස් තත්ත්වයේ සහල් වෙළෙඳපොළට නිකුත් කිරීම පිණිස ගොවීන් යොමු කොට ඇත. ගුණාත්මක සහල් නිෂ්පාදනය සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් භාවිතා කර ඒ තුළින් ගොවීන්ගේ අතිරේක ආදායම් මාර්ග වැඩි දියුණු කිරීමට උත්සාහ දරා තිබේ.

පසු අස්වනු තාක්ෂණ ආයතනය මෙම සහල් සැකසුම් තාක්ෂණ ක්‍රමවේදය ගම්මාන තුළට හඳුන්වා දී ඇත්තේ පැවති ක්‍රමයේ පවතින අඩු පාඩු මකා උසස් ගුණත්වයෙන් යුත් සහල් පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ය. ග්‍රාමීය මට්ටමේ දී සහල් තැම්බීමේ ක්‍රමය වන්නේ ජලය සහිත මුට්ටියකට වී දමා තම්බා වියලා කොටා ගැනීම ය. මෙම ක්‍රමයේ දී භාජනයේ උඩ කොටසේ ඇති වී, නිසි පරිදි තැම්බෙන විට යට කොටසේ ඇති වී අවශ්‍ය පමණට වඩා තැම්බීම සිදු වේ. එමඟින් සහල් ඇටයේ ඇති පෝෂ්‍ය පදාර්ථ ජලයට මුසු වේ. එමෙන් ම, උඩ කොටසේ හොඳින් තැම්බීමට ලක් නොවුන වී කෙටීමේ දී සුණු සහල් බවට පත් වේ. මේ හේතුව නිසා එදිනෙද පරිභෝජනයට ගන්නා සහල් ප්‍රමාණය හොඳින් සකසා ගැනීම හා උසස් තත්ත්වයේ සහල් නිපදවා ගැනීම සඳහා පසු අස්වනු තාක්ෂණය ආයතනය මඟින් මෙම නවීන ක්‍රමය හඳුන්වා දී තිබේ.

**කුඩා පරිමාණ වී තැම්බීමේ තාක්ෂණ ක්‍රමය**


මෙහි දී, වී තැම්බීම සඳහා බැරල් භාගයකින් සාදා ගන්නා ලද තැම්බීමේ භාජනයක් උපයෝගී කර ගනු ඇත (රූපය 1). මෙම බැරලය ඇතුළත වී රැඳවීම සඳහා යොදා ගන්නා දැල ද රූපයේ පසෙකින් දක්වා තිබේ. මෙම දැල උඩට සෝදන ලද වී දැමීම තුළින් තම්බා ගැනීම සිදු කෙරෙයි.

රූප සටහන් අංක 1: සහල් තැම්බීමේ උපකරණය



වී තැම්බීම සඳහා තුනෙත් දෙකක ප්‍රමාණයක් වැසුන ලිපක් සාද ගත යුතු ය. මේ තුළින් දර භාවිතය අවම කෙරේ. මේ ලිප සාද ගැනීමට මැටි මිශ්‍රනයක් සාද ගත යුතු අතර එමඟින් ලිප තුළ උෂ්ණත්වය රඳ පවතී. එම ලිපෙහි රූප සටහන අංක 2 මඟින් දක්වා ඇත.

රූප සටහන් අංක 2: වී තැම්බීමේ ලිප




තැම්බීමට අවශ්‍ය වී හොඳින් පිරිසිදු කර ගත යුතු ය. වී පෙඟවීම සඳහා යොද ගන්නා ටැංකි සහ වේලීමට භාවිතා කරන කමත රූප සටහන් අංක 3 මඟින් දක්වා ඇත. වී පෙඟවීමට රූපයේ සඳහන් ටැංකි දෙකක් තිබීම තුළින් සිදු වන්නේ එක් ටැංකියකින් සෝද අනෙක් ටැංකියට දැමීම ය. වී පෙඟවීම සඳහා ටැංකි නොමැති ගොවී හු මේ සඳහා ප්ලාස්ටික් භාජන හෝ මුට්ටි වැනි උපකරණ විකල්ප ලෙස භාවිතා කරති.

වී පෙඟවීමේ දී ජලය මත පාවෙන බොල් වී ඉවත් කළ යුතු අතර පෙඟවීම සඳහා නියමිත කාලය තුළ පැය 12කට වරක් ජලය ඉවත් කරමින් පිරිසිදු ජලය පිරවිය යුතු ය. මෙහි දී, කෙටි වී පැය 18-24ක කාලයක් ද, දිගු වී පැය 36-48ක කාලයක් ද පෙඟවිය යුතු ය. පළමුව සඳහන් කළ

අන්දමට පෙඟවීම හා තැම්බීම අවස්ථා දෙකක දී සිදුවන බැවින් පොත්ත විවරවීම මගින් ජලයට පෝෂ්‍ය පදාර්ථ දියවීම වැලකෙන අතර තැම්බීම වැඩිවන අවස්ථාවල දී සහල් ඇටයේ කහ පැහැය ඉහළ යාම වැලකේ.

**රූප සටහන් අංක 3: වී පෙඟවීම සඳහා යොදා ගන්නා ටැංකි සහ වේලීමට භාවිතා කරන කමත**



තැම්බීමේ දී භාජනය ලිප මත තබා අඟල් 1.5-3.0ක් අතර උසකට ජලය පුරවනු ලැබේ. ඉහත සඳහන් කරන ලද දැල එකී උස මට්ටමේ රඳවනු ලැබේ. ජලය නටන විට පොඟවා ගත් වී, ජලය බේරා දැල මතට දමා, තෙත ගෝනියකින් භාජනය වසනු ලැබේ. වී තැම්බීමේ දී උඩ තට්ටුවේ වී ඉරි තැලෙන තුරු තැම්බිය යුතු අතර මෙලෙස තම්බන ලද වීවල තෙතමනය 30-35%ක් අතර පවතී. තම්බා ගත් වී බිමට බාගෙන කමතේ වේලනු ලැබේ. මුලින් ම, තෙතමනය අඩුවන තෙක් අතින් කළවම් කොට හොඳින් වියලා පදම්වීමට ගොඩ ගසනු ලැබේ. හිරු එළිය යටතේ මද පවනේ හෝ ගෘහාශ්‍රිතව වී වියැළීම සිදු කරනු ලැබේ.

තෙතමනය 14% දක්වා වියළීම තුළින් වී හොඳින් කල් තබා ගත හැකි වේ. මෙසේ ප්‍රමාණවත් වේලාවක් ගොඩ ගසා තැබූ පසු නැවත අතුරා, කටින් හැපීමේ දී "කටස්" ශබ්දයක් එනතුරු වියළා ගත යුතු ය. කිසිවිටක රත් වූ වී ගොඩ ගසා නො තැබිය යුතු බව පසු අස්වනු තාක්ෂණ ආයතනයේ උපදෙස වේ. මෙසේ සකසා ගන්නා සහල්වල පවතින පෝෂ්‍ය ගුණය වගු අංක 2.3 මගින් දක්වා තිබේ.

**වගු අංක 2.3: උසස් තාක්ෂණය භාවිතයෙන් සැකසූ සහල්වල පෝෂ්‍ය ගුණය**

| පෝෂ්‍ය පදාර්ථ වර්ග | පෝෂ්‍ය පදාර්ථ ප්‍රමාණය | |
|---|---|---|
| | කැකුළු සහල් | තැම්බූ සහල් |
| තයමින් (මිලි ග්‍රෑම් 100 ග්‍රෑම් ) | 0.12 | 0.23 |
| රයිබෝෆ්ලේවින් (මිලිග්‍රෑම් 100 ක ග්‍රෑම්) | 0.03 | 0.05 |
| නයසින් (මිලිග්‍රෑම් 100ක ග්‍රෑම්) | 1.90 | 5.10 |

මූලාශ්‍රය: පසු අස්වනු තාක්ෂණ ආයතනය, 2012

ඉහත සටහනට අනුව පාහින ලද කැකුළු සහල්වල අඩංගු පෝෂ්‍ය පදර්ථ ප්‍රමාණය මෙන් දෙගුණයක් පාහින ලද තැම්බූ සහල්වල අඩංගු වේ.

සාමාන්‍යයෙන් නාගරික ප්‍රදේශවල ස්ථාපනය කරන ලද වී මෝල්වල වී සැකසීම සිදු කරන අතර ගොවියා තම වී සෘජුව අලෙවි කරනු ලබයි. ග්‍රාමීය ගොවි ජනතාව විසින් ම සහල් සකසා වෙළෙඳපොළට නිකුත් කරන්නේ නම් ඉහළ මිලකට අලෙවි කිරීමටත්, එමගින් තම ආදායම සැලකිය යුතු ලෙස වැඩි කර ගැනීමට ද හැකි වෙයි. ඊට අමතරව, ග්‍රාමීය ගොවි අංශයේ රැකියා අවස්ථා ද ජනනය වේ. ග්‍රාමීය සහල් සැකසුම ආරම්භ කිරීමේ වැදගත්කම හඳුනා ගැනීමෙන් පසුව, පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් ලංකාවේ ප්‍රධාන වී නිපදවන දිස්ත්‍රික්ක තුළ සහල් සැකසුම් ගම්මාන පිහිටුවීම සඳහා නියමු වැඩසටහනක් ආරම්භ කරන ලදී (පසු අස්වනු තාක්ෂණ ආයතනය, 2005).

සහල් සැකසුම් ගම්මාන වැඩසටහන මගින් ගොවිපළ මට්ටමෙන් ගොවීන්ගේ ආදායම වැඩි කිරීම, ග්‍රාමීය මට්ටමෙන් රැකියා අවස්ථා ඇති කිරීම සහ පාරිභෝගිකයාට ඉහළ ගුණාත්මයකින් යුතු සහල් ලබා දීම මෙමගින් අපේක්ෂා කෙරිණි (කුමාර එස්.කේ. සහ පිරිස, 2008).

2005 වසරේ දී, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකෙහි මෙවැනි ගම්මාන 14ක් ආරම්භ කළ අතර එම ගම්මානවල සහල් සැකසුමේ නියුතු ගොවි පවුල් 10 සිට 20 දක්වා සංඛ්‍යාවකින් යුක්ත වේ. මෙම සහල් සැකසුම් ගම්මානවල සාමාජිකයින් ප්‍රදේශයේ සංවර්ධන බැංකු වලින් ලබා දෙන ලද සහනදායී ණය පහසුකම් මගින් සහල් තැම්බීමේ සහ කෙටීමේ පහසුකම් ලබා ගත්තා ලදී. එක් පවුලක සහල් තැම්බීමේ ධාරිතාවය දිනකට කිලෝග්‍රෑම් 150-200 ක් පමණ වෙයි. දැනට පසු අස්වනු තාක්ෂණ ආයතනයේ අධීක්ෂණය යටතේ සහල් සැකසුම් ගම්මානවල සාමාජිකයන් ඉහළ ගුණාත්මයෙන් යුත් සහල් නිපදවන අතර ඒවා ග්‍රාමීය වෙළෙඳපොළේ මෙන් ම නාගරික වෙළඳපොළෙ හි අලෙවි කරනු ලබයි. වී වෙනුවට සහල් විකිණීම මගින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ එක් පවුලක් මසකට ආසන්න වශයෙන් රු.6,500 ක ශුද්ධ ආදායමක් ලබා ගනියි (පසු අස්වනු තාක්ෂණ ආයතනය, 2005).

පසු අස්වනු තාක්ෂණ ආයතනයේ 2009 වසරේ වාර්ෂික වාර්තාවට අනුව අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, කුරුණෑගල, මහනුවර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල පවුල් 1090ක් සහල් සැකසීම ආරම්භ කරන ලද අතර එක් පවුලක් මසකට රු.15000–30000ක සැලකිය යුතු ශුද්ධ ආදායමක් ලබා ගෙන ඇත. 2011 වසරේ දී, සහල් සැකසුම් ගම්මාන 24ක් ස්ථාපිත කරන ලද අතර එම පවුල් වල සාමාජිකයින් 275කට පුහුණුව ලබා දී තිබේ.

24258



පුස්තකාලය
LIBRARY
හෙ.කො ගො,ප.පු.ආ
HARTI

## 2.3 ආනුභාවික විශ්ලේෂණය

### 2.3.1 සහල් සැකසුම් ගම්මාන වැඩසටහන සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්

වර්ෂ 2009 දී, පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් "අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ගෘහස්ථ කර්මාන්තයක් ලෙස සහල් සැකසීම සිදු කිරීමේ වර්තමාන සහ අනාගත තත්ත්වය" (Present status and future prospects of the rice processing as a cottage industry in Anuradhapura district) යන මැයෙන් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයට අනුව, එම කාලසීමාවේ දී වී මිල, සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ආරම්භයේ පැවති මිල මෙන් 400%කින් වැඩි වී තිබේ. සහල් සැකසුම් ගම්මාන වැඩසටහනේ ක්‍රියාකාරිත්වය (Performance) තක්සේරු කිරීමට මෙම අධ්‍යයනය මඟින් උත්සාහ දරා ඇත. මෙම අධ්‍යයනයට අනුව වී වෙනුවට සහල් විකිණීම මඟින් ගොවීන් මසකට රු.10,100.56ක අමතර ලාභයක් උපයා ගෙන ඇත. සහල් සැකසීම සඳහා සතියකට මිල දී ගන්නා සාමාන්‍ය වී ප්‍රමාණය කිලෝග්‍රෑම් 320කි. ව්‍යාපාරයේ සාමාන්‍ය වර්ධන වේගය 172% කි. ගොවීන් විසින් මුහුණපාන පොදු ගැටලු වන්නේ වී හිඟ වීම සහ ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීමයි. නියැදියට අයත් වූ සියළු දෙනාම වැඩසටහන සහ ලබන ලාභය පිළිබඳව සම්පූර්ණයෙන් තෘප්තිමත් ය. එනිසා, මෙම වැඩසටහන ඉහළ මට්ටමක ආර්ථික ස්ථායීතාවයක් සහිත වන අතර ග්‍රාමීය දරිද්‍රතාවයට පිළියමක් ලෙස ග්‍රාමීය සමාජයට හඳුන්වා දිය හැකි ය. එසේ ම, මෙම වැඩසටහනේ බලපෑම (impact) ඉහළ නැංවීම සඳහා ගබඩා පහසුකම් සහ මූල්‍යමය උපකාර සැපයීම සඳහා රජයේ මැදිහත්වීම අවශ්‍ය බව නිගමනය කර ඇත (පසු අස්වනු තාක්ෂණ ආයතනය, 2005).

මෙම අධ්‍යයනය පාදක කොට ගනිමින් ගමවෙලගෙදර සහ පිරිස (2011) ට අනුව ප්‍රතිචාර දක් වූ පිරිසෙන් 74%ක් කාන්තාවන් වූ අතර ඔවුන්ගේ ප්‍රධාන රැකියාව වී ගොවිතැනයි. ණය පහසුකම් සහ ගබඩා පහසුකම් නොමැතිකම කර්මාන්තකරුවන් මුහුණ දෙන පොදු ගැටලු වේ. ගුණාත්මක සහල් සැකසුම ශ්‍රම සූක්ෂම කර්මාන්තයක් වන අතර ඒ සඳහා පවුලේ ශ්‍රමය භාවිත කළ හැකි ය. අවුරුද්දක කාලයක් තුළ දී එක් පවුලක් විසින් සකසන ලද සාමාන්‍ය සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් 14,496ක් වන අතර සාමාන්‍ය ශ්‍රම භාවිතය මිනිස් දින 46ක් වේ. වසරක ශ්‍රම වියදම රු.28,812කි. මෙහි දී, භාවිතා කරනු ලබන නව තාක්ෂණය මඟින් පාරිභෝගිකයා සහ සැකසුම්කරුවා යන දෙපිරිසටම වාසිදයක වන ලෙස ඉහළ ගුණාත්මයෙන් යුතු සහල් අඩු වියදමකින් නිෂ්පාදනය කිරීමේ හැකියාව පවතී. එම අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව මෙම තාක්ෂණය රටේ අනෙක් ප්‍රදේශවලට ද, විශේෂයෙන් පශ්චාත් යුධ ප්‍රදේශ වන උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වලට ව්‍යාප්ත කළ යුතු බවට නිර්දේශ කොට ඇත. වී නිපදවන ප්‍රදේශවීමත්, නියමිත වේලාවට සාධාරණ පොලී අනුපාත යටතේ ණය ලබා දීමට පියවර ගැනීමත්, මෙම කුඩා පරිමාණ ව්‍යවසායකයන්ට වසර පුරාම ස්ථාවර මිලක් යටතේ වී මිල දී ගැනීමට හැකි වන ආකාරයේ වැඩසටහනක් ස්ථාපිත කිරීමට රජය මැදිහත් වීමත් අවශ්‍ය බව යෝජනා කොට තිබේ. මෙම වැඩසටහන පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමට ප්‍රබල දැනුවත් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම, සහල් සඳහා ප්‍රාදේශීය වෙළෙඳපොළ ඇති කර නිෂ්පාදකයන් කාගීල්ස්, කීල්ස් වැනි

මහා පරිමාණ ගැනුම්කරුවන් සමඟ සම්බන්ධ කිරීම, දිවයින පුරා විසිරී සිටින සහල් සැකසුම්කරුවන් එක් කරන ජාතික මට්ටමේ සංවිධානයක් ස්ථාපිත කිරීම මඟින් නිෂ්පාදකයින්ගේ කේවල් කිරීමේ සහ වෙළෙඳපොළ බලය වැඩි කිරීම අනෙකුත් නිර්දේශ අතර වේ. මෙවැනි රාජ්‍ය අනුග්‍රහය සහිත සංවිධානයක් මඟින් කුඩා පරිමාණ නිෂ්පාදකයින්ට ව්‍යාපාරයේ සිටින දැවැන්තයන් සමඟ තරඟ කිරීමේ හැකියාව ලැබේ.

වර්ෂ 2008 දී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ශ්‍යාමිනී කුසුම් කුමාර ඇතුළු පිරිස විසින් ගෘහාශ්‍රිත මට්ටමෙන් සහල් සැකසුමෙ හි ස්වශක්‍යතාවය (Viability of Rice Processing at Household Level) යන මැයෙන් අධ්‍යයනයක් සිදු කොට ඇත. මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ සහල් සැකසුම් ගම්මාන සංකල්පය යටතේ අරඹන ලද නියමු ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීම ඉලක්ක කොට ගෙන ය. එමඟින් ගොවීන් මුහුණ දෙන ගැටලු සහ බාධක හඳුනා ගැනීම මඟින් මෙම සංකල්පයේ පැවැත්ම සහ සහල් සැකසුමට විභවයක් පවතින ප්‍රදේශවලට එහි ප්‍රධාන තාක්ෂණික මැදිහත්වීම් සමඟින් ව්‍යාප්ත කිරීමේ හැකියාව පෙන්වා දී ඇත. මෙම අධ්‍යයනය මඟින් සහල් සැකසුම් ගම්මාන සංකල්පය සාම්ප්‍රදායික සහල් සැකසුමේ පවතින අඩු ලුහුඩුකම් මඟ හරවා, ඉහළ ගුණත්වයෙන් යුතු සහල් සැකසීමේ ක්‍රමයක් ලෙස හඳුනා ගෙන ඇති අතර ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය හා අලෙවිය යන අංශවල පවතින ගැටලු ගණනාවකට වක්‍ර ආකාරයෙන් විසඳුම් ලබා දෙන උචිත ක්‍රමවේදයක් බව සඳහන් කොට තිබේ.

කර්මාන්තයේ ලාභය තීරණය කරන ප්‍රධාන සාධකය වන්නේ නිතර වෙනස් වන වී මිල වන අතර ක්‍රියාවලිය පුරා භාවිතා කරන පවුලේ ශ්‍රමය එය වඩාත් තීව්‍ර කොට ඇත. තමාගේම වී භාවිතය මෙයට විසඳුම වන අතර අස්වනු නෙලන කාලයට අඩු මිල ගණන් යටතේ වී ගබඩා කිරීම මෙයට සුදුසු විකල්පයක් වේ. තව ද, මූල්‍ය පහසුකම් හා ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම ඊට එරෙහි වූවකි. ගුණාත්මක තත්ත්වයේ සහල් නිපදවීමට ගල් වැලි ඉවත් කරන වී මෝල් ප්‍රමාණවත් නොවීම අලෙවියේ දී බාධා සිදු කොට ඇත.

### 2.3.2 අන්තර්ජාතික මට්ටමේ සහල් සැකසුම් ගම්මාන

වර්ෂ 2012 තුළ ධාන්‍ය සැකසුම් ගම්මාන (Village Type Rice Processing Centers) 63ක් ස්ථාපිත කිරීමට පිලිපීනයේ මැනිලා නුවර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පසු අස්වනු සංවර්ධන සහ යාන්ත්‍රිකරණ මධ්‍යස්ථානය (The Philippine Center for Post Harvest Development and Mechanization) කටයුතු කර ඇත. වර්ෂ 2013 දී සහල් වලින් ස්වයංපෝෂිත වීම එරට අරමුණ වන අතර ඒ සඳහා සහල් වල පසු අස්වනු හානිය සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට පියවර ගැනීම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මූලික වී ඇත. මෙමඟින් ගොවීන්ට ඔවුන්ගේ වී අස්වැන්න නියමිත වෙලාවට කොටා ගබඩා කර ගැනීම මඟින් 15%-20%ක් පමණ වන පසු අස්වනු හානිය වළකා ගත හැකි අතර අමතරව වී සහල් බවට පත් වීමේ අනුපාතය (grain recovery) වැඩි කිරීමට දැනට පවතින වී මෝල් වල ඇති පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කෙරේ.

වියළීමේ සහ ගබඩා කිරීමේ පහසුකම් ලබා දීමට සුදුසු ආකාරයෙන් මැදිහත් වීම මඟින් දනට 15% කට වඩා වැඩි පසු අස්වනු හානිය 5%-10% දක්වා අඩු කළ හැකි වනු ඇත. මෙම සෑම මධ්‍යස්ථානයකටම වී මෝලක් සහ ධාන්‍ය වියළනයක් ලබා දෙන අතර තාපය නිපදවීමට ඉන්ධන වශයෙන් දහයියා භාවිතා කළ හැකි ය. තව ද, ගොවීන්ට තම සහල් ඉහළ මිලකට විකිණිය හැකි වීමට සෑම මධ්‍යස්ථානයකම ගබඩා පහසුකම් ස්ථාපිත කෙරේ. මෙම මධ්‍යස්ථාන දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට නම්, ඒවා පවත්වා ගෙන යාමට සුදුසුකම් ඇති ගොවි සංවිධාන සහ වාරි සංවිධාන වලට පැවරිය යුතු ය.

ඉහත සාහිත්‍ය විමර්ශනය තුළින් වඩාත් පැහැදිළි වන්නේ සහල් සැකසුම් ගම්මානවල පවතින වැදගත්කමයි. මෙම ඇගයීමේ අධ්‍යයනය තුළින් ද, මෙම කරුණු තවදුරටත් සනාථ වන අතර මෙම කාර්යය රට තුළ ප්‍රචලිත කිරීමේ වැදගත්කම තවදුරටත් තහවුරු වේ.

3 වැනි පරිච්ඡේදය

# කර්මාන්තකරුවන්ගේ සමාජ - ආර්ථික තත්ත්වය

## 3.1 හැඳින්වීම

2005 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් වෙළෙඳපොළෙ හි පවතින ගුණාත්මක බවින් පහළ (හොඳින් වියළී නැති, දුගඳ හමන, වී වර්ග කළවම් වී ඇති, අවපැහැ ගැන්වුනු) සහල් වෙනුවට උසස් තත්ත්වයෙන් යුත්, ගල් වැලි රහිත ගුණාත්මක බවින් වැඩි සහල් නිෂ්පාදනය කළ හැකි ක්‍රමවේදයක් මෙරට කෘෂි ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී. ගුණාත්මක බවින් උසස් සහල් අලෙවිය, ගොවීන්ට තම වී අස්වැන්නට ඉහළ ආදායමක් පහසුවෙන් ලබා ගත හැකි එක් ක්‍රමයක් වන අතර මෙය ස්වයංරැකියාවක් ලෙස නිරතවීමට හැකි වීම මෙම තාක්ෂණය භාවිතයේ තවත් අමතර වාසියක් විය.

මේ ආකාරයෙන් වාසිසහගත ලෙස සහල් නිෂ්පාදනය කළ හැකි වීම ප්‍රයෝජනයට ගනිමින් සහල් සැකසුම් ගම්මාන ඇති කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කෙරිණ. මෙහි දී, ප්‍රධාන වශයෙන්ම නිවෙස්වල සිටින කාන්තාවන් තම පවුලේ ආර්ථිකයට දායක කරවීමත්, ඔවුන්ට ස්වයංරැකියාවක් කිරීම සඳහා අවස්ථාව සලසා දීමත්, ගොවීන් මුහුණ දී ඇති වී අලෙවි කිරීමේ ගැටලුවලට විසඳුම් ලබා දීමත් අපේක්ෂා කෙරිණි. කිසියම් පවුලක ජීවන තත්ත්වය නගා සිටුවීම කෙරෙහි ජීවනෝපාය මාර්ගවලින් ලැබෙන ආර්ථික දායකත්වය තීරණාත්මක සාධකයකි. මෙරට බහුතරයක් වූ ගොවි පවුල්වල ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ඇත්තේ ගොවිපළ ආදායමයි. පොදුවේ සලකන විට ගොවිතැන සශ්‍රීක ගෘහස්ථ ආර්ථිකයකට මග පෙන්වන ජීවනෝපායයක් ලෙස වර්තමානය පිළි නො ගනී. එයට හේතුව වන්නේ දිනෙන් දින ඉහළ යන නිෂ්පාදන වියදම හා අවදානම් තත්ත්ව ඔස්සේ නිෂ්පාදන වියදමට සරිලන ආදායමක් උපයා දීමට ගොවිතැන සමත් නොවීමයි. මෙම කරුණු ඒ ආකාරයෙන් සිදු වේ ද? යන්න සහ එහි යථාර්තය පිළිබඳ පර්යේෂණාත්මක විමසා බැලීම කාලීනව වැදගත් වේ. පළමුව, මෙම අධ්‍යයනය සඳහා යොමු වූ කුටුම්භයන්ගේ මූලික ලක්ෂණ පිළිබඳව හඳුනා ගැනීම වැදගත් වේ.

### 3.1.1 අධ්‍යයන ප්‍රදේශය

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක නවයක ක්‍රියාත්මක වන අතර අධ්‍යයනයේ අධ්‍යයන ප්‍රදේශ ලෙස අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කයන් තියැදිය සඳහා අහඹු ලෙස තෝරා ගන්නා ලදී. එම දිස්ත්‍රික්ක පාදක කර ගනිමින් අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කෙරිණි. මෙහි දී, එම දිස්ත්‍රික්කවල සහල් සැකසුම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනයේ පුහුණුව ලැබූ කර්මාන්තකරුවන් 369ක් අළලා දත්ත ලබාගත් අතර අලෙවිය සහ පාරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කරන කර්මාන්තකරුවන් 172 දෙනෙකු ද, පාරිභෝජනයට සහල් සැකසුම සිදු කරන සැකසුම්කරුවන් 151 දෙනෙක් ද, සහල් සැකසුමේ නො යෙදෙන සැකසුම්කරුවන් 46 දෙනෙකු ද හඳුනා ගැනීමට හැකි විය. එම දත්ත හා තොරතුරු ආශ්‍රයෙන් සහල් සැකසුමේ නියුතු කර්මාන්තකරුවන්ගේ සමාජ-ආර්ථික තොරතුරු සහ යෙදවුම් භාවිතයේ දී ඇති වන ගැටලු සහ නිෂ්පාදන වියදම පිළිබඳ මෙම පරිච්ඡේදය මගින් සාකච්ඡා කොට ඇත.

## 3.2 නියැදියේ සමාජ-ආර්ථික තොරතුරු

සමස්ථ නියැදියේ කර්මාන්තකරුවන් පිළිබඳ සැලකීමේ දී 82%ක් කාන්තාවන් වූ අතර 18%ක් පිරිමි පක්ෂය විය. දිස්ත්‍රික්ක අනුව සැලකීමේ දී කාන්තා සහභාගීත්වය අනුරාධපුරය 81%ක්, පොළොන්නරුව 75%ක්, කුරුණෑගල 91%ක් හා පුත්තලම 67%ක් ලෙස විය (වගු අංක 3.1). වැඩි කාන්තා සහභාගීත්වයක් තුළින් කාන්තාවන්ට වඩාත් සුදුසු කර්මාන්තයක් බව හඳුනා ගැනීමට හැකි විය.

**වගු අංක 3.1: පුම්තිරිභාවය අනුව කර්මාන්තකරුවන් සහල් සැකසුමට සහභාගීත්වය**

| ස්ත්‍රී/පුරුෂ භාවය | අනුරාධපුර | ප්‍රතිශතය | පොළොන්නරුව | ප්‍රතිශතය | කුරුණෑගල | ප්‍රතිශතය | පුත්තලම | ප්‍රතිශතය | මුළු සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාන්තා | 149 | 80.9 | 61 | 75.3 | 86 | 90.5 | 6 | 66.7 | 302 | 81.8 |
| පිරිමි | 35 | 19.1 | 20 | 24.7 | 9 | 9.5 | 3 | 33.3 | 67 | 18.2 |
| මුළු එකතුව | 184 | 100 | 81 | 100 | 95 | 100 | 9 | 100 | 369 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

***මුළු කර්මාන්තකරුවන් සංඛ්‍යාව 369 කි.**

### 3.2.1 වයස් කාණ්ඩ අනුව සහල් සැකසුමට සහභාගීත්වය

සහල් සැකසුම සඳහා කිනම් වයස් කාණ්ඩයන් වැඩිපුර සහභාගි වන්නේ ද යන්න වගු අංක 3.2 මඟින් විමසුමට ලක් කරන ලදී. මෙහි දී, වයස අවුරුදු 30 සිට 70 ට වැඩි වයස් කාණ්ඩයන් පිළිබඳ සැලකීමට භාජනය කරනු ලැබුණි. සමස්ථ නියැදිය සැලකීමේ දී 89%ක් මධ්‍ය වයස් කාණ්ඩයට එනම්, වයස අවු.30-60ක් අතර පරාසයේ විය. දිස්ත්‍රික්ක අනුව සැලකීමේ දී ද එම වයස් කාණ්ඩයට අයත් වැඩි පිරිසක් මෙම සහල් සැකසුම සඳහා යෙදී සිටින බව පැහැදිලි වේ. තරුණ වයස් කාණ්ඩය, එනම් වයස අවුරුදු 30 හා ඊට අඩු පරාසය සැලකීමේ දී සමස්ථ නියැදියේ 3.3%ක ප්‍රතිශතයකි. මේ අනුව පැහැදිලි වන්නේ තරුණ කණ්ඩායම් එතරම් යොමු වී නැති බවයි. දිනෙන් දින වඩාත් පුළුල් වෙමින් ඉදිරියට යන පෞද්ගලික අංශය හේතුවෙන් බොහෝ පිරිස් එම ආයතනවල රැකියා සඳහා යොමු වී සිටිති. පෞද්ගලික ආයතනයක රැකියාවක් කිරීමේ දී ඔවුන්ට ලැබෙන පහසුකම්, සමාජ තත්ත්වය සහල් සැකසුම වැනි රැකියාවක් තුළින් ලැබීමට නො හැකි බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය. මේ නිසාම, තරුණ තරුණියන් මෙවැනි රැකියාවලට යොමු වන්නේ ඉතා අඩු ප්‍රමාණයකි. මේ නිසා, තරුණ තරුණියන්ගේ විරැකියාව සඳහා සහල් සැකසුමෙන් සිදුව ඇති බලපෑම ඉතා අල්ප ය.

වගු අංක 3.2: වයස් කාණ්ඩ අනුව සහල් සැකසුමට සහභාගිත්වය

| වයස් පරාසය (අවුරුදු) | අනුරාධපුර | පොළොන්නරුව | කුරුණෑගල | පුත්තලම | මුළු සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| 30 හා ඊට අඩු | 7 | 3 | 2 | - | 12 | 3.3 |
| 31-40 | 55 | 20 | 27 | 1 | 103 | 27.9 |
| 41-50 | 65 | 30 | 28 | 1 | 124 | 33.6 |
| 51-60 | 44 | 24 | 29 | 5 | 102 | 27.6 |
| 61-70 | 12 | 04 | 9 | 2 | 27 | 7.3 |
| 70 | 1 | - | - | - | 1 | 0.3 |
| මුළු එකතුව | 184 | 81 | 95 | 9 | 369 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

### 3.2.2 අධ්‍යාපන තත්ත්වය අනුව නියැදි ව්‍යාප්තිය

අධ්‍යාපන තත්ත්වය ඉහළ මට්ටමක පැවතීම කිසියම් කාර්යයක් වඩාත් සාර්ථකව කර ගැනීමට ඉවහල් වන බව සැලකෙන අතර සහල් සැකසුම්කරුවන්ගේ අධ්‍යාපන මට්ටම වගු අංක 3.3 මඟින් විස්තර කොට දක් වේ.

වගු අංක 3.3: කර්මාන්තකරුගේ අධ්‍යාපන මට්ටම

| අධ්‍යාපන තත්ත්වය | පුත්තලම | අනුරාධපුර | කුරුණෑගල | පොළොන්නරුව | මුළු සංඛ්‍යාව සස | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| 1 විධිමත් අධ්‍යාපනයක් නො ලද | - | 1 | 2 | - | 3 | 0.8 |
| 2 ප්‍රාථමික ශ්‍රේණි (0-5) | - | 25 | 10 | 8 | 43 | 11.7 |
| 3 ද්විතියික ශ්‍රේණි (6-10) | 5 | 46 | 31 | 35 | 117 | 31.6 |
| 4 සා.පෙ. සමත් | 3 | 87 | 25 | 28 | 143 | 38.8 |
| 5 අ.පො.ස. (උ.පෙ) සමත් | 1 | 24 | 27 | 10 | 62 | 16.8 |
| 6 උපාධි අපේක්ෂක | - | 1 | - | - | 1 | .03 |
| මුළු එකතුව | 9 | 184 | 95 | 81 | 369 | 100.0 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

අධ්‍යයනයට භාජනය කළ සියලුම දිස්ත්‍රික්කවල සහල් සැකසුම්කරුවන්ගේ අධ්‍යාපන මට්ටම සමස්ථයක් ලෙස ගත්විට 70%ක් ද්විතියික හා අ.පො.ස (සා.පෙ) දක්වා ඉගෙනීම ලද පිරිස වේ.

උපාධි අපේක්ෂිත සැකසුම්කරුවකු වාර්තා වූයේ අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් පමණක් වන අතර එය සමස්ථ නියැදි ප්‍රතිශතයෙන් 0.3%කි.

සහල් සැකසුමට ඉහළ අධ්‍යාපන මට්ටමක් නො පැවතීම තුළින් පැහැදිලි වන්නේ, උසස් අධ්‍යාපනය ලද පිරිස් වෙනත් රැකියා මාර්ග වෙත යාමේ ප්‍රවණතාවයක් පවතින බවයි. මේ දිස්ත්‍රික්ක තුළ ශ්‍රම හිඟයක් පැවතීමට එක් හේතුවක් වූයේ ද, කිසියම් මට්ටමක උගත් පිරිස් වෙනත් රැකියාවලට යාම බව ගොවි සාකච්ඡා තුළින් පැහැදිලි විය.

### 3.2.3 කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියාව

අධ්‍යයනයට භාජනය කළ කර්මාන්තකරුවන් 369 දෙනාගේ ප්‍රධාන රැකියාව පිළිබඳ විමසීමේ දී පුත්තලම 22%ක්, පොළොන්නරුව 36%ක්, අනුරාධපුර 47%ක්, හා කුරුණෑගල 32%ක් ලෙස ප්‍රධාන රැකියාව ගොවිතැන විය. සහල් සැකසුම ස්වයංරැකියාවල වැඩි තියුතු වූවත් වාර්තා වූයේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ (41%) ක් වන අතර වගු අංක 3.4 මඟින් වැඩි විස්තර පැහැදිලි කොට තිබේ.


වගු අංක 3.4: කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියාව

| ප්‍රධාන රැකියාව | පුත්තලම | | අනුරාධපුර | | කුරුණෑගල | | පොළොන්නරුව | | මුළු එකතුව සහ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ගොවිතැන | 02 | 22.2 | 86 | 46.7 | 30 | 31.6 | 29 | 35.8 | 147 | 39.8 |
| සහල් සැකසුම | 06 | 66.7 | 40 | 21.7 | 33 | 23.2 | 33 | 40.7 | 112 | 30.3 |
| ව්‍යාපාරික | - | - | 12 | 6.5 | 07 | 7.4 | 08 | 9.9 | 27 | 7.3 |
| ස්වයංරැකියා ශිල්පීය රැකියා | - | - | 12 | 6.5 | 5 | 5.3 | 02 | 2.5 | 19 | 5.1 |
| ගොවිපළ සහායක | - | - | 15 | 8.2 | 16 | 16.8 | 03 | 3.7 | 34 | 9.2 |
| වෙනත් | 01 | 11.1 | 19 | 10.4 | 4 | 15.7 | 06 | 7.4 | 30 | . 8.1 |
| මුළු එකතුව | 09 | 100 | 184 | 100 | 95 | 100 | 81 | 100 | 369 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

සමස්ථයක් ලෙස, අධ්‍යයන නියැදියේ ප්‍රධාන ගොවිකාරකයන් ගොවිතැන් කටයුතුවල නියැලී ඒ තුළින් තම ජීවනෝපාය මාර්ගය සකසා ගත් බව පැහැදිලි වේ. සහල් සැකසුම් කර්මාන්තය, අලෙවිය සඳහා සිදු කිරීම තුළින් යම් ආදායමක් ලබා ගන්නේ සමස්ථ නියැදියේ ප්‍රධාන රැකියාව ලෙස හා එසේ නොවන කණ්ඩායමේ 172 දෙනෙකු පමණි. මෙම අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියා සහ ද්විතීයික රැකියා විමසුමට ලක් කරන ලදී.

රූප සටහන් අංක 3.1: අලෙවිය සඳහා සහල් සැකසුම සිදුකරන කර්මාන්තකරුවන්ගේ ප්‍රධාන රැකියා




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

මෙම අලෙවිය සහ පරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කරන කර්මාන්තකරුවන්ගෙන් (101/172) 59%ක් තමන්ගේ ප්‍රධාන රැකියාව ලෙස සහල් සැකසුම තෝරා ගෙන ඇත. මෙයින් කාන්තා ප්‍රතිශතය 56%ක් වන අතර පිරිමි ප්‍රතිශතය 3%ක් වේ. කාන්තාව තම ගේ දොර රාජකාරී සමඟ සිදු කළ හැකි ස්වයංරැකියාවක් ලෙස සහල් සැකසුම් කර්මාන්තය තෝරා ගෙන ඇති බව පැහැදිලි වේ.

අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන කර්මාන්තකරුවන් 21%ක ගේ ප්‍රධාන රැකියාව ගොවිතැන වූ අතර පිළිවෙළින් 9%ක් සහ 7%ක ගේ ප්‍රධාන රැකියාව ව්‍යාපාරික හා ගොවිපළ සහායක විය. මෙම පිරිස් ද්විතියික රැකියාවක් ලෙස සහල් සැකසුම සිදු කරයි. මෙම සහල් සැකසුම තුළින් ලබන ආදායම පවුලේ ආර්ථිකය තවදුරටත් ශක්තිමත් වීමට පිටුවහලක් වී ඇති බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය.

### 3.2.4 පවුලේ සාමාජික සංඛ්‍යාව

කිසියම් පවුලක පවුලේ සාමාජිකත්වය ඉහළ අගයක් ගැනීම තිවසේ සිදුවන ශ්‍රමය වැයවන කාර්යයන් සඳහා රුකුලක් වේ. ඉන් කිසියම් සාමාජික සංඛ්‍යාවක් එම කටයුතුවලට සහභාගි වන්නේ නම්, එම නිෂ්පාදන පිරිවැය යම් ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හේතු පාදක වනු ඇත. සහල් සැකසුම් දිස්ත්‍රික්ක තුළ අධ්‍යයනයට භාජනය කළ නියැදියේ පවුලක සාමාජිකත්වය කොතරම් ද යන්න විමසීමට භාජනය කරන ලදී (වගු අංක 3.5).

වගු අංක 3.5: පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව නියැදි ව්‍යාප්තිය

| පවුලේ සාමාජික සංඛ්‍යාව | අනුරාධපුර | | පොළොන්නරුව | | කුරුණෑගල | | පුත්තලම | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 1-2 | 17 | 9.2 | 04 | 4.9 | 09 | 9.5 | 0 | - | 30 | 8.1 |
| 3-4 | 89 | 48.4 | 43 | 53.1 | 50 | 52.6 | 08 | 88.9 | 190 | 51.5 |
| 5-6 | 75 | 40.8 | 30 | 37.0 | 31 | 32.6 | 0 | - | 136 | 36.9 |
| 7 | 03 | 1.6 | 04 | 4.9 | 05 | 5.3 | 01 | 11.1 | 13 | 3.5 |
| මුළු එකතුව | 184 | 100 | 81 | 100 | 95 | 100 | 09 | 100 | 369 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

සමස්ථ නියැදිය සැලකුවිට 52%ක නිවෙස්වල සාමාජික ගණන 3-4 අගයක් වන අතර මෙම ප්‍රතිශතය පිළිවෙළින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ 48%ක් ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 53%ක් ද, කුරුණෑගල, අම්පාර දිස්ත්‍රික්කයේ 53%ක් ද, පුත්තලම දිස්ත්‍රික්කයේ 89%ක් ද විය. මෙලෙස අඩු සාමාජික සංඛ්‍යාවක් කුටුම්භයක සිටීම මෙම කර්මාන්තය සඳහා පවුලේ ශ්‍රමය යොදා ගැනීම සඳහා ගැටලුවක් වී තිබේ. තව ද, පවුලේ සාමාජිකත්වය හතට වැඩි සමස්ථ නියැදි ප්‍රතිශතය 3%ක් වන අතර වැඩිම ප්‍රතිශතය කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වන අතර එය 5%ක ප්‍රතිශතයකි.

පවුල් ශ්‍රමය අඩුවෙන් භාවිතා වීම, සහල් නිෂ්පාදන වියදම ඉහළ යාමට හේතු වී ඇති බව ගොවි සාකච්ඡාවල දී අනාවරණය විය. මහා පරිමාණ ව සිදු කිරීමේ දී කුලී ශ්‍රමය එතරම් ගැටලුවක් නොවන බව ද, කර්මාන්තය අතහැර දමා ඇති පිරිස් හට කර්මාන්තයෙන් බැහැරවීමට එක් හේතුවක් වී තිබුණේ ශ්‍රම ගැටලුව බව ගොවි සාකච්ඡාවල දී වැඩිදුර කරුණු ඉදිරිපත් විය.

### 3.2.5 කුඹුරු ඉඩම් භාවිතය හා අස්වනු සහල් සැකසුමට යොදා ගැනීම

සහල් සැකසුම් සිදු කිරීමේ දී කර්මාන්තකරු සතුව කුඹුරු ඉඩම් පැවතීම කර්මාන්තය සිදු කර ගෙන යාමට වඩා පහසු වී තිබුණි. සමස්ථ නියදිය සැලකීමේ දී 82% ප්‍රතිශතයක් වී වගාව සිදු කොට තිබූ අතර මෙම කුඹුරු තමන්ගේ, අඳයට ගත් හෝ බද්දට ගෙන වගාකළ ඉඩම් විය. දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී තමන්ගේම කුඹුරු වගා කළ කර්මාන්තකරුවන්ගේ ප්‍රතිශතය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ 42%ක්, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 16%ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 23%ක් හා පුත්තලම දිස්ත්‍රික්කයේ 2%ක් විය (වගු අංක 3.6).

වගු අංක 3.6: කුඹුරු ඉඩම් භාවිතය

| දිස්ත්‍රික්කය | කුඹුරු ඉඩම් අයිති ගොවීන් සංඛ්‍යාව N =369 | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අනුරාධපුරය | 153 | 41.5 |
| පොළොන්නරුව | 58 | 15.7 |
| කුරුණෑගල | 86 | 23.3 |
| පුත්තලම | 06 | 2.0 |
| මුළු එකතුව | 303 | 82.1 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

මෙම කුඹුරු ඉඩම් වගා කළ ගොවීන් යල සහ මහ කන්න අනුව කෙතරම් අස්වනු ප්‍රමාණ ලබා ගත්තේ ද යන්න පිළිබඳ දත්ත ලබා ගන්නා ලදී.


වගු අංක 3.7: වගා කළ ඉඩම් ප්‍රමාණ අනුව ලබාගත් අස්වනු

| දිස්ත්‍රික්කය | වගා කළ ඉඩම් ප්‍රමාණය | | අස්වැන්න (කිලෝ ග්‍රෑම්) | | සහල් සැකසුමට යෙදවූ ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | | | | සමස්ථ නියැදිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | යල | | මහ | | | | |
| | යල | මහ | යල | මහ | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | % | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | % | මුළු අස්වැන්න | සහල් සැකසුමට යෙදූ ප්‍රමාණය | % |
| අනුරාධපුරය | 209.5 | 361 | 346,605 | 654,210 | 112,740 | 32.5 | 161,570 | 24.6 | 1,000,815 | 274,310 | 27.4 |
| කුරුණෑගල | 114.8 | 129 | 141,281 | 153,096 | 45,915 | 32.4 | 43,474 | 28.4 | 294,377 | 89,389 | 30.4 |
| පොළොන්නරුව | 161.0 | 145 | 241,120 | 264,460 | 34,694 | 14.3 | 43,775 | 16.6 | 505,580 | 78,469 | 15.5 |
| පුත්තලම | 7.8 | 9 | 10,300 | 8,300 | 7,600 | 73.8 | 4,700 | 56.6 | 18,600 | 12,300 | 66.1 |
| මුළු එකතුව | 493.1 | 644 | 739306 | 1080066 | 200949 | 27.2 | 253519 | 23.5 | 1819372 | 454468 | 25.1 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

වගු අංක 3.7ට අනුව, ගොවීන් සහල් සැකසුමට තමන්ගේ වී අස්වනු කිනම් ප්‍රතිශතයක් යොදවන්නේ ද යන්න දක්වා ඇත. සමස්ථ නියැදිය සැලකීමේ දී තමන්ගේ මුළු අස්වැන්නෙන් 25%ක වී අස්වනු ප්‍රමාණයක් සහල් සැකසුමට යොදවන බව පැහැදිළි වේ. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සැලකූ විට අනුරාධපුර 27%ක්, කුරුණෑගල 30%ක්, පොළොන්නරුව 15%ක් හා පුත්තලම 66%ක් වශයෙනි. මෙම ප්‍රමාණයන් කන්න අනුව ද දක්වා ඇති අතර සමස්ථ නියැදියේ මහ කන්නයේ දී මුළු අස්වනු ප්‍රමාණයෙන් 24% යොදා ඇති අතර යල කන්නයේ එම ප්‍රමාණය 27%කි. පුත්තලම දිස්ත්‍රික්කයේ වැඩි ප්‍රතිශතයක් සහල් සැකසුමට යොදා ගෙන ඇත්තේ හොඳ සහල් ඉල්ලුමක් එම නියැදිය සතුව පැවතීම නිසා ය. වැඩි පිරිසකට කුඹුරු ඉඩම් නොමැතිවීම, නගරය ආසන්න සහල් ගම්මාන පිහිටා තිබීම තවදුරටත් සහල් ඉල්ලුම සඳහා වර්ධනීය සාධක වී තිබේ.

ප්‍රස්ථාර අංක 3.2: වී වගාවේ අස්වනු භාවිතය




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

මේ අනුව වඩාත් පැහැදිළි වූයේ, ගොවීන් තමන්ගේ අස්වැන්නෙන් වැඩි ප්‍රමාණයක් එනම් මුළු අස්වැන්නෙන් 75%ක් අලෙවිය සඳහා යොදවන බවයි. වී වගාවේ යෙදවුම් සහ යන්ත්‍ර වියදම් හා පරිභෝජනය සඳහා ගත් ණය මුදල් ගෙවීම සඳහා අස්වනු ලබාගත් විගස අලෙවිය සිදු කළ යුතු ය. අනිවාර්යයෙන් වී අස්වනු අලෙවි කිරීම සිදු කළ යුතු බව සමස්ථ නියැදි ප්‍රතිශතය 94%ක ගේ මතය විය. ගොවි සාකච්ඡාවල දී තවදුරටත් අනාවරණය වූයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ලබා ගත් ණය මුදල් ගෙවීමට, මූලිකව සහන පොළියක් යටතේ ණය මුදලක් ලබා දෙන්නේ නම් තමන්ගේ සියලුම අස්වනු සහල් සැකසුමට යොද ගත හැකි බවයි.

## 3.3 ගෘහස්ථ ආදායම

කිසියම් ගෘහස්ථයක ආදායම එම ගෘහයේ ජීවන මට්ටම යහපත් හෝ අයහපත් තත්ත්වයේ පවත්වාගෙන යාමට උපකාරී වේ. තමන් ලබන ආදායම් ප්‍රමාණය අනුව ඒ ඒ කාර්යයන් සඳහා යෙදවෙන මුදල තීරණය වන අතර සමස්ථ නියැදියේ ආදායම් තත්ත්වයන් කෙසේ ද යන්න, විවිධ වූ දර්ශකයන් භාවිතා කරමින් අධ්‍යයනයට ලක් කරන ලදී. නියැදියේ ආදායම් තොරතුරු ලබා ගැනීම් සඳහා වී වගාවෙන් ලැබෙන ආදායම, ස්ථිර හෝ වෙනත් බෝග වගා ආදායම, සත්ත්ව පාලනයෙන් ලබන ආදායම, රැකියාවලින් ලැබෙන ආදායම (පුද්ගලික හා රජයේ රැකියා), වෙනත් මාර්ග වලින් ආදායම, ආධාර වශයෙන් ලැබෙන ආදායම යන මූලයන් උපයෝගී කර ගන්නා ලදී. මෙහි දී, ආධාර වශයෙන් ලැබෙන ආදායම ලෙස සමෘද්ධි ආධාර හා පිං පඩි ඇතුලත් වන අතර වෙනත් ආදායම් මාර්ග ලෙස ව්‍යාපාර, ස්වයංරැකියා සහ ශිල්පීය රැකියා වලින් ලබන ආදායම සැලකිල්ලට ගන්නා ලදී. මෙම සියලුම මාර්ගවලින් ලබන ආදායම විශ්ලේෂණය කිරීම තුළින් එක් කුටුම්භයක සාමාන්‍ය මාසික ආදායම කිනම් ප්‍රමාණයක් ද යන්න වගු අංක 3.8 මඟින් දක්වා තිබේ.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

වගු අංක 3.8: කුටුම්භයක සාමාන්‍ය මාසික ආදායම

| දිස්ත්‍රික්කය | පවුල් සංඛ්‍යාව | සාමාන්‍ය (Average) මාසික ආදායම (රුපියල්) |
|---|---|---|
| පුත්තලම | 9 | 34,163.00 |
| අනුරාධපුරය | 184 | 41,947.00 |
| කුරුණෑගල | 95 | 54,222.00 |
| පොළොන්නරුව | 81 | 86,092.00 |
| මුළු එකතුව | 369 | 54106.00 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

එක් පවුලක ආදායම් තත්ත්වය පිළිබඳ විමසීමේ දී පොළොන්නරුව දිස්ත්‍රික්ක නියැදි පවුලක් සාපේක්ෂව අනික් දිස්ත්‍රික් පවුල්වලට වඩා වැඩි ආදායමකට හිමිකම් දක්වන බව පැහැදිලි වේ. ප්‍රධාන වශයෙන් වැඩි ප්‍රමාණයක් ගොවීන් සතුව සහල් සැකසුමට අමතරව වෙනත් ආදායම් මාර්ග පැවතීම මෙයට හේතු වී ඇති බව දත්ත විශ්ලේෂණය කිරීමේ දී පැහැදිලි විය.

### 3.3.1 අලෙවිය සිදු කරන කුටුම්භ පමණක් සලකා බැලීම

සහල් අලෙවිය සහ පරිභෝජනය සඳහා ගොවීන් 172 දෙනෙකු යොමු වී ඇති අතර එම නියැදියන්ගේ ආදායම් තත්ත්ව කෙසේ ද යන්න, විමසුමට ලක් කරන ලදී. එහි දී, සහල් සැකසුමෙන් ලත් ආදායම මුළු ආදායමෙන් කිනම් ප්‍රමාණයක් ද යන්න දත්ත ලබා ගන්නා ලදී.

වගු අංක 3.9: සහල් අලෙවිය සිදු කරන කුටුම්භ ආදායම

| දිස්ත්‍රික්කය | පවුල් සංඛ්‍යාව | මුළු මාසික ආදායම (රුපියල්) | සහල් සැකසුමෙන් ලද මාසික ආදායම (රුපියල්) | මුළු ආදායම % ක් ලෙස |
|---|---|---|---|---|
| පුත්තලම | 5 | 36,746.00 | 5,816.00 | 16 |
| අනුරාධපුරය | 87 | 44,680.00 | 11,605.0 | 26 |
| කුරුණෑගල | 36 | 81,482.00 | 38598.0 | 47 |
| පොළොන්නරුව | 44 | 129650.00 | 97983.0 | 76 |
| මුළු එකතුව | 172 | 73139.50 | 38500.50 | 53 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත - 2012


සමස්ථ නියැදිය සැලකීමේ දී මුළු ආදායමෙන් 53%ක් සහල් සැකසුමෙන් ලබා ගන්නා අතර එය දිස්ත්‍රික්ක වශයෙන් පුත්තලම 16%ක්, අනුරාධපුර 26%ක්, කුරුණෑගල 47%ක් සහ පොළොන්නරුව 76%ක් ලෙස විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මුළු ආදායම ද ඉහළ මට්ටමක පවතින අතර සහල් සැකසුමෙන් මුළු ආදායමට ලබා දෙන දායකත්වය වැඩි ය. මේ දත්ත අනුව, පැහැදිලි වන්නේ සහල් සැකසුම ප්‍රධාන රැකියාවක් බවට සාර්ථකව සිදු කළ හැකි කර්මාන්තයක් බව ය. පවුලේ ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වා ඇති බව පැහැදිලි වේ. මේ තත්ත්වය තවදුරටත්

විමසා බැලීමට එනම් සමස්ථ ගොවි ආදායම කෙසේ ව්‍යාප්ත වී ඇත් ද යන්න විශ්ලේෂණය කිරීම සඳහා ලෝරන්ස් වක්‍ර විග්‍රහය උපයෝගී කර ගන්නා ලදී.

### 3.3.2 ලෝරන්ස් වක්‍ර විග්‍රහය අනුව ගොවි ආදායම් මට්ටම්

රටක සමාජයක හෝ ජන කොට්ඨාසයක දියුණුව මැනීමේ ඒකකයක් ලෙස ආදායම් ව්‍යාප්ති විෂමතාවය යොදා ගැනේ. මෙම ආදායම් ව්‍යාප්ති විෂමතාවය ප්‍රස්ථාරිකව දැක්වීම ලෝරන්ස් වක්‍රය මඟින් සිදු වේ. ලෝරන්ස් වක්‍රය මූල රේඛාවට ආසන්නවීමත් සමඟම එම ජන කොට්ඨාසයේ ආදායමේ විෂම ව්‍යාප්තියේ අඩුවීමක් පෙන්වා දෙයි. ලබාගත් නියැදියේ ආකාර තුනක කර්මාන්තකරුවන් විය. එනම්, අලෙවිය සහ පරිභෝජනය සඳහා කර්මාන්තය සිදු කරන, පරිභෝජනය සඳහා පමණක් කර්මාන්තය සිදු කරන හා දැනට සහල් කර්මාන්තය සිදු නො කරන අය ලෙස යි. මෙම කණ්ඩායම් තුන සඳහා වෙන් වෙන්ව ලෝරන්ස් වක්‍රය නිර්මාණය කරන ලදී.

**ප්‍රස්ථාර අංක 3.3: සහල් සැකසුම් කර්මාන්තය කෙරෙහි කුටුම්භයන්ගේ ආදායම් ව්‍යාප්ති විෂමතාවයේ බලපෑම**




එනම්, වක්‍රයට අනුව අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන කණ්ඩායම සතු වක්‍රය මූල රේඛාවට ආසන්නව ගමන් කරන අතර අනික් කාණ්ඩ දෙකට අයත් රේඛා මූල රේඛාවට ඈත්ව යාමක් හඳුනාගත හැක. මේ අනුව, පැහැදිළි වන්නේ අලෙවිය හා පරිභෝජනයට සහල් කර්මාන්තයේ යෙදී සිටින ගොවීන් අතර අඩු ආදායම් විෂමතාවයක් පවතින අතර එකම කණ්ඩායමක් කර්මාන්තය තුළ රැඳී සිටින බවයි. අනික් කණ්ඩායම් දෙක සතුව වැඩි ආදායම් විෂමතාවයක් පවතින අතර එකම ආකාරයේ කණ්ඩායම් දෙකක් බව පැහැදිළි වේ.

සිව්වැනි පරිච්ඡේදය

# ප්‍රතිඵල හා සාකච්ඡා

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීමේ අධ්‍යයනයේ දී අරමුණු කිහිපයක් යටතේ එම ඇගයීම සිදු කරන ලදී. එනම්, ව්‍යාපෘතියේ ක්‍රියාත්මක ක්‍රමවේදය ඇගයීමකට ලක් කිරීම, පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය, සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා, සැකසුම්කරුවන්ගේ ආදායම්, වියදම් සහ ව්‍යාපෘතියේ තිරසාර භාවය හා බැඳුණු සාධක ඇගයීම පිළිබඳවයි. මෙම පරිච්ඡේදය මඟින් ඒ ඒ අරමුණු ඔස්සේ ලබා ගත් සොයා ගැනීම් සාකච්ඡාවට බඳුන් කෙරේ.

## අරමුණ 1:

## 4.1 සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ ක්‍රියාත්මක ක්‍රමවේදය ඇගයීමකට ලක් කිරීම

### 4.1.1 හැඳින්වීම

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය සුළු කර්මාන්තයක් ලෙසින් වී ගොවියාගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම මූලිකව අරමුණු කෙරේ. මේ තුළින් දේශීය අමුද්‍රව්‍ය භාවිතය හා ග්‍රාමීය මට්ටමේ කෘෂිකාර්මික ස්වයංරැකියා අවස්ථා බිහි කිරීම ප්‍රධාන වෙයි. ශ්‍රී ලංකාව යනු කෘෂිකාර්මික රටක් වුව ද, ලාංකේය ජන සමාජය තුළ සමාජ-ආර්ථික වශයෙන් ඉතා අසරණ තත්ත්වයකට පත් ව සිටින පුද්ගලයා වන්නේ වී ගොවියා ය. වී සඳහා සාධාරණ මිලක් නො ලැබීම යන ප්‍රධාන ගැටලුව හේතුකොට ගනිමින් ගොවීන් මෙම අසරණ බවට පත්ව තිබේ. මෙම තත්ත්වය මඟ හරවා තමාගේ නිෂ්පාදන වලට ලැබිය හැකි උපරිම මුදල ලබා ගැනීමට ගොවීන් උනන්දු කරවීම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් “වී අලෙවිකරණ ගොවියා” වෙනුවට නව තාක්ෂණික ක්‍රමවේදයක් භාවිතා කරමින් ගුණාත්මක බවින් ඉහළ “සහල් අලෙවිකරණ ගොවියෙකු” නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම බෙදා දී ඇත.

පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් හඳුන්වා දෙන ලද මෙම සහල් සැකසුම පිළිබඳ නව තාක්ෂණික ක්‍රමවේදය ග්‍රාමීය ගොවීන් අතරට ගෙන යාම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය සමඟ අත්වැල් බැඳගෙන ඇති ආයතන කිහිපයක්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම යන දිස්ත්‍රික්ක තුළින් හඳුනා ගත හැකි විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය, වර්ල්ඩ් විෂන් ආයතනය, ඉෆාඩ් ආයතනය, වාරි පුබුදුව ආයතනය, මහවැලි සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන මෙකී මෙහෙවරට සහයෝගය ලබා දී තිබේ.

මෙම ව්‍යාපෘතියේ ආරම්භක ක්‍රමවේදය, එහි සාර්ථකත්වයට බෙහෙවින් බලපානු ලබයි. 2005 වර්ෂයේ ආරම්භ කොට 2012 වර්ෂය වනවිට ගම්මාන රාශියක සහල් සැකසුම ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබී තිබේ. මෙම සුළු කර්මාන්තය සිදු කිරීම සඳහා ගම්මාන තෝරා ගැනීම සහ සුදුසු

ප්‍රතිලාභීන් තෝරා ගැනීම, විවිධ වූ ක්‍රමෝපායයන් ඔස්සේ සිදු වී ඇත. මෙහි දී, විශේෂත්වය වන්නේ පුහුණුව ලබාදීම පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් සිදු කොට විවිධ වූ ආයතන ගොවීන් තෝරා ගැනීම සහ සංවිධාන කටයුතු සිදු කිරීම ය. අධ්‍යයනයට භාජනය කරන තියැදිය කිනම් ආයතන විසින් සහල් සැකසුමට යොමු කළේ ද යන්න වගු අංක 4.1 මගින් විස්තර කර ඇත. මෙම ගම්මාන පිහිටුවීමේ දී වැඩි දයකත්වයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සමෘද්ධි සංවර්ධන අධිකාරිය(26.2%), කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක හරහා (23.8%) සම්බන්ධ වී ඇත. රාජ්‍ය නොවන ආයතනයක් ලෙස වර්ල්ඩ් විෂන් ආයතනය (21.4%) විශේෂ මැදිහත්වීමක් සිදු කොට තිබේ. මෙයට අමතරව, අනිකුත් ආයතන ද ජීවන උපාය මාර්ග ඉහළ නැංවීමේ අරමුණ ඇතිව මෙම වැඩ සටහන ආරම්භ කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කර ඇත.

වගු අංක 4.1: ගොවීන් තෝරා ගැනීම සහ සංවිධාන කටයුතු සිදුකළ ආයතන

| සංවිධානය කළ ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | කුරුණෑගල | පුත්තලම | තියැදියේ ගම්මාන සහ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| පසු අස්වනු තාක්ෂණ ආයතනය | - | 3 | - | - | 3 | 0.8 |
| වර්ල්ඩ්විෂන් ආයතනය | 25 | - | 51 | 3 | 79 | 21.4 |
| මහවැලි ආයතනය | 27 | - | - | - | 27 | 7.3 |
| කෘෂිකර්ම උපදේශක | 39 | 22 | 21 | 6 | 88 | 23.8 |
| වාරි පුබුදුව ආයතනය | 30 | - | - | - | 30 | 8.1 |
| ප්‍රාදේශීය ලේකම් සහ සමෘද්ධි | 30 | 56 | 11 | - | 97 | 26.3 |
| ඉෆාඩ් ආයතනය, කෘෂිකර්ම උපදේශක (AI) | 24 | - | - | - | 24 | 6.5 |
| දේශපාලන අධිකාරිය | 4 | - | - | - | 4 | 1.1 |
| ගොවිජන සේවා සහ කෘ.ප.නි.ස | 03 | - | 12 | - | 3 | 0.8 |
| ස.ණ.ස. හා වෙනත් | - | - | 12 | - | 12 | 3.3 |
| මුළු එකතුව | 184 | 81 | 95 | 09 | 369 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

### 4.1.2 ගම්මානය සහ පුහුණු ලාභීන් තෝරා ගැනීම

මෙම සහල් සැකසුම් ගම්මාන තෝරා ගැනීමේ දී, මේ සඳහා මූලික වූ ආයතන, කර්මාන්තකරුවන් තෝරා ගැනීමේ දී ද විශේෂිත වූ ක්‍රමවේදයක් අනුගමනය කොට නැති අතර කිසියම් ආයතනයක, පුද්ගලයෙකුගේ ඉල්ලීමක් මත ද මෙම පුහුණුව ලබාදීම සිදු කොට තිබේ. සහල් සැකසුම් කාර්යය කර ගෙන යාමට කැමැත්ත ඇති අය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව වෙනත් නිර්නායක මත ද තෝරා ගැනීම සිදු වී ඇත.

තෝරා ගැනීම සඳහා භාවිතා කළ වෙනත් නිර්ණායක

- සංවිධාන කටයුතු සිදුකරන ආයතනයේ හෝ අදාළ සමිතියේ සාමාජිකයෙකු වීම සුදුසුකමක් ලෙස සලකා ඇත. උදාහරණ ලෙස, සමෘද්ධි සමිති මගින් සංවිධානය කරන වැඩසටහන්වල සමෘද්ධිලාභියෙකු වීම මූලික කොන්දේසියක් වී තිබේ.
- වැඩසටහන සිදු කරන නිලධාරියාගේ හිතවත්කම් මත ද කර්මාන්තකරු තෝරා ගෙන ඇත. උදාහරණ ලෙස, කෘෂිකර්ම උපදේශක මහතා සමඟ සම්බන්ධයක් ඇති අය මේ සඳහා තෝරා ගෙන තිබු අවස්ථා හමු විය.
- බැරලයක් ගැනීමට මුදල් ඇති පුද්ගලයන් සහභාගි වූ අවස්ථා පවතී.
- සහල් සැකසුම් වැඩසටහනට සම්බන්ධවීමට අයෙක් නොමැති නිසා සහභාගිවූවන් තෝරා ගෙන ඇත (මේ අය සහභාගි වී ඇත්තේ කර්මාන්තයක් ලෙස කිරීමට නොව පරිභෝජනය සඳහා ගුණාත්වයෙන් යුතු සහල් ලබා ගැනීමට පමණි).
- අදාළ දේශපාලකයන්ගේ හිතවතුන් වෙත බැරල් සහන මිලට හෝ නො මිලයේ ලබා දීමට කර්මාන්තකරුවන් තෝරා ගෙන තිබේ.
- සහල් සැකසුම් කිරීමට හැකියාවක් නොමැති පුද්ගලයන් තෝරා ගෙන තිබුණි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහල් සැකසුම් ගම්මාන 15ක් ආශ්‍රයෙන් කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී රැස් කර ගත් තොරතුරු අනුව සමස්ථයක් ලෙස මෙම ප්‍රදේශයේ සහල් සැකසුම් වැඩසටහනට මූලික වූ ආයතන පිළිබඳව අධ්‍යයනය කර ඇත. එහි දී, විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මැදිහත් වී ඇති බව හඳුනා ගැනීමට හැකි විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ වර්ල්ඩ් විෂන් ආයතනය සහල් සැකසුම් ගම්මාන ආරම්භ කිරීම සඳහා විශාල මෙහෙයක් සිදු කොට තිබුණි. මෙම ආයතනය විසින් ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගම්මාන 35 තුළින් "ග්‍රාමීය සංවර්ධන සේවා සමිති" යන නාමයෙන් සංවිධාන 35ක් පිහිටුවා මෙම සමිති තුළින් දුප්පත් ජනතාවගේ ආර්ථිකය සමෘද්ධිමත් කිරීමට එක් වී සිටියි. සමිති සියල්ලේම එකමුතුවක් මගින් "සමාගමක්" ස්ථාපිත කොට ඒ සමාගම හරහා සමිතිවලට ණය මුදල් ලබාදීම සිදු කොට ඇත. මෙම සමිති සාමාජිකත්වයේ ඉල්ලීම මත "සහල් තම්බා අලෙවිය" සිදු කිරීමට ග්‍රාමීය සංවර්ධන සේවා සමිති මූලික වී තිබේ. ඒ අනුව, පසු අස්වනු තාක්ෂණ ආයතනය හරහා සහල් තැම්බීමේ ක්‍රියාවලිය සම්බන්ධව පුහුණුවක් ලබා දී ඇත. ආරම්භයේ දී බැරල් එකක් නො මිලයේ ලබා දී, මෙම කාර්යය සාර්ථකව කර ගෙන යන අය සඳහා වී වේලීමට කමතක් සහ පෙඟවීමට ටැංකි දෙකක් සාද ගැනීමට ආධාර ලබා දී තිබේ. අස්වනු නෙළන කාලයට රු.25,000/-ක ණය මුදලක් සමිතිය මගින් ලබා දෙන අතර එම මුදල ලබා දෙන්නේ තම අස්වනු නො විකුණා ගබඩා කර තබා ගැනීමට ය. හොඳින් කැප වී උනන්දුවෙන් ගොවිතැන් කටයුතු කරන අයට රු.50,000/- දක්වා ණය මුදල් නිකුත් කරයි. තව ද, මෙම ගම්මාන සමිති මගින් "සජීවිකාරකයකු" ගේ සේවය ලබා දී නිරතුරු පසු විපරම් කටයුතුවල යොදවා ඇත.

පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ සහල් සැකසුම් ගම්මාන ඇති කිරීම සඳහා පුද්ගලයින්ට පුහුණුව ලබා දීමේ දී ප්‍රධාන වශයෙන් ආයතන දෙකක මැදිහත්වීම හඳුනාගත හැකි ය. සමෘද්ධි සමිතිවල

මැදිහත් වීමෙන් දිවුලන්කඩවල, නිශ්ශංකමල්ල පෙදෙස, පුලතිසි පෙදෙස, පාසියා වැව, අබේපුර යන ගම්මානවලට ද, කෘෂිකර්ම උපදේශක මැදිහත්වීමෙන් ගිරිතලේ ජනපදය, යාය 12 හිඟුරක්ගොඩ, තලාකොලවැව, යාය 9 (මැදිරිගිරිය) යන ගම්මාන වලට සහල් සැකසුම පිළිබඳ පුහුණුව ලබාදී තිබේ. ප්‍රාදේශීය ලේකම් හා සමෘද්ධි බැංකුව මුල් වී මෙම සහල් ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කොට ඇත. සමෘද්ධිය යටතේ එක් සමෘද්ධිලාභියෙකුට ජීවනෝපාය සංවර්ධනය යටතේ ස්වයංරැකියා සඳහා රු.10,000/-ක මුදලක් වෙන් වී තිබේ. එම මුදල මඟින් බැරලයක් සහ කමතක් සාදා ගැනීමට ආධාර ලබා දී පසු අස්වනු තාක්ෂණ ආයතන පුහුණුවට යොමු කොට ඇත. සමෘද්ධි සංවර්ධන නිලධාරීගෙන් තිරතුරු පසු විපරම් සිදු වී ඇත. ඉහත කී ආයතන මූලික වී ගම තුළ සහල් සැකසුමට කැමති අය හා සුදුසු සාමාජිකයන් ගමේ සංවිධාන හරහා තෝරා ගත්ත ද සමහර ප්‍රදේශ වල (පල්ලේකාගම) දේශපාලන බලපෑම මත ද පිරිස් තෝරා ගෙන අවශ්‍ය බැරල්, කමත ආදී මූලික පහසුකම් හා ණය පහසුකම් දී ඇත. තව ද, සහල් සැකසුම වැඩි වශයෙන් කරනු ලබන පුද්ගලයන්ට කර්මාන්තය ලියාපදිංචි කිරීමේ දී දේශපාලන මැදිහත්වීම් මත එසේ ලියාපදිංචි කිරීමට නො දුන් අවස්ථා ද හඳුනා ගැනීමට හැකි විය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගොවි කාන්තා වැඩ සටහන හරහා සහල් සැකසුම් ගම්මාන හඳුන්වා දී ඇත. කෘෂිකර්ම උපදේශක මූලික වී පිහිටුවා ඇති මෙම සමිති තුළින් සහල් සැකසුම් කිරීමට හැකි අය තෝරා ගෙන තිබේ. ගොවි කාන්තා වැඩ සටහන හරහා ජීවනෝපාය සංවර්ධනය යටතේ ස්වයංරැකියාවක් ආරම්භ කිරීමට එක් අයකුට රු.10,000/- මුදලක් දෙනු ලබයි. එක් එක් අය විවිධ ස්වයංරැකියා ආරම්භ කොට ඇති අතර සහල් සැකසුම තෝරා ගත් අයට ආරම්භයේ දී බැරල් එකක් මිල දී ගැනීමට 50%ක ගොවි දායකත්වය යටතේ ආධාර ලබා දී ඇත. ඉතිරි 50%ක දායකත්වය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සපයා දෙයි. ඒ අනුව, පසු අස්වනු තාක්ෂණ ආයතනය හරහා සහල් තැම්බීමේ ක්‍රියාවලිය සම්බන්ධව පුහුණුවක් ලබාදී ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහල් සැකසුම පිළිබඳ ගම්මාන කිහිපයක් අධ්‍යයනය කිරීම තුළින් ගම්මානය සහ පුහුණුලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදයන් හඳුනා ගැනීමට හැකි විය. පුද්ගලයින් තෝරා ගැනීමේ දී ආයතන කිහිපයක් සම්බන්ධ වී තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (බමුණාකොටුව, හෙට්ටිපොල සහල් ගම්මාන), ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාන්තා කාර්යාංශය (අලව්ව, අඹන්පොල, වීරඹුගෙදර සහල් ගම්මාන), ස.ණ.ස. සමිති (කුරුණෑගල සහල් ගම්මාන), විහාරාධිපති ස්වාමීන් වහන්සේ පෞද්ගලිකව මැදිහත් වී (ඉබ්බාගමුව සහල් ගම්මාන) ආදී වශයෙන් සිදු වූ මැදිහත්වීම් මත පුහුණුව ලබා දී ඇත.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගම්මාන තුළ දැකගත හැකි වූ විශේෂ ලක්ෂණයක් නම් වර්ල්ඩ් විෂන් ආයතනය මඟින් ගමේ සංවර්ධන කටයුතු කර ගෙන යාමට සමිති පිහිටුවා, එම සමිතිවල සාමාජිකයන් අතරින් කැමති පිරිසකට සහල් සැකසුම පිළිබඳ පුහුණුව ලබාදීමට කටයුතු සලසා ඇත. එමෙන් ම, සහල් සැකසුම සාර්ථකව කර ගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ සහ ශ්‍රමය සඳහා වැය වන මුදල් ද සපයා දී ඇත. මෙම පුහුණුව ලද අයගෙන් කිහිපදෙනෙකු තවත්

පිරිසකට සහල් සැකසුම පිළිබඳව පුහුණුව ලබා දී තිබේ. මෙම වර්ල්ඩ් විෂන් හි සජීවිකාරක සහල් සැකසුම පිළිබඳ පුහුණුව ගම්වැසියන්ට ලබාදීමේ දී විශාල දායකත්වයක් සපයා දී තිබේ.

**4.1.3 ගම්මානය සහ පුහුණුලාභීන් තෝරා ගැනීම සාර්ථක ද?**

- සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය, ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කර ගෙන යාමේ දී ඒ සඳහා නිසි ක්‍රමවේදයක් පැවති නැත. ඕනෑම ආයතනයකට පසු අස්වනු තාක්ෂණ ආයතනය හා සම්බන්ධ වී එම කර්මාන්තය සඳහා අවශ්‍ය පුහුණුව ඕනෑම ප්‍රදේශයකට ගෙන යාමේ හැකියාව පවතී. මේ හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා යමින් කර්මාන්තකරුවන් බිහි වී ඇත.

- සහල් සැකසුම්කරුවන් තෝරා ගැනීමේ දී කැමති අයට මේ සඳහා සහභාගිවීමට අවස්ථාව ලබා දී තිබේ. කළ හැකි ද? පවතින පහසුකම් කවරේ ද? යන්න විමසීමක් සිදු කොට නැත. බැරල් එකක් නො මිලයේ හෝ 50%ක දායකත්වය යටතේ ලබාදෙන නිසා මෙම සහල් සැකසුම සිදු කිරීමට පෙළඹී ඇති බව සාකච්ඡාමය දත්ත ලබා ගැනීමේ දී පැහැදිලි විය.

- සහල් සැකසීමේ හැකියාව පිළිබඳව මෙන් ම ඉදිරියට පවත්වා ගෙන යා හැක්කේ කා හට ද? යන්න පිළිබඳව ආරම්භයේ දී අවධානයක් යොමු කොට නැත. සමෘද්ධි ප්‍රතිලාභීන් සහල් සකස් කිරීම පිළිබඳව තෝරා ගනු ලැබුව ද, ඔවුන්ට අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා පවතින පුද්ගල ප්‍රතිශතය ඉහළ අගයක් ගෙන තිබේ. තෝරා ගත් සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය වේලාවට මූල්‍ය පහසුකම් සලසා දුන්නේ නම්, සහල් සකස් කිරීමේ කර්මාන්තය ඉදිරියට පවත්වා ගෙන යාමේ හැකියාවක් පැවතීමේ අවස්ථා වැඩි වන්නට තිබුණි.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ලෝලුගස්වැව ප්‍රදේශයේ පිරිසකට පළාත් සභා මන්ත්‍රීවරයෙකු මාර්ගයෙන් යෙදවුම් උපකරණ ලෙස බැරල් ලබා දී ඇත. අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා නිසා සහල් සැකසුම අතරමඟ නවතා දැමීමට සිදුවී ඇති අතර මෙය ආරම්භ කිරීම නිසා ඔවුන් එතෙක් කරගෙන පැමිණි වෙනත් ජීවනෝපාය මාර්ග ද අහිමි වී තිබේ.

**ප්‍රතිලාභීන් තෝරා ගැනීම**

සහල් සැකසුම් ගම්මාන හඳුන්වාදීමේ දී අපේක්ෂිත ප්‍රතිලාභීන් ලෙස සමෘද්ධිලාභීන් හා ගොවි සංවිධාන සාමාජික සාමාජිකාවන් නම් කර තිබුණි. ලබා ගත් නියැදියේ වගු අංක 4.2 මඟින් තෝරා ගන්නා ලද කර්මාන්තකරුවන්ගේ තත්ත්වය කුමක් ද යන්න හඳුන්වා දී ඇත.

වගු අංක 4.2: සහල් සැකසුම්කරුවන් තෝරා ගැනීම

| අපේක්ෂිත ප්‍රතිලාභීන් | පුත්තලම | | අනුරාධපුර | | කුරුණෑගල | | පොළොන්නරුව | | මුළු සංඛ්‍යාව සහ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සමෘද්ධි ලබා ගන්නා | 3 | 33.3 | 50 | 27.2 | 32 | 33.7 | 42 | 51.9 | 127 | 34.4 |
| ගොවි සංවිධානයේ සාමාජිකයින් | 7 | 77.5 | 141 | 76.6 | 47 | 76.8 | 47 | 58.0 | 268 | 72.6 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

*(* ගොවීන් සංඛ්‍යාව මත ප්‍රතිශත ගණනය කොට ඇති නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ. සමෘද්ධිය ලබන කුටුම්භයන්, ගොවි සංවිධානවල සාමාජිකයන් ද වේ)*

අධ්‍යයනයට භාජනය කළ සමස්ථ නියැදිය සැලකූ විට 34%ක් සමෘද්ධිලාභීන් වන අතර 72%ක් ගොවි සංවිධානවල සාමාජිකයන් වේ.

## අරමුණු 2:

### 4.2 සහල් සැකසුම පිළිබඳ පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය ඇගයීම

ඵලදායීතාවය යනු යම් කිසි යෙදවුම් ප්‍රමාණයකින් ලැබෙන නිමැවුම වැඩිවීමකි. ඵලදායීතාවේ ප්‍රධාන මූලාශ්‍ර ලෙස තාක්ෂණය සහ දැනුම වර්ධනය, පුහුණු ශ්‍රමය, මානව ප්‍රාග්ධනය, කළමනාකරණය යන සාධක හැඳින්විය හැකි ය. පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් සහල් සැකසුම සඳහා විද්‍යාත්මක තාක්ෂණ දැනුම ලබාදීම සිදු කොට තිබේ. පර්යේෂණ අත්හදාබැලීම්, ගවේෂණ හා සමීක්ෂණ ආදියෙන් බිහිවන තාක්ෂණය මඟින් සිදුවන වෙනස්කම් කිහිපයකි. එනම් පවත්නා භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කෙරේ. නව නිෂ්පාදන ක්‍රම බිහි කෙරේ. භාණ්ඩ නිපදවීමේ නිෂ්පාදන පිරිවැය අඩු කෙරේ. නව කළමනාකරණ ක්‍රම බිහි වේ. මෙම දැනුම වර්ධනය තුළින් මානව ප්‍රාග්ධනයේ ඵලදායීතාවය වැඩි වේ. මෙහි දී, පුහුණුලාභියා සතු දැනුම, කුසලතා, හැකියාව, පුහුණුව, පළපුරුද්ද යන මේ සියල්ල මානව ප්‍රාග්ධනය වැඩිවීමට ඉවහල් වේ.

කිසියම් කර්මාන්තකරුවකු කර්මාන්තයක් ආරම්භ කිරීමට ප්‍රථම කළමනාකරණය පිළිබඳ කිසියම් දැනුමක්, පුහුණුවක් ලබා සිටියේ නම්, එය නිෂ්පාදන කටයුත්තේ සමස්ත කාර්යක්ෂමතාවය නැංවීම කෙරෙහි බලපෑමක් ඇති කරයි. එය නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට, අලෙවිය ඉහළ නංවා ගැනීමට හා තරඟකාරී තත්ත්වයකින් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට ඉවහල් වේ. සහල් සැකසුම් කර්මාන්තය ආරම්භයට පෙර, කර්මාන්තකරුවන් ලබා ඇති පුහුණුවීම් පිළිබඳ දත්ත ලබා ගත් අතර ඒ පිළිබඳ විස්තර වගු අංක 4.3 මඟින් දක්වා ඇත.

**වගු අංක 4.3: සහල් සැකසුම් කර්මාන්තය ආරම්භයට පෙර කර්මාන්තකරුවන් ලබා ඇති පුහුණුවීම්**

| ලබා ඇති පුහුණුව | සමස්ථ නියැදිය සහල් සැකසුමට පිටුවහලක් වී ද? N=369 | |
|---|---|---|
| ගිණුම් කටයුතු | 40 | 11% |
| ගබඩාකරණය | 196 | 53% |
| අලෙවිකරණය | 170 | 46% |
| සුළු ව්‍යවසාය සංවර්ධනය | 132 | 36% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012


*(★ ගොවීන් සංඛ්‍යාව මත ප්‍රතිශත ගණනය කර ඇති නිසා ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ)*

තමන් පෙර ලබාගත් පුහුණුව සහල් සැකසුමට පිටුවහලක් වී ඇති බව අධ්‍යයන දත්තවලින් හඳුනා ගැනීමට හැකි විය. අලෙවිකරණය(48%), සුළු ව්‍යවසාය සංවර්ධනය(36%) හා ගබඩාකරණය(53%) යන පුහුණු තුළින් සමස්ථ නියැදියේ (46%) ප්‍රතිශතයක් මෙම කර්මාන්තයේ දියුණුවට යොදා ගෙන තිබේ.

සහල් සැකසුම පිළිබඳ පුහුණුව ලබා දීමේ දී, වී දියට දැමීමේ සිට අවසාන අලෙවිය දක්වා වූ සියලුම කාර්යයන් පිළිබඳ අවශ්‍ය තාක්ෂණ දැනුම මේ කර්මාන්තකරුවන්ට ලබා දී ඇත. එම පුහුණුව තුළින් ගබඩාකරණය, අලෙවිකරණය පිළිබඳ දැනුම ලබා දී පැවති අතර එය සහල් සැකසුම් පුහුණුවට අමතරව ය.

සහල් සැකසුම් වැඩසටහන ග්‍රාමීය ප්‍රජාව අතරට ගෙන යාමේ ක්‍රමවේදය වෙනුවෙන් කුමන ආයතනයකින් සම්බන්ධීකරණ සහාය ලබා දුන්න ද පුහුණුව ලබාදීමේ ප්‍රමුඛ මෙහෙවර සිදු කරනු ලැබ ඇත්තේ පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟිනි. එක් දිනක් හෝ දින කිහිපයක් යොදා ගනිමින් ලබා දී ඇති මෙම පුහුණුව ඉතා සාර්ථක පුහුණුවක් වී ඇත. අධ්‍යයනයට ලක් කරන ලද පිරිසෙන් වැඩිදෙනා තවදුරටත් පුහුණුවක් බලාපොරොත්තු නොවීමත්, පෙර පුහුණුව ලැබූ අයගෙන් සහල් සැකසුමට පුහුණු වූ පිරිස හඳුනා ගත හැකිවීමත් මඟින් ඒ බව පැහැදිළි වෙයි. ලබාදුන් පුහුණුව මෙම කාර්යය වඩාත් සාර්ථක කරලීමට එලදයී බව සමස්ථ නියැදියේ 95% ගොවීන්ගේ මතය විය. මෙය දිස්ත්‍රික් වශයෙන් සැලකීමේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ 99%ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 95%ක්, පොළොන්නරු දිස්ත්‍රික්කයේ 93%ක් හා පුත්තලම දිස්ත්‍රික්කයේ 99%ක් ලෙස (ප්‍රස්ථාර අංක 4.1) විය.

ප්‍රස්ථාර අංක 4.1: ලබාදුන් පුහුණුව ඵලදායීතාවය





මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

මෙම පුහුණුව ලබා දීම ආකාර කිහිපයකින් සිදු කොට තිබුණි. ආරම්භක අවස්ථාවේ පුහුණුලාභීන් සියල්ල එක් ස්ථානයකට කැඳවා ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම ලබා දී ඇත. සහල් සකස් කිරීමේ පුහුණුව ලබාදීමේ දී බොහෝ ප්‍රදේශවල එක් දිනක් තුළ දී සහල් සැකසුමට අයත් සියලු කාර්යයන් (වී පෙඟවීම, තැම්බීම, වේලීම, ලිප සකස් කර ගැනීම ආදියත්) සඳහා පුහුණුව ලබා දී තිබුණි. සාමාන්‍යයෙන් එක් කණ්ඩායමකට 20-25කට අධික පිරිසක් පුහුණුව සඳහා සහභාගී වී ඇත.

ගම්මානයක ප්‍රායෝගිකව සිදු කිරීමේ දී බහුතර ගම්වාසීන් පිරිසක් එය නිරීක්ෂණය කිරීමට පැමිණීම සාමාන්‍ය දෙයකි. අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන පිරිස අඩු වුව ද, ගුණාත්මක තත්ත්වය සහල් නිෂ්පාදනය සඳහා ඒ පිළිබඳ දැනුවත් වී ඇති පිරිස ගම්මාන තුළ වැඩිවීමක් දක්නට තිබුණි. පසු අස්වනු තාක්ෂණ ආයතනය මෙම පුහුණු ලබාදුන් පසු කෙසේ පසු විපරම සිදුවී ද යන්න පිළිබඳ දත්ත ලබා ගන්නා ලදී.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

**ප්‍රස්ථාර අංක 4.2: පසු අස්වනු තාක්ෂණ ආයතනය සහ සහල් සැකසුම් ගම්මාන සම්බන්ධතාවය**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

ප්‍රස්ථාර අංක 4.2 තුළින් පැහැදිළි වන්නේ ආරම්භක අවස්ථාවේ පසු අස්වනු තාක්ෂණ ආයතන පුහුණුව සඳහා විශේෂ කැපවීමක් සිදු කර ඇති බවයි. ඉන් මාස කීපයකට පසු, ඒ ඒ හඳුන්වා දුන් ආයතනවල ඉල්ලීම මත, එම සහල් ගම්මානවල අධීක්ෂණ කටයුතු සිදු කොට තිබේ. ආරම්භ කොට වසර කිහිපයකට පසු මෙම ආයතනය කාර්ෂයෙන් බැහැරවීමේ තත්ත්වයක් දත්ත මඟින් පෙන්නුම් කරයි. මේ අනුව පැහැදිළි වන්නේ පසු අස්වනු තාක්ෂණ ආයතනය පුහුණුව ලබා දුන් පසු, පසු විපරමක් සිදු නො කළ බවයි.

මෙම පුහුණුව සමස්ථයක් ලෙස ගත්විට ඵලදායීතාවයෙන් ඉහළ ය. ඊට හේතුව කිසිම සාමාජිකයෙකු නැවත එම පුහුණුව ලබා දිය යුතු බව නො පැවසීම ය. දැනට ද සාර්ථකව මෙම සහල් සැකසුම් සිදු කරන සාමාජික ජනතාව ඉල්ලා සිටියේ තමාට ලබාදුන් පුහුණුවට වඩා නවීන ක්‍රමයක් පවතී නම්, එය ලබා දෙන ලෙසයි. වැඩිදුරටත් පුහුණු වැඩසටහන් අවශ්‍ය බව පැවසුවන්ගෙන් සහල්, පිටි කර ගැනීමේ තාක්ෂණය පිළිබඳ හඳුනා ගැනීමට ය. තව ද, සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීම පිණිස බොල් වී තැම්බීම පිළිබඳ දැනුම ලබාදීම අවශ්‍ය බව ගොවි සාකච්ඡාවල දී අදහස් ප්‍රකාශ විය. දර වෙනුවට දහයියා යොදා වී තැම්බීමේ තාක්ෂණයක් හඳුන්වා දෙන්නේ නම් දර වියදම අඩු කර ගැනීමට හැකි බව සමස්ථ නියැදියේ 41%ක ප්‍රතිශතයක් ප්‍රකාශ කරන ලදී.

පසු අස්වනු තාක්ෂණ ආයතනය පුහුණුව ලබා දුන් පසු ඒ සම්බන්ධ විපරම හා ඉන් ඉදිරි කටයුතුවලට සහයෝගය ලබා දිය යුත්තේ මෙම වැඩසටහන හඳුන්වා දුන් අදාළ ආයතනය බව ගොවී හු වැඩි දුරටත් කරුණු දැක්වූහ.

අරමුණු 3:

## 4.3 ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා පිළිබඳ ඇගයීම

ආයතනික සබඳතා ඉතා හොඳ මට්ටමක පැවතීම සහල් කර්මාන්තය වඩාත් සාර්ථක මට්ටමකට ගෙන ඒමට හේතු වෙයි. විශේෂයෙන් ම, පුහුණුව ලබාදීම සහ ඉන් අනතුරුව සහල් වෙළෙඳපොළක් කරා ගෙන යාම දක්වාම ආයතනයන්ගේ මැදිහත්වීම අවශ්‍ය වෙයි. සහල් සැකසීමේ ගම්මාන වැඩසටහන පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියක් වුව ද, මේ හා සම්බන්ධ වී බොහෝ රාජ්‍ය ආයතන ජනතාව අතරට මෙම පුහුණුව රැගෙන යාමට කටයුතු කරනු ලැබී ය.

නව තාක්ෂණික ක්‍රමවේදය ගොවීන් අතරට ගෙන යාම සඳහා ආයතන මැදිහත්වීමේ දී ද එහි සාර්ථක අසාර්ථක බව කෙරෙහි යම් බලපෑමක් සිදු වී ඇති බව පැහැදිලි වන කරුණකි. සහල් සැකසුම් ගම්මාන කෙරෙහි ආයතනවල සබඳතා පවත්වා ගෙන ගොස් ඇති ආකාරය පිළිබඳ සලකා බලන විට බොහෝ සහල් සැකසුම් ගම්මාන කෙරෙහි සම්බන්ධීකරණ ආයතන මගින් පසු විපරමක් සිදු කර නො තිබූ අවස්ථා විය.

**වගු අංක 4.4: සහල් සැකසුම් කාර්යය සඳහා ආයතනික සේවා සැපයුම**

| ආයතනය | ආරම්භක අවස්ථාවේ ප්‍රතිචාර සංඛ්‍යාව | වර්තමානයේ ප්‍රතිචාර සංඛ්‍යාව | අඩු වූ ප්‍රතිශත(%) |
|---|---|---|---|
| පසු අස්වනු තාක්ෂණ ආයතනය | 329 | 16 | 95.1 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 118 | 27 | 77.1 |
| ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | 44 | 10 | 77.3 |
| මහවැලි අධිකාරිය | 64 | 11 | 46.9 |
| සමෘද්ධි අධිකාරිය | 94 | 35 | 62.7 |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 41 | 1 | 97.9 |
| ප්‍රාදේශීය සභාව | 7 | - | 100 |
| ගොවි සංවිධාන | 30 | 20 | 33.3 |
| රාජ්‍ය නොවන ආයතන | 124 | 48 | 61.3 |
| කුඩා ව්‍යාපාර සංවර්ධන ආයතනය | 6 | 1 | 83.3 |
| සමස්ථ අඩුවීම | 985 | 239 | 75.7 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

වැඩසටහන් ආරම්භයේ දී මෙවැනි ආයතන, ව්‍යාපෘතිය හා සම්බන්ධ වුව ද වර්තමානයේ දී මෙම ආයතනික සම්බන්ධතා තරමක් දුරට ඉවත්වීමක් හඳුනාගත හැකි විය. මෙම සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ආරම්භයේ දී සෑම රාජ්‍ය ආයතනයක් මෙන් ම මුල් අවස්ථාවට සහභාගී වී තිබේ. උත්සවාකාරයෙන් ආරම්භ කෙරුණ ද අවසානයේ සංවිධානය කළ ආයතනය පවා

සම්බන්ධ වීම ඉතා දුර්වල තත්ත්වයේ විය. එක් එක් ආයතන විසින් ආරම්භය හා වර්තමානයේ සහයෝගය ලබාදීම වගු අංක 4.4 මගින් පැහැදිලි කර ඇත.

පසු අස්වනු තාක්ෂණ ආයතනය ආරම්භක අවස්ථාවේ සහල් සැකසුමට විශේෂ මෙහෙයක් සිදු කළ බව නියැදියේ 329 දෙනෙකු අදහස් දක්වූ අතර වර්තමානය වන විට එලෙස සේවයක් ලබා දෙන බව සඳහන් කළේ නියැදියේ 16 දෙනෙකු පමණි. එනම්, වර්තමානයේ සේවය ලබාදීම 95%කින් අඩුවීමකි. එලෙසම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සබඳතාවය අඩුවීම 98%කි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වර්තමානයේ සම්බන්ධවීම 77%කින් අඩු වී ඇති අතර එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 78%කි. ගොවි ප්‍රතිචාර අනුව ආරම්භක අවස්ථාවේ සිට වර්තමානය දක්වා වන විට සහභාගි වූ ආයතනවල සේවා සැපයුම 76%කින් අඩු වී පවතී. ආයතන කිහිපයක් පමණක් කර්මාන්තකරුවන් ඉදිරියට ගෙන යාමට මුල් වී කටයුතු කරන බව දත්තවලින් පැහැදිලි වන අතර ගොවි සාකච්ඡාවල දී ද ඒ බව තහවුරු විය.

සමෘද්ධි අධිකාරිය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව ගම් මට්ටමෙන් කටයුතු කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නියැලීම නිසා ඒ ආයතන තුළින් වැඩි සොයා බැලීමක් සිදු වී ඇත. ඒ අතර ගොවි සංවිධාන ගම්මාන තුළම ක්‍රියාත්මක වීම හේතුවෙන් මෙම කටයුතු පිළිබඳ වැඩි පසු විපරමක් කළ හැකි වී තිබේ. රජරට සංවර්ධන බැංකුව, සමෘද්ධි බැංකුව වැනි රාජ්‍ය බැංකු ආරම්භයේ දී ණය ලබා ගැනීමට සහයෝගය ලබා දී තිබුණි. මෙහි දී, සහල් සැකසුම් කර්මාන්තය සඳහා වගකිවයුතු එක් ආයතනයක් හඳුනාගත නො හැකි අතර ආයතන සහයෝගයෙන් කටයුතු කිරීමක් ද නො පවතී. සහල් සැකසුම් කර්මාන්තයට අනිවාර්යයෙන් ම සම්බන්ධ විය යුතු රාජ්‍ය ආයතනයක් ලෙස වෙළෙඳ සහ පාරිභෝගික අමාත්‍යාංශය හඳුනාගත හැකි වුවත් එම ආයතනය කිසිදු අවස්ථාවක මැදිහත්වීමක් දක්වා නැත. වෙළෙඳ සහ පාරිභෝගික අමාත්‍යාංශයේ මැදිහත්වීම අවශ්‍ය වන්නේ වෙළෙඳපොළ හඳුන්වාදීමක් වෙනුවෙනි. වී අලෙවි කරමින් සිටි ගොවියාට ඉන් මිදී එක් වරම සහල් වෙළෙඳපොළක් සොයා ගැනීමට තරම් හැකියාවක් නො පවතී. එසේ වුව ද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද කිසිම ආයතනයක් මෙම වගකීම බාර ගෙන නැත. මෙම ව්‍යාපෘතිය ගොවීන්ට හඳුන්වා දී, ඉතා සුළු කාල සීමාවක් තුළ හඳුන්වා දුන් ආයතන කර්මාන්තකරුවන් හැර දමා ගොස් තිබුණි.

මේ හේතුවෙන් ගොවීන්ට තම ගැටලු ඉදිරිපත් කිරීමට හෝ විසඳුම් ලබා ගැනීමට අවස්ථාව ලැබී නො තිබුණි. මේ නිසා, කර්මාන්තයේ නියැලෙන අතරතුර දී ඔවුන්ට විසඳුම් සපයා ගැනීමට නො හැකි ගැටලුවක් පැන නැඟුනහොත් කර්මාන්තය මුලුමනින් ම නතර කර දැමීමට ගොවියාට සිදු වී ඇත. සාර්ථකභාවයට පත් වූ බොහෝ සහල් සැකසුම් ගම්මාන සම්බන්ධීකරණය කරන ලද ආයතන, කර්මාන්තකරුවන් සමඟ නිරන්තර සම්බන්ධතා පවත්වමින් පසු විපරම් කරන ලද ආයතන විය.

එහි දී සමෘද්ධි සමිති මඟින් අනුග්‍රහය දක් වූ කර්මාන්තකරුවන්ට සමෘද්ධි සංවර්ධන නිලධාරී විසින් දිගින් දිගටම පසු විපරම් කරමින් ඇතැම් අවස්ථාවන්වල දී වෙළෙඳපොළ සපයාදීමක් (තිශ්ශංකමල්ල පෙදෙස) හඳුනාගත හැකි විය. මෙයට අමතරව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මඟින් මූලික මැදිහත්වීම් ලබා දුන් ගම්මානවල ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී ද වැඩසටහන විපරම් කරමින් සහාය ලබා දී තිබුණි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහල් සැකසුම්කරුවන්ට මූලික පුහුණුව ලබා දීමෙන් පසුව, ආයතනික සබඳතා පැවැත්වීම ඒ තරම් යහපත් මට්ටමක නො පැවතුනි. කඩවලගෙදර සහල් සැකසුම් ගම්මානය තුළ කෘෂිකර්ම උපදේශකගේ අධීක්ෂණයට ලක්වීමත්, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 'වර්ල්ඩ් විෂන්' ආයතනයේ සජීවිකාරකගේ අධීක්ෂණයත් හැරුණු විට වෙනත් කිසිදු ආයතනයක් හෝ නිලධාරියෙක් මොවුන් සමඟ ආයතනික වශයෙන් සබඳතා පවත්වා නැත. වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන සහ සහල් එකතු කරන මධ්‍යස්ථාන ඇති කිරීම ආදී කටයුතු රජයේ මැදිහත්වීම මඟින් සිදු කරන්නේ නම් මොවුන්ගේ වෙළෙඳපොළ ගැටලුවලට විසඳුමක් වන බව ද, සුපිරි වෙළෙඳසැල් සඳහා යොමු කරවන්නේ නම් උසස් තත්ත්වයේ සහල් තමනට ලබා දිය හැකි බව ද ගොවි සාකච්ඡාවල දී අනාවරණය විය. මේ සුපිරි වෙළෙඳ ආයතන සමඟ සාකච්ඡා කළ ද, ඒ ආයතන ගොවීන් පිළිනොගත්තා බවට ද, කරුණු දක්විය. රාජ්‍ය නිලධාරියකු හෝ මෙසේ වගකිවයුතු පුද්ගලයන් මේ ආයතන සමඟ සාකච්ඡා කර තීරණ ගත යුතු ය. සහල් කර්මාන්තකරුවන් වැඩි දෙනෙකු සහල් සකසා තම පරිභෝජනයට පමණක් යොදා ගන්නා අතර සුළු පිරිසක් අලෙවිය සඳහා සහල් සකසයි. මෙයට ප්‍රධාන හේතුව අලෙවියට නිශ්චිත වෙළෙඳපළක් හෝ මෙම පිරිස සකසන සහල් එකතු කරන මධ්‍යස්ථාන හෝ නොමැතිකමයි.

පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ සමස්ථයක් ලෙස බලන කල් හි ආයතනික සබඳතාවය යම් ප්‍රමාණයකට ලැබී තිබූ බව තහවුරු විය. ඔවුන් පවසන්නේ මේ වන විට ද යහපත් ආයතනික සබඳතාවක් පැවතියේ නම් සහල් සැකසුම පවතින තත්ත්වයට වඩා සාර්ථකව සිදු කිරීම සඳහා මෙයට වඩා ගම්වැසියන් දිරිමත් වන බවයි. ආයතනික සබඳතාවන් දුරස්වනවා යනු, ගම්වැසියන්ගේ උනන්දුව ද එයින් මඟ හැරී යන්නක් බවට පත්වන බව ඔවුහු අදහස් කරති.

### 4.3.1 ණය ලබාදුන් ආයතනවල සබඳතාව

මෙම සහල් සැකසුම්කරුවන් ණය ලබා ගැනීමේ දී විවිධ බැංකු ඒ සඳහා භාවිතා කොට තිබුණි. සහල් සැකසුම් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට ණය ලබාදුන් ආයතනවල සබඳතාව කෙබඳු ද? යන්න විමසුමට ලක් කරන ලදී. මෙහි දී, බැංකු ආයතන වශයෙන් රජරට සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සමෘද්ධි බැංකුව ආදී රාජ්‍ය බැංකු සහ රාජ්‍ය නොවන බැංකු, සමිති සමාගම් සහ රාජ්‍ය නොවන ආයතන මේ ණය ලබා දීමේ දී සහයෝගය ලබා දී තිබුණි. බැංකු ආයතනවලින් ලබා දෙන ණය පොලී රහිත හෝ සහනදායී පොලියක් යටතේ ලබාගැනීම ව්‍යාපෘතිලාභීන්ගේ කැමැත්ත බව සාකච්ඡාවල දී පැහැදිළි විය.

ගොවීන් ණය ලබා ගැනීමේ දී සහල් සැකසුමට, ගොවිතැන් කටයුතු සඳහා සහ නිවාස ණය වශයෙන් ලබා ගෙන තිබුණි. සහල් සකස් කරන්නේ පරිභෝජන කාර්යයන් සඳහා වුව ද එම කාර්යය සඳහන් කොට ණය ලබා ගත් කුටුම්භ සාමාජිකත්වය දත්ත ලබා ගැනීමේ දී හමු විය. ඒ ඒ විවිධ අවශ්‍යතා සඳහා ණය ලබා ගැනීම් වගු අංක 4.5 මඟින් දක්වා ඇත.

**වගු අංක 4.5: ණය ලබා ගැනීම්**

| ණය අවශ්‍යතාව | පුත්තලම N=9 | | අනුරාධපුර N=184 | | පොළොන්නරුව N=81 | | කුරුණෑගල N=95 | | මුළු සංඛ්‍යාව N=369 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සහල් සැකසුමට | 7 | 77.8 | 81 | 44.0 | 46 | 56.8 | 45 | 47.4 | 179 | 48.5 |
| ගොවිතැන් කටයුතු සඳහා | 1 | 11.1 | 15 | 8.2 | 26 | 32.1 | 19 | 20.0 | 61 | 16.5 |
| නිවාස ණය | 3 | 33.3 | 18 | 9.8 | 10 | 12.3 | 12 | 12.6 | 43 | 11.6 |
| වෙනත් | 1 | 11.1 | 4 | 2.2 | 3 | 3.7 | 6 | 6.3 | 14 | 3.8 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

*★ (මෙහි දී ප්‍රතිශත ගණනය කොට ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දක්වූ ගොවීන් සංඛ්‍යාව මත ය. එම නිසා, ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ)*

සමස්ථ නියදිය සැලකීමේ දී 49% ප්‍රතිශතයක් සහල් සැකසුම සඳහා ණය මුදල් ලබා ගෙන තිබුණි. සෑම දිස්ත්‍රික්කයක් තුළින් ම ඉහළ 44%කට වැඩි ප්‍රතිශතයක් මෙම කාර්යය සඳහා ණය ලබා ගෙන ඇත. වී ගොවිතැන සඳහා වූ ණය මුදල් ගෙවීමට බොහෝ ගොවීන් මෙම ණය මුදල යොදවා තිබුණි. එසේ කිරීම තුළ තමන්ගේ වී සහල් සැකසුමට හෝ පරිභෝජනය සඳහා යොද ගන්නා බව ගොවි සාකච්ඡා වලින් හෙළි විය. මෙම ණය ලබා ගැනීම් කෙතරම් ප්‍රමාණයක් ද යන්න පිළිබඳ දත්ත ලබා ගත් අතර ඒ පිළිබඳ වගු අංක 4.6 මඟින් දක්වා තිබේ.

**වගු අංක 4.6: සහල් සැකසුමට ණය ලබා ගත් කුටුම්භ සාමාජිකත්වය**

| ණය ප්‍රමාණය | පුත්තලම | අනුරාධපුර | කුරුණෑගල | පොළොන්නරුව | මුළු සංඛ්‍යාව (n=369) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| 10000 ට අඩු | - | 4 | 4 | 6 | 14 | 7.8 |
| 10000- 50000 අඩු | 3 | 57 | 23 | 22 | 105 | 58.7 |
| 50000- 100000 අඩු | 1 | 13 | 10 | 13 | 37 | 20.7 |
| 100000-200000 අඩු | - | 4 | 6 | 4 | 14 | 7.8 |
| 200000 ට වැඩි | - | 3 | 3 | 3 | 09 | 5.0 |
| **ණය ලබා ගත් මුළු සංඛ්‍යාව** | **4** | **81** | **49** | **48** | **179** | **100** |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

සහල් සැකසුම් කාර්යය සඳහත් කොට ණය ලබා ගත් කර්මාන්තකරුවන්ගෙන් 59%ක ප්‍රතිශතයක් රු.10000- රු.50000 අතර ප්‍රමාණයේ ණය ලබා ගෙන තිබුණි. සහල් සැකසුමේ මූලික කාර්යය වන වී වගාවේ වූ ණය ගෙවීමට හා අස්වනු නෙලූ ගමන් වී මිල දී ගැනීමට මෙම ණය ලබා ගෙන තිබුණි. සමස්ථ නියැදියේ 5%ක ප්‍රතිශතයක් ණය රුපියල් ලක්ෂ දෙකකට වඩා වැඩිපුර ගෙන තිබුණි. වී මෝල් මිල දී ගැනීම සඳහා මෙම ණය ලබා ගෙන ඇති බව දත්ත ලබා ගැනීමේ දී පැහැදිලි වූ කරුණකි.

වර්තමානය වන විට සහල් සැකසුම සඳහා සමස්ථ නියැදියේ 55%ක ප්‍රතිශතයක් ණය අවශ්‍ය බව පවසන ලදී. ණය අවශ්‍ය කාරණා ලෙස මෙම කර්මාන්තකරුවන් අදහස් රාශියක් ලබා දෙන ලදී. මෙයට හේතු පාදක වූ කරුණු වගු අංක 4.7 මඟින් දක් වේ.

**වගු අංක 4.7: තවදුරටත් ණය අවශ්‍ය කරුණු**

| ණය අවශ්‍ය කරුණු | පුත්තලම N=9 | | අනුරාධපුර N=184 | | පොළොන්නරුව N=81 | | කුරුණෑගල N=95 | | මුළු සංඛ්‍යාව N=369 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අස්වනු නෙලන කාලයට වී ගබඩා කිරීම | 4 | 44.4 | 64 | 34.8 | 48 | 59.3 | 46 | 48.4 | 162 | 43.9 |
| වී කෙටීමට මෝලක් ලබා ගැනීම | 1 | 11.1 | 10 | 5.4 | 10 | 12.3 | 06 | 6.3 | 27 | 7.3 |
| සහල් සැකසුමේ මූලික අවශ්‍යතා ඉටු කිරීම | 3 | 33.3 | 26 | 14.1 | 10 | 12.3 | 22 | 23.1 | 61 | 16.5 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

*★ (මෙහි දී ප්‍රතිශත ගණනය කොට ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දක්වූ ගොවීන් සංඛ්‍යාව මත ය. එම නිසා, ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ)*

මෙම ණය ලබා ගැනීම් ප්‍රධාන අවශ්‍යතා තුනක් මුල් කර ගෙන සිදු වී තිබුණි. අස්වනු නෙලන කාලයට වී ගබඩා කොට තබා ගැනීමට ණය අවශ්‍ය බව සමස්ථ නියැදියේ 44%ක ගේ ප්‍රතිචාරය විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මෙම අගය 59%ක් වූ අතර පුත්තලම 44%ක්, අනුරාධපුර 35%ක් හා කුරුණෑගල 48%ක් ලෙස විය. මෙයට අමතරව වී කෙටීමට මෝලක් ලබා ගැනීමට ණය මුදලක් අවශ්‍යවීම (7%) හා සහල් සැකසුමේ මූලික අවශ්‍යතා සිදු කිරීමට (17%) ණය අවශ්‍යව තිබුණි. මෙම ණය අවශ්‍යතා පිළිබඳව තවදුරටත් සවිස්තරාත්මක කරුණු සාකච්ඡා කරන ලදී.

1. විශේෂයෙන් ම, වර්තමාන කුඹුරු ගොවිතැන් කරන සහ කුඹුරු නොමැති අයට වී ප්‍රමාණවත් නොවීම නිසා අවශ්‍ය වී ලබා ගැනීමට ණය ආධාර අවශ්‍ය බව රාජාංගනය ප්‍රදේශයේ ව්‍යාපෘතිලාභීන් ගේ ප්‍රධාන ගැටලුවක් විය.

2. මහ තෙළුබැව ප්‍රදේශයට මූලිකම අවශ්‍යතාව වන්නේ ගමට නවීන තාක්ෂණ වී මෝලක් පිහිටුවා ගැනීමට ණය මුදලක් ලබා ගැනීමයි.
3. තමාගේ වී තමා ළඟම තබා ගැනීම සියළුම සහල් සැකසුම්කරුවන්ගේ බලාපොරොත්තුව වන අතර ඒ සඳහා ඔවුන්ට ණය මුදලක් අවශ්‍ය වන්නේ ගොවිතැන සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, යෙදවුම්වල ණය පියවීම සඳහා වේ.
4. පුද්ගලික මට්ටමෙන් ගත් කල් හි අනුරාධපුර යාය 14 ගම්මානයෙ හි ගුණේරිස් සිංඤෝ මහතා දීර්ඝ කාලයක් තිස්සේ තම ව්‍යාපාරය සාර්ථකව කර ගෙන යනු ලබන අතර ඔහුට වී පැහීමට අවශ්‍ය වන විට දුර බැහැරට යාමට සිදුවීම නිසා තමාගේ වී මෝලක් පිහිටුවා ගැනීමට ණයක් අවශ්‍ය වී ඇත.
5. ගමෙ හි වෙළෙඳපොළ ප්‍රමාණවත් නොවන කල් හි පිට පළාත් වලට සැකසූ සහල් අලෙවි කිරීමේ ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා ණය පහසුකම් හි අවශ්‍යතාවය පැණ නැගී ඇත.

මේ අනුව විමසන කල් හි බැංකු ආයතන මැදිහත් වී සහන පොලියට හෝ පොලී රහිත ණය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම, මෙම ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ඉවහල් වී ඇත. වී ගොවිතැන සිදු කිරීම සඳහා බිම් සැකසීම, අස්වනු නෙලීම වැනි කාර්යයන් සඳහා මෙම ගොවීන් ආරම්භක අවස්ථාවේ ගම හෝ නගරයේ වී මිල දී ගන්නා ස්ථානවලට ණය වී තිබේ. අස්වනු නෙලූ ගමන් ඉන් භාගයකට/අඩකට වැඩි කොටසක් ණය මුදල් ගෙවීම සඳහා යොදවයි. ඉතිරි ප්‍රමාණය පරිභෝජනයට හා සහල් සැකසුමට යොදා ගනී. මෙම ගොවීන්ට අස්වනු නෙලන අවස්ථාවේ ණය මුදල් ලබා දිය හැකි නම් තම අස්වනු ගබඩා කර තබා සහල් සැකසුමට යොදා ගත හැකි බව සාකච්ඡාවල දී අනාවරණය විය.

මෙම ණය මුදල අස්වනු නෙලන අවස්ථාවේ දීම කුඹුරු ඇති ගොවීන්ට හා කුඹුරු නැති ගොවීන්ට ලබා දිය යුතු ය. කුඹුරු නැති ගොවීන්ට සහල් සැකසුම ආරම්භ කිරීම සඳහා අනිවාර්යෙන් ණය මුදල් ලබා දිය යුතු ය. විශේෂයෙන්, අස්වනු නෙලන කාලයේ වී මිල අඩුවන නිසා ණය ලබාදීම එම කාලයට සිදු විය යුතු ය. වී මිල දී ගැනීමේ දී අයිතිකරුවන් වී මිටි එකක් දෙකක් අලෙවි කිරීමට එතරම් ම කැමැත්තක් නො දක්වන බව ද ගොවි සාකච්ඡාවලින් හෙළි විය. අවම වශයෙන් වී මිටි හතරක් පහක් වත් මිල දී ගැනීම සිදු කළ යුතු ය. වී මිටියක් කිලෝග්‍රෑම් 62ක් පමණ වන අතර කිලෝග්‍රෑම් එකක මිල රු.20/-ක් වුවහොත් රු.1200/-ක් පමණ වී මිටියකට අවශ්‍ය වේ. අවම වශයෙන් වී ගබඩා කිරීම සඳහා රු.25,000/-ක් පමණ ණය මුදලක් ලබාදීම අවශ්‍ය බව සඳහන් විය.

සාමාන්‍යයෙන් අස්වනු නෙලා දින 10-15ක කාලය තුළ 50% ට වැඩි ප්‍රතිශතයක අස්වනු අලෙවිය සිදු වී හමාර ය. මේ කාලය තුළ ප්‍රධාන වශයෙන් වී මිල අඩු ය. ණය ලබා ගැනීමට බැංකුවකට හෝ වෙනත් මූල්‍ය ආයතනයකට ගිය විට ණය ලැබෙන්නේ ප්‍රමාද විය. මෙම හේතු නිසා අස්වනු

කැපෙන කාලයට වී මිල දී ගැනීමේ අපහසුතාවය ගැන සෑම ප්‍රදේශයකින්ම කරුණු අනාවරණය විය. ඇපකරුවන් සොයා ගැනීමේ අවශ්‍යතාවය ද මේ සඳහා ගැටලුවක් ව පවතී.

සමෘද්ධි බැංකුව හා සංවර්ධන බැංකු මඟින් කණ්ඩායම් ක්‍රමයට හා පුද්ගලික ඇප මත ද ණය පහසුකම් ලබාදීම සිදු කොට තිබේ. එසේ වුව ද, ඉතා අඩු පොලියට හෝ පොලී රහිත ණය මුදලක් ලබා දීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත්තේ බොහෝ කර්මාන්තකරුවන් අඩු ආදායම්ලාභී පවුල්වල අයවීම නිසා ය. විශේෂයෙන් ම, ගිරිතලේ වැනි ප්‍රදේශවල කර්මාන්තකරුවන්ට ලබා දී තිබූ ණය ආධාර අතරමග නවතා දැමීම නිසා අපහසුතාවලට ලක්වීම හේතුවෙන් කර්මාන්ත අතරමග ඇන හිට ඇති බව පෙනී ගිය කරුණකි.

සහල් සැකසුම් ගම්මාන ආරම්භයේ ණය ලබා ගැනීමේ දී සමස්ථ නියැදියේ 56 දෙනෙකුට (15.2%) ගැටලු සහගත තත්ත්වවලට මුහුණ දීමට සිදු වී තිබුණි. සමෘද්ධි බැංකුව මඟින් ණය පහසුකම් ලබා දෙනු ලැබුවත්, ඒවා ලබා දෙන්නේ කණ්ඩායම් ණය ක්‍රමය මත වේ. කණ්ඩායම් ක්‍රියාකාරිත්වය අර්බුදකාරී වන විට ණය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පවතී. කණ්ඩායමේ සියළුදෙනාගේ වගකීම හා ඇපවීම මත ණය ලබා ගැනීමේ හැකියාව පැවතිය ද මෙම ක්‍රමය මඟින් ණය ලබා ගැනීමේ අපහසුතාවය වී ඇත්තේ සමහර සාමාජිකයන් ණය ගෙවීම පැහැර හැරීම, වාරික නිසි කලට නො ගෙවීම වැනි දුර්වලතා නිසා ය. පුද්ගල ණය ලබා ගැනීමේ දී ඇපකරුවන් සොයා ගැනීමේ ගැටලුව, ණය මුදල ලබා ගැනීමට රස්තියාදු වීම, නිසි වේලාවට එම මුදල ලබා ගැනීමට නො හැකිවීම වැනි තත්ත්ව නිසා ණය ලබා ගැනීමට අවශ්‍ය වුව ද කර්මාන්තරුවන් ඉන් මිදී ඊට විකල්ප ක්‍රම භාවිතා කර තිබුණි. වැඩි දෙනෙක් තම මූල්‍ය අවශ්‍යතා සපුරා ගන්නේ භාණ්ඩ උගස් කිරීමෙනි. මෙම ගැටලු සහගත තත්ත්ව වර්තමානය වන විට (44) 11.9% දක්වා අඩු වී ඇත. ආරම්භය හා වර්තමානය සැලකීමේ දී එම අඩුවීම සුළු ප්‍රතිශතයකි.

### 4.3.2 සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා සාර්ථක වී ද?

- සහල් සැකසුම් ගම්මාන වැඩසටහන හඳුන්වාදීමේ දී ආයතන සමාජ මෙහෙවරක් ඉටු කරනවාට වඩා තමන්ගේ ආයතනයේ ප්‍රසිද්ධිය වෙනුවෙන් කටයුතු කර තිබීමක් හඳුනා ගත හැකි ය. මේ නිසා නොයෙකුත් ආධාර ලබාදෙමින් අසීමාන්තික ව කර්මාන්තකරුවන් පුහුණු කොට තිබේ. අවශ්‍ය ප්‍රමාණයට වඩා ගම්මාන තුළ පුහුණුව ලැබීම නිසා අලෙවියට බාධා වී තිබේ. සියලු සහල් සැකසුම්කරුවන්ගේ ප්‍රධාන අලෙවි මාර්ගය වී ඇත්තේ ගම්මාන යයි. මෙහි අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ පුහුණුව ලබා දුන් පුද්ගලයන්ගෙන් වැඩි ප්‍රමාණයක් අතර මග නතර වීම ය.

- සහල් සැකසුම් ගම්මාන කෙරෙහි පසු අස්වනු තාක්ෂණ ආයතනය හෝ වෙනත් ආයතනයක් හෝ රජය විසින් මෙම සකස් කරන සහල් සඳහා ප්‍රචාරණයක් ලබා දී නො තිබීමක් ද හඳුනාගත හැකි ය. සහල් සැකසුම ස්ථාපිත කරන ලද ගම්මානයට පමණක් එහි දැනුවත් වීම

සීමා වී තිබේ. සහල් සැකසුම සඳහා සම්බන්ධීකරණය කරන ලද ආයතනයකවත් මෙම සහල් සැකසුම් ගම්මාන පිළිබඳ දැනුවත් කිරීමේ විස්තර පත්‍රිකාවක් පවා සොයා ගැනීම අසීරු ය. සකස් කරන සහල්වල පවතින ගුණාත්මක බව පිළිබඳ දැනුවත්වීමක් පවතී නම් ඒ ඉතා සුළු පිරිසක් සතුව පමණි.

❖ සහල් සැකසුම් ගම්මාන ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ දී ආයතන ප්‍රතිපත්තිවල අඛණ්ඩ බවක් නොමැතිවීම ද ආයතනික වශයෙන් සිදුව ඇති ප්‍රධාන ගැටලුවකි. බොහෝ විට ආයතනවල මුලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද පුද්ගලයා යම් හෙයකින් ස්ථාන මාරුවක් ලැබුවහොත් හෝ විශ්‍රාම ගියහොත් එම වැඩසටහන එතැනින් අවසන් වෙයි. මේ නිසා, ව්‍යාපෘතිය අතරමඟ නතර වේ. එබැවින්, කර්මාන්තකරුවන්ට ආයතනය මඟින් ලැබිය යුතු සහයෝගය නො ලැබී ඇත. උදාහරණ ලෙස, යාය 08 කර්මාන්තකරුවන්ට ඉෆාඩ් (IFAD) නැමති ආයතනය මඟින් එකවර විශාල ලෙස සහල් නිපදවා අලෙවිකර දීමට පොරොන්දු වී ඇත. එසේ වුවත්, අලෙවියට එම ආයතනය ඉදිරිපත් නොවී ආයතන නිලධාරීන් මාරු වී ඇත. මෙම තත්ත්වය මත ඔවුන් සහල් සැකසුම අතරමග නතර කොට තිබුණි.

## අරමුණු 4:

### 4.4 සහල් සැකසුම්කරුවන්ගේ ආදායම් හා වියදම් නිමාණය කිරීම

#### 4.4.1 ආරම්භයේ හා වර්තමාන කාල පරිච්ඡේද කර්මාන්තකරුවන් විසින් සකසන ලද සහල් වර්ග

මෙම කර්මාන්තකරුවන් විසින් ප්‍රධාන වශයෙන් සහල් සැකසුමට භාජනය කරන වී වර්ග ලෙස නාඩු, සම්බා, රතු කැකුළු, සුවඳැල්, කිරි සම්බා සහ සුදු කැකුළු හැඳින්විය හැකි ය. සහල් සැකසුම ආරම්භය හා වර්තමානය ලෙස කාල පරිච්ඡේද දෙකක් යටතේ සැකසුමට භාජනය කරන ලද සහල් වර්ග මොනවා ද යන්න විමසුමට ලක් කරන ලදී.

වගු අංක 4.8: සැකසූ සහල් වර්ග

| සහල් වර්ග | ආරම්භය N=369 | | වර්තමානය N=323 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| නාඩු | 340 | 92.1 | 315 | 97.5 |
| සම්බා | 152 | 41.2 | 89 | 27.6 |
| රතු කැකුළු | 08 | 2.2 | 08 | 2.7 |
| සුවඳැල් | 01 | 0.3 | 04 | 3.3 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

★ ප්‍රතිචාර මත ප්‍රතිශත ගණනය කොට ඇති නිසා ප්‍රතිශත අගයන් 100කට සමාන නොවේ.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.,ප.පු.ආ
HARTI

මේ අනුව පැහැදිළි වන්නේ 90%කට වැඩි පිරිසක් ආරම්භයේ මෙන් ම වර්තමානයේ ද නාඩු සහල් නිෂ්පාදනය සඳහා පෙළඹී ඇති බව ය. මේ සඳහා හේතු රාශියක් ගොවි සාකච්ඡා වලින් පැහැදිළි විය.

- තමන් විසින් නාඩු වී වර්ගය වගා කරන නිසා එම වර්ගයට යොමු වීම
- පාරිභෝගික වැඩි ඉල්ලුම පවතින්නේ එම සහල් වර්ගයට වීම
- ප්‍රදේශය තුළ ද බහුල වශයෙන් වගා කරන වී වර්ගය වීම
- නාඩු වී වර්ගය සොයා ගැනීමට ඇති පහසුව මෙන් ම අඩු මිලකට ලබාගත හැකිවීම
- වැඩි ලාභ ප්‍රතිශතයක් නාඩු සහල් සැකසීම තුළින් ලබා ගැනීමට හැකිවීම
- නාඩු සහල් පෝෂණ ගුණයෙන් ඉහළ බව පාරිභෝගික අදහස වීම

මෙවැනි තත්ත්වයන් නිසා බහුතරය සැකසුම්කරුවෝ නාඩු සහල්වලට පෙළඹී සිටිති. සම්බා සහල් සැකසූ නියදි ප්‍රතිශතය සැලකීමේ දී ආරම්භයේ 41% සිට වර්තමානයේ 27% දක්වා ප්‍රතිශතයකින් අඩු වී තිබේ. මෙයට හේතු ලෙස සඳහන් වූයේ සම්බා සහල්වලට පවතින ඉල්ලුම අනුව නිෂ්පාදනය සිදු කරන බව ය. සහල් සැකසුම ආරම්භයේ හා වර්තමානය ලෙස කාල පරිච්ඡේද දෙකක් යටතේ සැකසුමට භාජනය කරන ලද සහල් වර්ගවල වෙනසක් සිදු වී නැති අතර පවතින ඉල්ලුම අනුව ඒ ඒ වි වර්ගවලින් සහල් සැකසීම සඳහා ගොවීහු යොමු වී සිටිති.

### 4.4.2 සහල් සැකසුම් ගම්මාන ආරම්භ කළ පසු පවතින වී මෝල් නවීකරණය වූයේ ද?

අධ්‍යයනයට ලක් කළ ගම්මානවල විවිධ වූ සහල් මෝල් වර්ග විය. සහල් සැකසුම් ගම්මාන ආරම්භ කළ පසු පවතින වී මෝල් නවීකරණය වූයේ ද යන ගැටළුව අධ්‍යයනයේ දී මතු විය. සමස්ථ නියැදියේ 26%ක් ගොවි මතය වූයේ සහල් ගම්මාන ආරම්භ කළ පසු මෙම නවීකරණය වූ වී මෝල් ඇති වූ බවයි. ගල් වැලි ඉවත් කරන ලද සහල් වෙළෙඳපොළ තුළට පැමිණීමත් සමඟ එසේ නො කරන ලද සහල් අලෙවිය සිදු කරන වී මෝල් හිමියන්ට ගැටලු ඇති විය. ඒ නිසා සීඝ්‍රයෙන් නවීකරණය කරන ලද මෝල් සඳහා යොමුවීමක් සිදු වී තිබේ. ආරම්භයේ සහ වර්තමානයේ සහල් සැකසුම් ගම්මාන වල පැවති වී මෝල් කිනම් වර්ග ද යන්න දත්ත ලබා ගන්නා ලදී (වගු අංක 4.9).

වගු අංක 4.9: සහල් සැකසුම් ගම්මාන තුළ සාම්ප්‍රදායික වී මෝල් සහ නවීකරණය කරන ලද වී මෝල්

| දිස්ත්‍රික්කය | සාම්ප්‍රදායික වී මෝල් | | රබර් රෝල හා පොලිෂරය | | රබර් රෝල, පොලිෂරය ගල් වැලි ඉවත්වීම | |
|---|---|---|---|---|---|---|
| | ආරම්භය | වර්තමානය | ආරම්භය | වර්තමානය | ආරම්භය | වර්තමානය |
| පුත්තලම | 06 | 02 | 02 | 04 | 01 | 07 |
| අනුරාධපුරය | 34 | 15 | 40 | 42 | 61 | 88 |
| කුරුණෑගල | 45 | 21 | 17 | 19 | 25 | 35 |
| පොළොන්නරුව | 12 | 03 | 15 | 16 | 20 | 31 |
| මුළු එකතුව | 97 | 41 | 74 | 81 | 107 | 161 |
| | → | 57% | → | 5% | → | 50.5% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

සමස්ථ නියැදිය සැලකුවිට සාම්ප්‍රදායික වී මෝල් ප්‍රමාණය, ආරම්භයේ සිට වර්තමානය දක්වා සැලකීමේ දී 57%ක් අඩු වී තිබේ. එසේ වුව ද, රබර් රෝල, පොලිෂරය හා ගල් වැලි ඉවත් කරන වී මෝල් ප්‍රමාණය 51%ක් වැඩි වී ඇත. වී මෝල් ප්‍රමාණය වැඩි වුව ද තමනට එයින් සහනයක් නොවූ බව ගොවි සාකච්ඡාවල දී අනාවරණය විය. මෙයට හේතු වශයෙන් සඳහන් වූයේ අවශ්‍ය වෙලාවට වී පැහීම සිදු කර නොදීම, වැඩි මිලක් අය කිරීම වැනි කරුණු ය.

තව ද, වෙලෙඳපොළ තුළ පාරිභෝගික වැඩි ඉල්ලුම ගල් වැලි ඉවත් කළ සහල්වලට ය. නවීන තාක්ෂණ වී මෝල් නොමැති ගම්මානවල වී කෙටීමේ දී මෙම කර්මාන්තකරුවන් ගැටලු රාශියකට මුහුණ දී තිබුණි. සහල් සැකසුම් කර්මාන්තය සඳහා අවශ්‍යම අංගය වන්නේ වී මෝලයි. නවීන තාක්ෂණයෙන් යුතු වී මෝලක් පැවතීම තුළින් උසස් තත්ත්වයේ නිෂ්පාදන වෙලෙඳපොළට යැවීමට හැකිව තිබේ. සහල් සැකසුම ආරම්භයේ සමස්ථ නියැදියේ 119 දෙනෙකුට (32%) මෙම වී මෝල් පිළිබඳ ගැටලුව පැවතුනි. මෙම හඳුනාගත් ප්‍රධාන ගැටලු අතර

- නවීකරණය වූ වී මෝලක් ගම්මානය තුළ නොමැතිවීම
- රජයෙන් ලබා දී ඇති වී මෝල් පෞද්ගලික අයිතියට නතු කර ගැනීම
- වී කෙටීමට දුර බැහැරට යාමට සිදුවීම
- වී කෙටීමේ දී වැඩි මිලක් ගෙවීමට සිදුවීම
- වී කෙටීමේ ප්‍රවාහනයට වැඩි මිලක් ගෙවීමට සිදුවීම
- වී මෝලක් ස්ථාපනය කිරීමට විදුලිය නොමැතිවීම

වර්තමානයේ මෙම ගැටලු 28% දක්වා ඉතාම සුළු ප්‍රමාණයකින්, එනම් 4% කින් අඩු වී තිබේ. ඉහත ගැටලු සහල් සැකසුම් ගම්මාන පිහිටුවා වසර 7ක් ගත වුව ද ඉතා සුළු ප්‍රමාණයකින් පමණක් විසඳී ඇත. මෙවැනි තත්ත්වයක් යටතේ සාර්ථකව සහල් සැකසුම කර ගෙන යාමේ ගැටලු ඇති වී තිබේ. නවීකරණය වූ වී මෝලක් නොමැතිවීම නිසා ගල් වැලි ඉවත් කිරීමට නො හැකි වන අතර පොලිෂ් කිරීමට ද නො හැකි වේ. වෙලෙඳපොළේ පවතින වෙනත් සහල් වර්ග ගල් වැලි ඉවත් කර තිබීම, මෙම සහල් ඉල්ලුම අඩාල වීමට හේතු වී ඇත. කිනම් ආකාරයේ ගැටලු පැවතිය ද කර්මාන්තකරුවන් තම වී සහල් බවට පත් කර ගත යුතු ය. කිනම් මෝලකින් වුව ද කුලියට වී කෙටීමේ දී සහල් කළවම් වීම සිදු වේ. ගැණුම්කරුවන් සහල් පරීක්ෂා කිරීමේ දී මෙවැනි කළවම් සහල් ඇත්නම් ප්‍රතික්ෂේප කිරීම අනිවාර්ය වේ. තව ද, පිටස්තර වී මෝලකින් ඒ අවස්ථාවේම වී කොටාගෙන ඒමට නොහැකි නම්, මෝලේ දමා ඒමත් සිදු වේ. එවිට මෝල් හිමිකරු වී කොටා රස්නය පිටම බෑගයකට දැමීම නිසා ද ගුණත්වය අඩුවන බව තාක්ෂණ මතයයි. තමාගේ ම වී මෝලක් පවතින්නේ නම් මේ සියලු ගැටළුකාරී තත්ත්ව මග හැරී යන බව ගොවි සාකච්ඡා වල දී හෙළි විය.

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් පසු පැවති සාම්ප්‍රදායික වී මෝල් අලුත්වැඩියා වී තිබෙන අතර නව මෝල් දියුණු තාක්ෂණයක් සහිත ඉදිකර තිබෙනු ගම්මාන කිහිපයකින් දැකිය හැකි විය. එසේ වුව ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහල් සැකසුම් ගම්මාන ආශ්‍රිතව පැවති

වී මෝල් සම්බන්ධ තත්ත්වය ද එතරම් යහපත් නොවේ. ආයුවන්දම, කඩවල ගෙදර, සිංහාරගම ආදී සහල් සැකසුම් ගම්මානවල පවතින්නේ රබර් රෝල සහිත වී මෝල් පමණි. ගල් වැලි ඉවත් කිරීමක් සිදු කළ නො හැකි ය. මේ නිසා, ඔවුන්ට සහල් අලෙවි කිරීමේ අවස්ථා ද අහිමි වී ඇත. මෙයට අමතරව පැරකුම්පුර, ඉබ්බාගමුව, සඳගල, කුඩාගල්ගමුව, කඩවල ගෙදර යන ගම්මානයන් තුළ මේ වන විටත් නවීන වී මෝලක් දක්නට නොමැත. ඔවුන් තවමත් වී කොටනු ලබන්නේ නො දියුණු තත්ත්වයේ වී මෝල් වලිනි. එබැවින්, එම මෝල්වලින් කොටන ලද සහල් පිළිබඳ ප්‍රමිතියක් දිය නො හැකිය. එබැවින්, අලෙවි කර ගැනීමේ දී ගැටලු මතු වී තිබේ. ඇතැම් අයට ඉතා දුර බැහැරට වී කෙටීමට ගෙන යාමට සිදුව ඇත. එවිට, ප්‍රවාහනය සඳහා වැය වන මුදල ද දරාගත නො හැකි වී තිබේ. වී කෙටීම සඳහා යන මුදල ද ගම තුළින් කොටනවාට වඩා වැඩි බව ඔවුන්ගේ අදහස විය. නවීන තාක්ෂණයෙන් යුත් මෝල්වල වී කෙටීම සඳහා නගරයේ මෝල්වලට ගෙන යාමට දරන වියදම වැඩිවීමෙන් සහල් කිලෝග්‍රෑම් එකකින් ලබා ගත හැකි ලාභය අඩු වී ඇත. මේ නිසාම, මෙම ප්‍රදේශවල සහල් අලෙවිය ගමට පමණක් සීමා වී තිබේ. ඊට හේතුව ගල්වැලි ඉවත් කරන ලද සහල් සඳහා පමණක් පුද්ගලික කඩවලින් ඉල්ලුමක් පැවතීමයි. ගම්වැසියන් සහල්වල පවතින පෝෂ්‍ය ගුණය නිසා ගල්වැලි ඉවත් නො කළ ද මිල දී ගැනීම සිදු කොට ඇත. තවත් සමහර අවස්ථාවල ගම්වැසියන් ප්‍රතික්ෂේප කරන අවස්ථා ද වූ බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය.

පොළොන්නරුවේ පුලස්ති පෙදෙස නම් ගම්මානයේ දැනට ද පවතින්නේ සාම්ප්‍රදායික මෝල් දෙකක් පමණි. බහු අස්වනු පැගීමේ යන්ත්‍රයෙන් (Combine Thresher- සුනාමියෙන්) ගොයම් පැගීම සිදු කරන නිසා ගල් වැලි නොමැති බව ද මොවුහු ප්‍රකාශ කළෝ ය. එසේ වුව ද, සහල් සැකසුම් ගම්මානයකට ගල් වැලි ඉවත් කරන මෝලක් අනිවාර්යයෙන් පැවතිය යුතු ය. එමඟින් සහල් සැකසුම් ගම්මානයේ බොහෝ දෙනෙකුගේ වී මෝල් පිළිබඳ පවතින ගැටලු මඟහැරෙන අතර මෙය සහල්වලට පවතින ඉල්ලුම ද වර්ධනය වීමකි.

ඇතැම් ගම්මාන තුළ පැවති වී මෝල් සම්බන්ධ ගැටලුකාරී තත්ත්වයක් වූයේ තමාට මෝලක් පැවතිය ද එහි නවීන තාක්ෂණ පහසුකම් නොමැතිකම නිසා ගල් වැලි ඉවත් නොවීම තුළින් තම සහල් අලෙවි කර ගැනීමේ අපහසුතාවයි. වී මෝල්වල පවතින ගැටලුකාරී තත්ත්ව පොළොන්නරුව, කුඹුක්වැව ගම්මානයේ උග්‍ර වශයෙන් දක්නට ලැබුණි. ඔවුන්ට වී කෙටීම සඳහා කිලෝමීටර් හතක් පමණ දුරකට ගෙන යාමට සිදුව ඇත. ගම්මානය තුළ නවීන වී මෝලක් පැවතිය ද, එමඟින් ගමේ අයගේ වී කෙටීම සිදු නො කරනු ලබයි. එබැවින්, ඔවුන්ට සහල් සැකසුමෙන් ලාභ ලැබීමට නො හැකිව තිබේ. ගම්මාන තුළ වී මෝල් ප්‍රමාණය වැඩි වුව ද, පිටත වී නො කෙටීම පිළිබඳ ගම්මාන රාශියකින් කරුණු අනාවරණය විය.

### 4.4.3 සහල් සැකසුම්කරුවන්ගේ ආදායම

සමස්ථ නියැදිය සැලකීමේ දී සහල් සැකසුම්කරුවන් 172 පමණක් සහල් අලෙවිය සඳහා මෙම කර්මාන්තය සිදු කරයි. මෙම පිරිස වෙත ලබා දී ඇති බැරලය තුළින් වී කිලෝග්‍රෑම් 35ක්

තැම්බීමට හැකි අතර ඒ ඒ දිස්ත්‍රික්ක අනුව, එක් වරකට තම්බන බැරල් ගණන වෙනස් වේ. ලබා ගත් දත්ත අනුව තියැදි සාමාජිකත්වය පුත්තලම දිස්ත්‍රික්කයේ වරකට වී කිලෝග්‍රෑම් 85ක්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී කිලෝග්‍රෑම් 119ක්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී කිලෝග්‍රෑම් 135ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී කිලෝග්‍රෑම් 330ක් ලෙස සහල් සැකසුම සිදු කරනු ලබයි.

තව ද, මෙම තාක්ෂණය යටතේ සහල් කිලෝග්‍රෑමයක් සෑදීමට යන නිෂ්පාදන වියදම වගු අංක 4.10 මඟින් ගණනය කොට ඇත. මෙම වගුව ඉදිරිපත් කිරීමේ දී යොදා ඇති උප මාතෘකා පහත විස්තර කෙරේ.

**ප්‍රාග්ධන වියදම් (Fixed cost) ;** කමත, ලිප, බැරලය, වී සෝදන ටැංකි, පොලිතින් සීලරය, තරාදි, බේසම් ගබඩාව ඇතුළු සහල් සැකසුමට භාවිත කරන උපකරණ අයත් වේ.

**අනෙකුත් යෙදවුම් (Other input Cost) ;** ජලය, දර ඇසුරුම් හා ලේබල් සඳහා යන වියදම සඳහන් වෙයි.

**නඩත්තු වියදම් (Maintenance Cost) ;** විදුලි බිල, දුරකථන වියදම හා ප්‍රාග්ධන උපකරණවල නඩත්තු වියදම් සලකා බැලෙයි.

**වගු අංක 4.10: සහල් කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන වියදම (රුපියල්/කි.ග්‍රෑම්)**

| ක්‍රියාකාරකම් | පුත්තලම | කුරුණෑගල | අනුරාධපුර | පොළොන්නරුව | සාමාන්‍ය (Average) |
|---|---|---|---|---|---|
| 1 ප්‍රාග්ධන වියදම් | 0.37 | 0.05 | 0.11 | 0.03 | 0.14 |
| 2 වී කි.ග්‍රෑ. 1ක මිල | 28.00 | 24.43 | 24.00 | 25.21 | 25.40 |
| 3 සහල් කිලෝග්‍රෑම් 1ක් සඳහා වී මිල | 35.40 | 33.9 | 33.3 | 35.5 | 34.52 |
| 4 අනෙකුත් වියදම් | 0.89 | 0.68 | 0.95 | 0.33 | 0.71 |
| 5 නඩත්තු වියදම් | 3.07 | 1.25 | 0.58 | 0.82 | 1.43 |
| 6 ශ්‍රම වියදම් | 1.77 | 0.93 | 0.92 | 1.43 | 1.23 |
| 7 වී කෙටීමේ වියදම් | 2.95 | 2.90 | 2.49 | 2.22 | 2.64 |
| 8 ප්‍රවාහන වියදම් | 1.73 | 1.35 | 0.53 | 0.28 | 0.97 |
| සහල් කිලෝග්‍රෑම් 1ක නිෂ්පාදන වියදම | **46.18** | **41.10** | **38.90** | **40.60** | **41.70** |
| සහල් කිලෝග්‍රෑම් එකක අලෙවි මිල රුපියල් | 61.00 | 49.00 | 50.00 | 51.00 | 52.75 |
| සහල් කිලෝග්‍රෑම් එකකින් ලබන ලාභය | 14.82 | 7.71 | 11.37 | 10.28 | 11.04 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

ඉහත දිස්ත්‍රික් හතර සැලකීමේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ සහල් සැකසුමට යොදා ගෙන ඇති වී වර්ගය සම්බා වන අතර ඉතිරි දිස්ත්‍රික්ක තුන සහල් සැකසුමට යොදා ගෙන ඇත්තේ නාඩු සහල්

ය. සමස්ථය ගැන සාකච්ඡා කිරීමේ දී පුත්තලම හැර අනෙක් දිස්ත්‍රික්ක තුන පිළිබඳ දත්ත සලකා බැලෙයි.

මේ අනුව, නිෂ්පාදන වියදම සැලකීමේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ සම්බා කිලෝග්‍රෑම් එකක් සෑදීමට යන වියදම රු.46.00ක් වන අතර කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාඩු සහල් කිලෝග්‍රෑම් එකක් සෑදීමට රු.41.00ක්, අනුරාධපුර රු.39.00ක් හා පොළොන්නරුව රු.41.00ක් ලෙස වේ. මෙම නිෂ්පාදන වියදම අඩුවැඩිවීම කෙරෙහි සෑමවිටම වී මිල තීරණාත්මක සාධකයක් වී තිබේ. එලෙස ම, සහල් කිලෝවක අලෙවි මිල කර්මාන්තකරු ලබන ලාභ ප්‍රතිශතයට සෘජුවම බලපා ඇත.

සමස්ත තියැදිය සැලකීමේ දී, සහල් කිලෝ එකකින් ලබන ලාභය රු.10/-කි. මෙය දිස්ත්‍රික්ක වශයෙන් සැලකීමේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ සම්බා වර්ගය සඳහා රු.13/-ක් ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාඩු වර්ගය සඳහා රු.8/-ක් ද, අනුරාධපුර රු.11/-ක් ද හා පොළොන්නරුව රු.10/-ක් ද ලෙස ලාභ ලබා ඇත. මෙම සහල්වල අලෙවි මිල තීරණය වීමේ දී පවතින අනෙකුත් සහල්වල මිල මෙයට බලපා ඇති අතර වෙළෙඳපොළ පවතින ඉල්ලුම හා සැපයුම අනුව මිල තීරණය වී තිබේ. එසේ වුව ද, ගම්මානය තුළ අලෙවි කිරීමේ දී පවතින මිලට රු.1-2ක් වැඩියෙන් අලෙවිය සිදු කරන අතර නගරය තුළ අලෙවියේ දී රු.1-2 ක් අඩුවෙන් අලෙවි කරයි. බොහෝදුරට නගරය තුළ වෙනත් සහල් වර්ග බහුලව පවතින අතර තමන්ගේ සහල්වලට වෙළෙඳුන් පවා එතරම් කැමැත්තක් නො දක්වන්නේ මේ අය තුළින් ලබන කොමිස් මුදල අඩු නිසා බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය.

සහල් සැකසුම් කර්මාන්තය එක දිගටම පවත්වා ගෙන යනු ලබන කාර්යයක් නොවන බව දත්ත ලබා ගැනීමේ දී පැහැදිළි විය. කුඹුරු අස්වනු නෙලන කාලයට, තම ගෙදර හදිසි රාජකාරී පවතින විට, අසල්වාසී උත්සව හෝ අවමඟුල් අවස්ථාවල මේ කාර්යය එක දිගට නවත්වා තිබීම සිදුවන බව ගොවි සාකච්ඡාවල දී පැහැදිළි විය. මේ අනුව, සතියකට වාර කිහිපයක්, අවුරුද්දකට මාස කිහිපයක් ලෙස මේ කාර්යය සිදු කර ඇත. එක දිගටම මෙම කර්මාන්තයේ යෙදෙන පිරිස් ද දත්ත ලබා ගැනීමේ දී හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව වර්ෂයකට සහල් සැකසුමට භාජනය කරනු ලැබූ වී ප්‍රමාණය ,ඒ සඳහා වියදම් හා ලබන ලාභ ප්‍රතිශත වගු අංක 4.11 මඟින් දක්වා ඇත.

වගු අංක 4.11: වර්ෂයකට කර්මාන්තකරුවන් ලබන ලාභ ප්‍රතිශත

| | පුත්තලම | කුරුණෑගල | අනුරාධපුර | පොළොන්නරුව | සාමාන්‍ය (Average) |
|---|---|---|---|---|---|
| වරකට සහල් සැකසුමට යොදා ගන්නා වී ප්‍රමාණය (කිලෝ) | 85 | 135 | 119 | 330 | 167.4 |
| මාසයකට සහල් සකසන වාර ගණන | 2.2 | 4.75 | 3.5 | 4.3 | 3.7 |
| වසරකට සහල් සකසන මාස ගණන | 11 | 11 | 10 | 8 | 10 |
| වර්ෂයකට සකසන වී කිලෝ ගණන | 2057 | 7054.00 | 4165 | 11483 | 6189.00 |
| වී මිල (රු.) | 28.00 | 24.43 | 24.00 | 25.21 | 25.40 |
| වී අලෙවියෙන් ලබන මිල වසරකට | 57596.00 | 172329.00 | 99960.00 | 289486.00 | 154843.00 |
| මෙම වී ප්‍රමාණයෙන් ලබන සහල් කිලෝග්‍රෑම් ගණන (70%) | 1440.0 | 4938.00 | 2916.00 | 8038.00 | 4333.00 |
| සහල් අලෙවි මිල | 61.00 | 49.00 | 50.00 | 51.00 | 53.00 |
| සහල් අලෙවි ආදායම (රු.) | 87840.00 | 241962.00 | 145800.00 | 409938.00 | 229649.00 |
| සහල් සැකසුමේ වියදම රුපියල් | (2057*10.78) 22175.00 | (7054*7.20) 50789.00 | (4165*5.60) 23324.00 | (11483*5.10) 58563.00 | (6189*7.17) 44375.00 |
| සහල් අලෙවියෙන් ලාභය වසරකට (රු.) | 65665.00 | 191173.00 | 122476.00 | 351375.00 | 185274.00 |
| වී අලෙවියට වඩා සහල් අලෙවියෙන් ලබන ආදායම රුපියල් | 8069.00 | 18844.00 | 22516.00 | 61889.00 | 30431.00 |
| වී අලෙවියට වඩා සහල් අලෙවියෙන් ලබන ලාභය % | 14% | 11% | 23% | 21% | 20% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

වගු අංක 4.11ට අනුව පැහැදිළි වන්නේ වී අලෙවියට වඩා සහල් අලෙවියෙන් සමස්ථ තියැදිය 20%කට වැඩි ආදායමක් ලබන බවයි. මෙම ප්‍රමාණ දිස්ත්‍රික් වශයෙන් සැලකීමේ දී පුත්තලම 14%ක්, කුරුණෑගල 11%ක්, අනුරාධපුර 23%ක් හා පොළොන්නරුව 21%ක් ලෙස වේ.


පුත්තලම දිස්ත්‍රික්කයේ වී අලෙවියෙන් රු57596/-ක් ලබන අතර සහල් අලෙවියෙන් රු65665/-ක ආදායමක් ලබයි. මේ අනුව, සහල් අලෙවියෙන් ලබන වැඩිපුර ආදායම වර්ෂයකට රු. 8069/-කි. මෙලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහල් අලෙවියෙන් ලබන වැඩිපුර ආදායම රු.18844ක් ද, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ලබන වැඩිපුර ආදායම රු.22516/-ක් ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආදායම රු.61889/-ක් ලෙස ද වේ. ඉහත දත්ත අනුව පැහැදිළි වන්නේ වැඩි සහල් ප්‍රමාණයක් සැකසුමට යොදා ගන්නා දිස්ත්‍රික්කවල වැඩි ආදායමක් ලබා ගන්නා බවයි.

### 4.4.4 නිෂ්පාදන ධාරිතාවය පුළුල් වීම

ලාභ අපේක්ෂාවෙන් කර්මාන්තයක් පවත්වා ගෙන යාමේ දී නිෂ්පාදන ධාරිතාවය පුළුල් වීමත් සමඟම ලාභය වැඩි කිරීම සඳහා එම භාණ්ඩයේ නිෂ්පාදන වියදම අඩුවීම සිදු විය යුතු ය. මෙම සිද්ධාන්තයට අනුව පසු අස්වනු තාක්ෂණික ආයතනය විසින් හඳුන්වා දුන් මෙම ගෘහස්ත

මට්ටමේ සහල් සැකසුම් කර්මාන්තයේ වාර්ෂිකව එක් එක් කර්මාන්තකරුවන් සැකසීමට යොදා ගන්නා වී ප්‍රමාණය සහ එම වී ප්‍රමාණය සැකසීමට යන වියදම් ගණනය කරන ලදී. ඒ අනුව, වාර්ෂිකව සකස් කරන සහල් ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින කර්මාන්තකරුවන් සඳහා සහල් කිලෝග්‍රෑම් එකක් සැකසීමට අඩු වියදමක් ද, වාර්ෂිකව සකස් කරන සහල් ප්‍රමාණය අඩු පිරිස වැඩි නිෂ්පාදන පිරිවැයක් ද දැරීම දක්නට ලැබුණි.

**ප්‍රස්ථාර අංක 4.3: වාර්ෂික සකස් කරන සහල් ප්‍රමාණය සහ සැකසීමේ වියදම්**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

අලෙවිය සඳහා ගෘහස්තව සහල් සැකසීමේ කාර්යයේ යෙදී සිටින එක් එක් කර්මාන්තකරුවන් සැලකිල්ලට ගෙන සැකසීමට යොදා ගත් වී ප්‍රමාණයේ සාමාන්‍ය අගයක් සහිත කණ්ඩායම් හා එම එක් එක් කණ්ඩායමට සහල් සැකසීම සඳහා ගිය වියදම්වල සාමාන්‍ය අගය ගණනය කර ප්‍රස්ථාර ගත කරන ලදී. ප්‍රස්ථාර අංක 4.3ට අනුව, සෑම සහල් සැකසුම්කරුවෙකු තුළින් ම සැකසුම් ප්‍රමාණය වැඩි කිරීමත් සමඟම තම සැකසුම් වියදමෙහි ඍජු අඩුවීමක් අපේක්ෂා කළ නො හැකි වුව ද සමස්ථ සහල් සැකසුම්කරුවන්ගේ උපනතිය(Trend line) සැලකීමේ දී සහල් සැකසුම් ප්‍රමාණය වැඩිවීමත් සමඟ ම සහල් සැකසුම් වියදම අඩුවීම දක්නට ලැබේ.

### 4.4.5 සහල් අලෙවිය

සහල් අලෙවියේ දී කර්මාන්තකරුවන් අලෙවිය සඳහා විවිධ මාර්ග යොදා ගැනීමක් සිදු වී තිබුණි. ආරම්භයේ දී (2005 වසරේ දී) ගම්මාන තුළ ම මෙම සහල් සඳහා වැඩි ඉල්ලුමක් පැවති අතර වර්තමානයේ එම තත්ත්වය වෙනස්වීමක් සිදුව ඇති බව ගොවි ප්‍රතිචාර වලින් පැහැදිළි විය. එනම්, නිෂ්පාදක සිට පාරිභෝගික දක්වා වූ අලෙවි ජාලය තුළ සහල් සැකසුම් ගම්මාන ආරම්භයේ දී සැකසුම්කරුවන් 261 දෙනෙකු සම්බන්ධ වී සිටි අතර එය අධ්‍යයන දත්ත ලබා ගැනීමේ දී 147 දෙනෙකු දක්වා 43%ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

ගොවීන්ගේ තම අලෙවිදාමය ක්‍රියාත්මක වන අයුරු තවදුරටත් සඳහන් කිරීමේ දී නිෂ්පාදක සිට ගමේ එකතුකරන්නා හරහා පාරිභෝගික දක්වා යන අලෙවි ජාලයට ආරම්භයේ 44 දෙනෙකු සම්බන්ධවී සිටි අතර එය වර්තමානයේ කර්මාන්තකරුවන් හයදෙනෙකු දක්වා අඩු වී පවතී. මේ අනුව පැහැදිලි වන්නේ ගමේ එකතු කරන්නා එම කාර්යයෙන් ඉවත් ව ඇති බව යි. තවදුරටත් ක්‍රියාත්මක අලෙවි ජාල පිළිබඳ ආරම්භය හා වර්තමානයේ ක්‍රියාකාරීත්වය වගු අංක 4.12 මඟින් දක්වා තිබේ.

**වගු අංක 4.12: සහල් සැකසුම් ගම්මාන ආරම්භයේ හා වර්තමානයේ සහල් අලෙවිය වෙනස් වීම**

| | එක් එක් අලෙවි ජාලය තුළ රැඳී සිටි සංඛ්‍යාව | | ඒ ඒ අලෙවි ජාල තුළ අඩුවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | ආරම්භය | වර්තමානය | |
| නිෂ්පාදකයා → පාරිභෝගිකයා (ගම්මානය තුළ හා පිටස්තර) | 261 | 147 | 43% |
| නිෂ්පාදකයා → ගමේ එකතු කරන්නා → පාරිභෝගිකයා | 44 | 6 | 86% |
| නිෂ්පාදකයා → අලෙවිසැල් → පාරිභෝගිකයා | 110 | 38 | 65% |
| නිෂ්පාදකයා → තොග → සිල්ලර පාරිභෝගිකයා | 7 | 3 | 57% |
| | 422 | 194 | 54% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

ඉහත තත්ත්වය අනුව පැහැදිලි වන්නේ සමස්ථ වෙළෙඳාම (ක්‍රියාත්මක වූ අලෙවි ජාලය) 54%කින් අඩු වී ඇති බව ය. නිෂ්පාදනයේ සිට පාරිභෝගිකයා දක්වා අලෙවි මාර්ගයේ දී ගම්මානය තුළ අලෙවිය, පිටස්තර හිතවතුන් මාර්ගයෙන් අලෙවි කිරීම සිදු වූ බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය. ගම්මානය තුළ අලෙවිය, නිෂ්පාදක සිට කෙළින්ම පාරිභෝගික දක්වා වන අලෙවි ජාලය 43%කින් අඩු වී තිබේ. මේ තුළින් පැහැදිලි වන්නේ සහල් එකතු කරන පුද්ගලයන් වෙනත් මාර්ග කෙරෙහි ඇදී ගොස් ඇති බව ය. නිෂ්පාදක සිට ගමේ එකතු කරන්නා දක්වා ප්‍රවාහයේ දී අලෙවිය 86%කින් අඩු වී ඇත. මේ පිළිබඳ තවදුරටත් හේතු ගණනාවක් හඳුනා ගැනීමට ගොවි සාකච්ඡා තුළින් හැකි විය.

1. වර්තමානයේ වෙළෙඳපොළ පවතින සහල් ගල් වැලි ඉවත් කර වෙළෙඳ නාමයක් සහිතව පැමිණීම නිසා මෙම සහල්වලට වෙළෙඳපොළ ස්ථානයක් නොමැතිවීම
2. තොග සහ සිල්ලර වෙළෙඳුන් තමන්ගේ ලාභ ප්‍රතිශතය වැඩි සහල් ලබා ගැනීමට ඇති කැමැත්ත.

ගුණත්වයට වඩා මිල සහ ඇසුරුම පිළිබඳ වැඩි රුචියක් දක්වන පාරිභෝගිකයන් හමුවේ කර්මාන්තකරුවෝ මෙවැනි තත්ත්වවලට මුහුණ දී සිටිති. මෙම සහල් අලෙවියේ දී ඇසුරුමක් භාවිතා නො කරන්නේ මන් ද යන්න, ගොවි සාකච්ඡාවල දී නැඟුන ගැටලුවක් විය. වෙළෙඳ නාමයක් හා ඇසුරුමක් යෙදවීමට තරම් තම ව්‍යාපාරය සාර්ථක තත්ත්වයේ නොවීම බව 26%ක

ගොවි අදහස විය. එසේ වුව ද, අසල්වාසීන්ට හෝ තම ව්‍යාපාරික ස්ථානයේ අලෙවියේ දී වෙළෙඳ නාම අනවශ්‍ය බව සමස්ථ නියැදියේ 53%කගේ මතය විය.

මෙම සහල්වල පවතින ඉහළ ගුණාත්මක බව, ගඳක් නොමැතිවීම, බත පිළුණු නොවීම, සාපේක්ෂව වෙළෙඳපොළ පවතින මිලට වඩා සුළු මුදලක් අඩුවීම (සමහර ගම්මානයන් හි, ගම්මාන තුළ අලෙවිය පවතින මිලට රු.1-2 වැඩියෙනි) යන කරුණු පිළිබඳ අවබෝධයක් නිසා පාරිභෝගිකයන් මෙම සහල්වලට යොමුවන බව ගොවි සාකච්ඡාවලදී සනාථ විය. සමස්ථයක් ලෙස බහුතර පාරිභෝගිකයන් මෙම සහලේ පවතින පෝෂණය ගුණය පිළිබඳ නො දන සිටීම මෙසේ අලෙවියට අඩුවීමට හේතු බව අනාවරණය විය.

කිසියම් කර්මාන්තයක් ක්‍රමානුකූලව පවත්වා ගෙන යන්නේ නම්, ඒ පිළිබඳ සටහන් තැබිය යුතු ය. එසේ වුව ද, සමස්ථ නියැදියේ 85%ක ප්‍රතිශතයක් ව්‍යාපාරය සම්බන්ධව පොත්පත් පවත්වා ගෙන නො යයි. පුත්තලම දිස්ත්‍රික්කයේ 8%ක්, අනුරාධපුර 18%ක්, කුරුණෑගල 14%ක් හා පොළොන්නරුව 20%ක් ලෙස පොත් පත් පවත්වා යාම සිදු කරයි. මේ පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීමේ අවශ්‍යතාව ගොවි සාකච්ඡාවල දී පැහැදිළි විය. පැකට් සහිතව වෙළෙඳ නාමයක් පවත්වා ගෙන යන්නේ සමස්ථ නියැදියේ අලෙවි කරන පිරිසෙන් 10%ක් වැනි ඉතා සුළු පිරිසකි. මෙහි දී, ඇසුරුම් සඳහා යන වියදම, තමන්ගේ නිෂ්පාදන වියදම ඉහළ යාමට හේතු වන නිසා ඒ සඳහා වැඩි යොමුවීමක් නොවන බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය. වී අලෙවිය හා සහල් අලෙවිය පිළිබඳ ගොවීන් තුළ පවතින අදහස් විමසුමට ලක් කරන ලදී. මෙහි දී, සහල් අලවියෙන් ලැබිය හැකි ලාභදායී තත්ත්වය පිළිබඳ කරුණු රැසක් අනාවරණය විය.

අලෙවි වාසි

- වී අලෙවියෙන් ලබන ලාභයට වඩා වැඩි ලාභයක් සහල් අලෙවියෙන් ලබා ගත හැකිවීම -74%
- නිරතුරු අත මුදල් ගැවසේ.ණය නොවී පවුලේ ආර්ථිකය ශක්තිමත් කර ගත හැකිවීම - 54%
- නිවසේ පරිභෝජනයට සහල් නිතරම නිවසේ පවතින අතර වී ද ගබඩා කොට තිබීම - 47%.

වී සහ සහල් අලෙවිය පිළිබඳ සාපේක්ෂ ව සැලකීමේ දී සහල් සකසා අලෙවිය වැඩිදුර තම ආර්ථිකයට හිතකර වූව ද, වී අලෙවියේ වාසි රාශියක් පිළිබඳ කරුණු අනාවරණය විය.

- වී අලෙවියේ දී අඩු ශ්‍රමයක් හා අඩු කාලයක් ගතවීම සහ එකවර විශාල මුදලක් ලබා ගැනීමට හැකිවීම.
- බොල් ඇට, රොඩු, තෙත බර පිළිබඳ කිසිදු ගැටලුවක් නැත. ඕනෑම ප්‍රමාණයක් වී, ඕනෑම අවස්ථාවක පවතින මිලට අලෙවි කළ හැකිවීම
- ගබඩා කිරීමෙන් සිදුවන හානි අවම වන අතර අලෙවියේ දී ප්‍රවාහන වියදම් දැරීමට සිදු නොවේ.

### 4.4.6 අලෙවිය ණයට සිදුවීම

සහල් අලෙවිය සිදුවීමේ දී එය ගම්මාන තුළ මෙන් ම නගරයේ අලෙවිසැල් වෙත ද ණයට ලබාදීමට සිදු වී ඇත. නගරයේ අලෙවි සැල්වලින් ණය මුදල් ආපසු ලැබෙන්නේ ඊ ළඟ වර සහල් සැපයූ පසුව ය. බොහෝ කර්මාන්තකරුවන්ට තම සහල් අලෙවියේ දී අත්පිට මුදල් නො ලැබීම නිසා නැවත සහල් සැකසුම සිදු කිරීමට මුදල් නොමැති වන අතර ගෙදර දොර වියදම්වල දී ද ගැටලු පැන නැගෙයි. සහල් ගම්මාන ආරම්භයේ හා වර්තමානයේ අලෙවිය සිදු කළ ආකාරය විමසුමට ලක් කරන ලදී (වගු අංක 4.13).

වගු අංක 4.13: අලෙවිය සිදු කරන ආකාරය

| අලෙවිය සිදු කරන ආකාරය | සමස්ථ නියැදිය | | % |
|---|---|---|---|
| | ආරම්භය N=369 | වර්තමානය N=172 | |
| අත්පිට | 302 | 151 | 50% |
| ණය | 207 | 99 | 52% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

වර්තමානයේ සහල් අලෙවියේ යෙදී සිටින කර්මාන්තකරුවන් සංඛ්‍යාව 172 (N=172) කි. සමස්ථ නියැදිය සැලකීමේ දී ආරම්භක අවස්ථාවේ සිට වර්තමානය දක්වා ණයට ලබා දෙන ප්‍රතිශතය 50% සිට 52% දක්වා ඉහළ ගොස් ඇති බව ගොවි ප්‍රතිචාර අනුව පැහැදිලි වේ. ණයට ලබා නොදුනහොත් එම අලෙවි මාර්ගය නැති වී යන අතර වෙනත් අලෙවි මාර්ග සොයා යා යුතු ය. එසේ සිදු කිරීම වෙනුවට අමාරුවෙන් හෝ ණය ලබා දී සහල් සැකසුම කර ගෙන යාම හැර වෙනත් විකල්පයක් නොමැති බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය.

## අරමුණු 5:

### 4.5 සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ තිරසාර භාවය හා බැඳුණු සාධක ඇගයීම

කිසියම් කාර්යයක් සාර්ථකව සිදු කර ගෙන යාමට ඒ හා බැඳුණ සාධකවල පවතින පැවැත්ම වඩා වැදගත් වේ. ඒ අනුව, සහල් සැකසුම් කර්මාන්තය සිදු කර ගෙන යාම සඳහා අත්‍යවශ්‍යම යෙදවුම් කිහිපයක් හඳුනා ගත හැකි ය. මෙහි දී ප්‍රධාන අවශ්‍ය සාධකය වන්නේ වී ය. ඉන් අනතුරුව, වී සේදීම සඳහා අවශ්‍ය වන ජල ටැංකි, වී සේදීමට ජලය, වී තැම්බීම් සඳහා බැරලය, වී වේලීම සඳහා කමත, ගබඩා පහසුකම්, වී කෙටීම සඳහා වී මෝල්, ශ්‍රමය ලබා ගැනීම, ණය ලබා ගැනීම සහ අලෙවිකරණය ප්‍රමුඛ වෙයි.

සහල් සැකසුම ආරම්භයේ සිට වර්තමානය වන විට ඉහත ද්‍රව්‍යයන් හෝ කාර්යය පිළිබඳ ඒ ඒ කර්මාන්තකරුට ගැටලු පැවතියේ ද යන්න විමසුමට ලක් කරන ලදී. මේ සඳහා ලබා ගත් ගොවි ප්‍රතිචාර සංඛ්‍යාව ආරම්භය හා වර්තමානය ලෙස වගු අංක 4.14 න් දක්වා තිබේ.



පුස්තකාලය
LIBRARY
හෙ.කො ගො,ප.පු.ආ
HARTI

වගු අංක 4.14: සහල් සැකසුම් කර්මාන්තයේ යෙදවුම් හා උපකරණ සම්බන්ධ ඇති වූ ගැටලු

| | කර්මාන්තය ආරම්භක අවධිය ගැටලු ඇති බවට ප්‍රතිචාර | වර්තමාන අවධිය N = 369 | ගැටලුවේ වෙනස්වීම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 1 මූලික ඉදිකිරීම් සහ උපකරණ සම්බන්ධ ගැටලු (කමත, ලිප, බැරල්, සෝදන ටැංකි) | 207 (56.1%) | 172 (46.6%) | 17 |
| 2 යෙදවුම් සම්බන්ධ ගැටලු (වී, ජලය, දර) | 236 | 187 | 21 |
| 3 සහල් සැකසීමේ දෛනික කාර්යයන් සම්බන්ධ ගැටලු (ශ්‍රමය, වේලීම, කෙටීම, ප්‍රවාහනය, ගබඩාකරණය) | 418 | 345 | 17 |
| 4 නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සම්බන්ධ ගැටලු (ඇසුරුම්, ඇසුරුම් කිරීම, පොලිෂ් කිරීම, තරාදි) | 117 (41%) | 167 (45%) | 3.5 |
| 5 අලෙවිකරණ ගැටලු | 197 | 141 | 28 |
| 6 ණය ලබා ගැනීම සම්බන්ධ ගැටලු | 56 | 44 | 21 |
| 7 වී මෝල් පිළිබඳ ගැටලු | 119 | 107 | |
| මුළු ගැටලු | 1406 (54%) | 1163 (46%) | 17 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

මේ පිළිබඳව කරුණු හතක් යටතේ අදාළ දත්ත ලබා ගන්නා ලදී. එනම් මූලික ඉදි කිරීම් හා උපකරණ, යෙදවුම් සම්බන්ධ ගැටලු, සහල් සැකසීමේ දෛනික කාර්යයන් පිළිබඳ, නිෂ්පාදන වෙළඳපොළට ඉදිරිපත් කිරීම සම්බන්ධ ගැටලු, අලෙවිකරණයේ පවතින ගැටලු, ණය ලබා ගැනීම හා වී මෝල් සම්බන්ධව පවතින ගැටලු ලෙසයි. මෙම කොටස මඟින් ඒ ඒ කරුණ පිළිබඳව සාකච්ඡා කොට ඇත.

### 4.5.1 මූලික ඉදිකිරීම් සහ උපකරණ සම්බන්ධ ගැටලු

මේ යටතේ කමත, ලිප, යොදා ගන්නා බැරලය, වී සෝදන ටැංකි පිළිබඳ ඇති වූ ගැටලු සාකච්ඡාවට බඳුන් වේ. සහල් සැකසුම් ගම්මාන ආරම්භයේ දී මූලික ඉදි කිරීම් සහ උපකරණ සම්බන්ධ ගැටලුව සමස්ථ නියැදියේ 56%කට තිබී ඇත. නමුත් වර්තමානය වන විට එයට 17%කින් අඩු වී ඇත.

ආරම්භය හා වර්තමානය සැලකීමේ දී කමතක් සාදා ගැනීම කමතට ලැබෙන ප්‍රතිපාදන හෝ අතැති මුදල් අනුව සිදු වී තිබේ. කමත නොමැති වුව ද ඒ සඳහා විකල්ප ක්‍රම භාවිතය තුළින් මේ ගැටලුව අවම කොට ගෙන තිබූ කර්මාන්තකරුවන් රාශියක් විය. ටෙන්ට් රෙදි භාවිතය, පැදුරු

භාවිතය හා තම නිවසේ සිමෙන්ති පොළවේ දමා වේලීම සිදු කළ අය ද විය. මෙම ටෙන්ට් රෙදි භාවිතයේ දී ටෙන්ට් රෙදි උණුවී යාම, පැදුරුවල එකවර විශාල ප්‍රමාණයක් වියලා ගැනීමට නො හැකිවීම, ගල් වැලි වැනි අපද්‍රව්‍ය වී වලට එකතුවීම හා අපතේ යාම් වැඩිවීම, භාවිතය අපහසු වීම, ඉක්මණින් වේලා ගත නො හැකිවීම යන ගැටලුවලට මේ අය මුහුණ දී තිබුණි. මේ කමත නොමැති නිසා ගැටලුවලට මුහුණ දුන් ප්‍රතිශතය ආරම්භයේ 37%ක් වූ අතර වර්තමානය වන විට 31% දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් අඩු වී ඇත.

වී තැම්බීම සඳහා භාවිතා කරන ලිප මෙම ව්‍යාපෘතියේ අනිවාර්ය අංගයක් වන අතර මෙය සාද ගැනීම සඳහා පසු අස්වනු තාක්ෂණ ආයතනය නිසි උපදෙස් ලබා දී ඇත. එක් අංශයකින් පමණක් දර දැමීමට හැකි වන සේ සාද ඇති මෙම ලිප ගඩොල් යොද සාද ගත හැකි අතර මැටි මිශ්‍රනයක් තුළින් බැඳ ගැනීම සිදු කොට තිබේ. අඩු දර ප්‍රමාණයක් භාවිතය තුළින් වැඩි වී බැරල් ප්‍රමාණයක් තම්බා ගැනීමට හැකි ලිපක් ලෙස මෙම ලිප පසු තාක්ෂණ ආයතනය මඟින් හඳුන්වා දී ඇත. මෙම ලිප පිළිබඳ ගැටලු පැවතියේ සමස්ථ නියැදියේ 5%ක තරම් අඩු ප්‍රතිශතයකට ය. ගොවින් මේ සඳහා භාවිතා කරන ලිප අධ්‍යයනයේ දත්ත ලබා ගැනීමේ දී නිරීක්ෂණය කිරීමට හැකි විය. තමන්ගේ උනන්දුව හා කැපවීම පවතී නම් ලිප පිළිබඳ ගැටලු ඇති විය නො හැකි බව පර්යේෂණ කණ්ඩායමට අවබෝධ විය.

බැරලය යනු සහල් සැකසුමේ ප්‍රධාන අවශ්‍ය භාණ්ඩයකි. බැරල් පිළිබඳ ගැටලුව සමස්ථ නියැදියේ 16% ප්‍රතිශතයකට පැවතිය ද, වර්තමානය වන විට එය 13% දක්වා අඩු වී තිබේ. බැරලයක් පිළිබඳ ප්‍රධාන ගැටලුවක් වූයේ බැරලය මිල දී ගැනීමට සිදුවීම ය. මෙම ගැටලුව අනිවාර්යයෙන් විසඳීමට නම් හඳුන්වා දී ඇති වර්ගයේ බැරලයක් මිල දී ගත යුතු ය. කාලයක් පාවිච්චිය නිසා බැරල්වල ඇතුළේ පවතින දැල කැඩී ගොස් තිබුණි. මේ සඳහා නව දැලක් යෙදීම කළ යුතු විය. නිරීක්ෂණ දත්තවලින් පැහැදිළි වූයේ එය කර්මාන්තකරුට පහසුවෙන් මඟහරවා ගත හැකි බවයි.

මෙම බැරලයක ගැටලුව තදින්ම බලපා තිබුණේ අනුරාධපුර දිස්ත්‍රික්කයට ය. එය ආරම්භය 16% ක් වූ අතර වර්තමානය වනවිට 8% දක්වා අඩු වී තිබුණි. සමහර සහල් සැකසුම් ගම්මානවල එක බැරලය දෙදෙනෙකුට භාවිතා කිරීමට සිදු වී ඇත. ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මානපහ ගම්මානයෙ හි සහල් සැකසුම සඳහා හවුල් අයිතිය මත බැරලයක් කණ්ඩායමට එකක් වශයෙන් ලබා දී ඇත. තව ද, වී සේදීම සඳහා සිමෙන්ති ටැංකි භාවිතය සිදු කළ කර්මාන්තකරුවන් මෙන් ම බැරල්, විශාල මුට්ටි භාවිතා කළ අය විය. මෙම විවිධ උපකරණයන් භාවිතය තුළින් කාර්ය පහසු/අපහසු වීම සිදු වී තිබුණි.

### 4.5.2 යෙදවුම් සම්බන්ධ ගැටලු

සහල් සැකසුම් කාර්යාවලියේ ප්‍රධාන යෙදවුම් වර්ග තුනක් වන වී, ජලය හා දර ලබා ගැනීම පිළිබඳ මෙහි දී සාකච්ජා කෙරේ. කර්මාන්තය ආරම්භයේ මෙම ගැටලුව 226 දෙනෙකුට පැවති අතර එය වර්තමානය දක්වා පැමිණීමේ දී 187 දෙනෙකු දක්වා 20% කින් අඩු වී පවතී.

1. වී වර්ග සොයා ගැනීම

සහල් සැකසුම් ගම්මාන ක්‍රියාත්මක වීමේ දී ප්‍රධාන අමු ද්‍රව්‍ය වන්නේ වී වන අතර වී වර්ග භාවිතයේ දී විවිධ වූ වර්ගයන් භාවිතා කර තිබුණි. බොහෝ දුරට, කුඹුරු ඉඩම් පවතින ගොවීන්ට වී පිළිබඳ ගැටලු අවම විය. මෙම ගොවීන් අස්වනු නෙලූ අවස්ථාවේ දී ම කුඹුරු වැපිරීම සඳහා ණය වූ මුදල් ගෙවීමට වී අලෙවිය සිදු කරයි. ඉතිරි ප්‍රමාණය පරිභෝජනයට, අලෙවියට හා සහල් සැකසුමට තබා ගනී. මෙම ගම්මාන ආරම්භයේ දී සමස්ථ නියැදියේ 39%කට වී සොයා ගැනීමේ ගැටලුව පැවතිනි. ප්‍රධාන වශයෙන් ආරම්භක අවස්ථාවේ දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ වී සොයා ගැනීමේ ගැටලුව 14% වූ අතර වර්තමානයේ එය 8% දක්වා අඩු වී පවතී. තව ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම ප්‍රතිශතය 11 % සිට 9 % දක්වා අඩුවක් දත්ත තුළින් පෙන්නුම් කරයි. එම ගැටලු අතර වී මිල ඉහළ අගයක් ගැනීම, මිල දී ගන්නා වී වල බොල් ප්‍රතිශතය වැඩිවීම, නිසි ප්‍රමිතියකින් යුක්ත වී නොමැතිවීම, වී මිල දී ගැනීමට දුර බැහැරට යා යුතුවීම, වැනි ප්‍රධාන වූ ගැටලු කිහිපයක් හඳුනා ගැනීමට හැකි විය. නිශ්ශංකමල්ල පෙදෙසෙ හි ඇතැම් සහල් සැකසුම්කරුවන් මෙම ගැටලුව නිසා පරිභෝජනයට සහල් සැකසීම පවා නතර කොට තිබුණි.

පොළොන්නරුව ක්ෂේත්‍ර සමීක්ෂණයේ දී ලැබුණු දත්ත අනුව, ව්‍යාපෘතිලාභීන් සහල් සකස් කර අලෙවි කිරීමට වඩා පිටස්තර ගොවීන්ගෙන් වී ගෙන තම්බා, වේලීම සිදු කොට තිබූ අවස්ථා දැකගත හැකි විය. එහි දී, කිලෝ 60ක වී මිටියක් තම්බා වේලා දීමට රු.175-200ක් අතර මුදලක් අය කර තිබේ. තව ද, දිනකට හාල් මිටි පහක් වැනි ප්‍රමාණයක් වී තම්බා වේලා දීමෙන් ශ්‍රමය වෙනුවෙන් ඉහළ ආදායමක් උපයා ගෙන තිබුණි. තමන්ටම කුඹුරු නැති ව්‍යාපෘතිලාභීන් වී මිල දී ගෙන ගබඩා කොට තබා ගනිමින් සහල් සකස් කර ගනී. වී සපයා ගැනීම දුෂ්කර නො වූවත් වී මිල දී ගැනීමට එකවර මුදල් නොමැති වීමෙන් අපහසුතාවන්ට පත් වී තිබේ. වී අස්වැන්න නෙලන කාලයට වී ලබා ගැනීම පහසු වූවත්, වී නොමැති කාලවල දී අසීරුතාවයන්ට මුහුණ දේ. මිල දී ගැනීමෙන් පසු ගබඩා කර තබා ගැනීමේ දී අපතේ යාම් ඉහළ අගයක් ගනී. එසේ වුව ද, වර්තමානය වන විට මෙම වී පිළිබඳ ගැටලු 10%කින් අඩු කර ගැනීමට හැකි වී තිබේ. මෙම වී පිළිබඳ ගැටලුව විසඳ ගැනීමට විවිධ වූ ක්‍රම උපායයන් භාවිතා කොට තිබුණි.

- වී මිල ඉහළ යාමේ ගැටලුව විසඳ ගැනීම සඳහා අස්වනු නෙලන කාලයට වී මිල දී ගැනීම සිදු කොට ඇත
- බැංකු ණය ලබා ගැනීම තුළින් වී ගබඩා කර තබා ගැනීම
- තමන් සතු අස්වැන්න අලෙවි නො කර තබා ගැනීම
- දුර ප්‍රදේශවලින් අස්වනු නෙලන කාලයට වී මිල දී ගැනීම

දර සඳහා කර්මාන්තකරුවන් විවිධ වූ ගැටලුවලට මුහුණ දී තිබුණි. මෙම ගැටලු අතර දර මිලට ගැනීමට සිදුවීම හා දර සඳහා ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවීම, දර සොයා ගැනීමට ඇති අපහසුතාව ප්‍රමුඛ වී තිබුණි. මෙම ගැටලු වර්තමානය මෙන් ම ආරම්භක අවධිය තුළ ද එක සමානව පැවතී ඇත. මෙයට විසඳුම් ලෙස, දහයියා ලිප සඳහා ගොවීන් වැඩි කැමැත්තක් ඇති බව සාකච්ඡාවල දී පැහැදිළි විය. මෙයට අමතරව, ඇතැම් ස්ථානවල (පුලතිසි පෙදෙස, යාය 12,

හිඟුරක්ගොඩ, තලාකොලවැව, තිශ්ශංකමල්ල පෙදෙස) දර හිඟවීමත්, ඒ සඳහා අධික මිලක් ගෙවීමට සිදුවීමත්, කර්මාන්තය පවත්වා ගෙන යාමට යම්කිසි ගැටලුකාරී තත්ත්වයන් ඇති කර තිබුණි.

සහල් සැකසුමේ දී, වී ජලයෙන් සේදීම අනිවාර්ය වේ. මෙම තාක්ෂණය යටතේ පැය 24-36 දක්වා කාල පරාසයක් වී ජලයේ පෙඟවිය යුතු ය. පැය 12කට වරක් ජලය ඉවත් කොට අළුත් ජලය එක් කිරීම තුළින් දුගඳ ඉවත්වන බව තාක්ෂණ උපදෙසයි. මේ අනුව, වැඩි ජල ප්‍රමාණයක අවශ්‍යතාවය පවතී. යාය 12 හිඟුරක්ගොඩ, තිශ්ශංකමල්ල පෙදෙස, යාය 09 මැදිරිගිරිය වැනි ප්‍රදේශවල ජලය හිඟවීමේ තත්ත්වයක් ද හඳුනා ගත හැකි විය. ළිං ජලය භාවිතා කිරීමේ දී පායන කාලයට ජලය සපයා ගැනීමේ අපහසුතා පවතී. පායන කාලයට ජලය සොයා යැම, ජල සැපයුම් මාර්ග දුරින් පිහිටීම මේ කර්මාන්තයට ගැටලු වී තිබේ. ආරම්භයේ 16%ක් ව පැවති මෙම ගැටලුව වර්තමානය වන විට 12% දක්වා අඩු වී ඇත. ඉහත කුමන අන්දමේ ගැටලු පැවතිය ද මෙම කර්මාන්තයට ඇති කැමැත්ත නිසා ජල ප්‍රශ්නය අපහසුතාවයෙන් වුව ද විසඳ ගැනීමට සිදු වී ඇති බව ගොවි සාකච්ඡා තුළින් කරුණු අනාවරණය විය.

### 4.5.3 සහල් සැකසීමේ දෛනික කාර්යයන් පිළිබඳ ගැටලු

සහල් සැකසීමේ දෛනික කාර්යයන් සිදු කිරීමේ දී ශ්‍රමය භාවිතා වන ප්‍රධාන කාර්යයන් ලෙස වී තැම්බීම, සේදීම, වී වේලීම, වී කෙටීම, වී ප්‍රවාහනය සහ සහල් ප්‍රවාහනය හා ගබඩා කිරීම යන ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකි ය. මේ හා සම්බන්ධ ගැටලු සමස්ථ තියැදියේ 418 දෙනෙකුට තිබුණි. එය වර්තමානය වන විට 345 දක්වා 17%කින් අඩුවී ඇත.

ආරම්භය හා වර්තමාන කාල සැලකීමේ දී ශ්‍රම ගැටලුව එක සේ පැවති බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය. මෙම කාර්යය බොහෝ දුරට පවුලේ ශ්‍රමය භාවිතයෙන් සිදුවීම නිසා පවුල්වල අඩු සාමාජික පිරිසක් සිටීම හා ඒ අය වෙනත් රැකියා වෙත යොමුවීම මෙසේ ශ්‍රමය ගැටලුවක් වී තිබුණි. ශ්‍රමය ලබා ගැනීමේ දී කර්මාන්තකරුවන් මුහුණ දුන් ගැටලුකාරී තත්ත්වයන් නිසා කර්මාන්තය අතහැර දැමූ පිරිස් ද දත්ත ලබා ගැනීමේ දී හමු විය.

වී වේලීමේ කාර්යය සිදු කිරීමේ දී කමතක් පැවතීම එය වඩාත් පහසු කරවීමට හේතු වී තිබේ. මෙම කාර්යය සිදු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ පැවතියේ නම් කමත වෙනුවට විකල්ප මාර්ග භාවිතා කිරීමට හැකියාව තිබුණි. කෙසේ වෙතත්, ආරම්භය 22%ක් ව පැවති මෙම ගැටලුව වර්තමානය වන විට 16% දක්වා අඩු කරලීමට සමත්ව තිබේ. මේ සඳහා පිටස්තර ඉඩම්වල වී වේලීම ආදී විකල්ප ක්‍රම භාවිතා කොට තිබුණි.

සහල් කෙටීමේ දී ගල් වැලි ඉවත් කර, පොලිෂ් කර වෙළෙඳපොළට ඉදිරිපත් කළ යුතු ය. සහල් සැකසුම් කාර්යයේ සාර්ථක අලෙවියක් සිදුවීමට, පරිභෝගිකයින් වැඩි පිරිසක් මෙම සහල් සඳහා යොමු වීමට නම් හොඳ ප්‍රමිතියක් මෙම සහල්වල පැවතිය යුතු ය. එසේ වුව ද, ආරම්භය මෙන් ම

වර්තමානයේ ද, මෙම කර්මාන්තකරුවන් ගැටලු රාශියකට මුහුණ දෙමින් සිටී. වී කෙටීමේ දී ගල්වැලි ඉවත් නොවීම, පිටස්තර වී මෝල් ගල්වැලි ඉවත් කිරීමේ දී ඒ සඳහා වැඩි මිලක් අය කිරීම නිසා සහල්වල ප්‍රමිතිය අඩුවීම එවැනි ගැටලු වේ. තමන්ට අවශ්‍ය වේලාවට කොටා ගැනීමට නො හැකිවීම මෙම ගැටලුව උග්‍ර කරවීමට සමත් වී තිබේ. සහල් සැකසුම් ගම්මාන සඳහා නව තාක්ෂණයෙන් යුත් වී මෝල් අවශ්‍ය බව ගොවි සාකච්ඡාවල දී වැඩිදුරටත් පැහැදිලි විය.

ගබඩාකරණයේ දී තමන් වෙත වී ගබඩා කිරීමට සුදුසු ස්ථානයක් නොමැතිවීම නිසා තම නිවසේ කාමර, සාලය මේ සඳහා භාවිතා කොට තිබුණි. ගබඩාකරණය නිසා සත්ත්ව හානිවලට ගොදුරු වී අස්වනු නාස්තියට පත් වී තිබුණි. ගබඩා ප්‍රමාණවත් නොවීම් හා තිබෙන ගබඩා අබලන් වී පැවතීම ද ගැටලු විය. ගබඩා කිරීම පිළිබඳ ආරම්භයේ දී 15%ක ප්‍රතිශතයකට ගැටලු ඇති බවට ප්‍රතිචාර දක්වූ අතර වර්තමානය වන විට එම ගැටලු 12% දක්වා ඉතා සුළු ප්‍රමාණයකින් අඩු වී ඇත.

ප්‍රවාහනය පිළිබඳ සැලකීමේ දී මිල දී ගත් වී තම නිවසට ප්‍රවාහනය, වී කෙටීම සහ සහල් අලෙවිය සඳහා ප්‍රවාහනය බොහෝ අවම පහසුකම් මේ පිරිස සඳහා විය. මෙම ගැටලුව ආරම්භයේ දී 33%ක් ව පැවති අතර වර්තමානය වන විට 24% දක්වා අඩු වී තිබේ. සහල් නිෂ්පාදනය කළ පසු කෙසේ හෝ අලෙවිය සඳහා ප්‍රවාහනය සිදු කර ගන්නා නිසා ප්‍රවාහන ගැටලුව එතරම් බලපෑමක් සිදු කර නො තිබුණි.

**4.5.4. නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම**

කිසියම් නිෂ්පාදනයක් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී එහි පවතින ආකර්ෂණීය තත්ත්වය පාරිභෝගිකයන් ඒ දෙසට යොමු කර ගැනීමට හේතු වේ. සහල් සැකසුමේ දී ද, නිසි ඇසුරුම් කළ ලේබලයන් යටතේ පැකට් කර අලෙවි කිරීමට හැකි නම් එය අලෙවිය වර්ධනය වීමට හේතු වනු නිසැක ය. ඇසුරුම සිදු කරන සැකසුම්කරුවන් ඇසුරුම් සඳහා වැඩි මිලක් ගෙවීමට සිදු වී ඇති බව සඳහන් කළ අතර මේ නිසා සහල් කිලෝ එකක නිෂ්පාදන වියදම ද වැඩි වන බව සඳහන් කරන ලදී. සමස්ථයක් ලෙස සැලකීමේ දී හඳුනාගත හැකි වූයේ, ආරම්භයේ පැවති ගැටලු වර්තමානය වන විට අඩුව ඇත්තේ ඉතාමත් සුළු ප්‍රමාණයකින් බව ය.

මෙම සහල් නිෂ්පාදන වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී ආරම්භයේ ගැටලුවලට මුහුණ දුන් ගොවි ප්‍රතිශතය 48%කි. වර්තමානයේ මෙය 45% දක්වා 3%ක ප්‍රමාණයකින් අඩු වී ඇත. මෙම ගැටලුවලට සාර්ථක විසඳුමක් ලැබී නොමැති බව පැහැදිලි වේ. නියමිත ඇසුරුම්, ලේබල් ඇතිව වෙළෙඳපොළට යොමු කිරීමට නම් නිශ්චිත වෙළෙඳපොළක් පැවතිය යුතු බව ගොවි සාකච්ඡාවල දී පැහැදිලි විය.

සමස්ථයක් ලෙස සහල් සැකසුම්කර්මාන්තයේ යෙදවුම් හා උපකරණ ගැටලු ආරම්භය හා වර්තමානය අතර විසඳී ඇත්තේ ඉතා සුළු ප්‍රතිශතයකි. එම ගැටලු විසඳීමට, මෙම කර්මාන්තය ගම්මානවලට සම්බන්ධ කර දීමට හවුල් වූ ආයතන සම්බන්ධ වී ඇත්තේ ඉතා සුළු වශයෙනි. පැහැදිලි ලෙස එම ආයතන පසු විපරම සිදු කරමින් මෙයට සම්බන්ධ වන්නේ නම්, මෙම කර්මාන්තය වඩාත් සාර්ථකව ඉදිරියට ගෙන යා හැකි බව ගොවි සාකච්ඡාවල දී තවදුරටත් කරුණු අනාවරණය විය.

පස්වැනි පරිච්ඡේදය

# ප්‍රතිඵල හා සාකච්ඡා

## සහල් සැකසුම් ගම්මාන සාර්ථක - අසාර්ථක බව විමසීම

### 5.1 හැඳින්වීම

පසු අස්වනු තාක්ෂණ ආයතනය විසින් ගුණාත්මක සහල් නිෂ්පාදන නව තාක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දීමේ දී විවිධ වූ ක්‍රියා මාර්ග ඔස්සේ ග්‍රාමීය කෘෂි ආර්ථිකය ඉහළ නැංවීමට කටයුතු සලස්වා ඇත. එම ක්‍රියාමාර්ග සාර්ථක කර ගැනීමට මෙම නව තාක්ෂණ ක්‍රමවේදය හඳුන්වාදීම තුළින් හැකි වී තිබේ ද යන්න, මෙම පරිච්ඡේදය මගින් සාකච්ඡාවට බඳුන් කෙරේ. එම ක්‍රියාමාර්ග පහත සඳහන් අයුරින් පෙළ ගැස්විය හැකි ය. එනම්,

- ග්‍රාමීය මට්ටමේ උසස් තත්ත්වයේ සහල් නිපදවීමට හැකිවී ද?
- ග්‍රාමීය මට්ටමේ විරැකියාවට මෙය විසඳුමක් වී ඇත් ද?
- කාන්තාවන් සඳහා සුදුසු ස්වයංරැකියාවක් ද?
- වී අලෙවි ගැටලුවට මෙම සහල් සැකසුම් ගම්මාන විසඳුමක් ද?
- සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවන්නේ ඇයි?

කර්මාන්තකරුවන් ලබා දුන් ගොවි ප්‍රතිචාර හා ගොවි සාකච්ඡාවල දී ලබාගත් තොරතුරු අනුව, මෙම ගැටලුකාරී අවස්ථා විමසීමට භාජනය කරන ලදී. අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්‍රික්කවලින් ලබාගත් දත්ත, ආකාර තුනක් යටතේ බෙදා වෙන් කිරීමට හැකි විය.

1. අලෙවිය හා පරිභෝජනය සඳහා සහල් අලෙවිය
2. පරිභෝජනය සඳහා පමණක් සහල් සැකසුම
3. සහල් කර්මාන්තය සිදු නො කරන

**වගු අංක 5.1: සහල් සැකසුම් කර්මාන්තය සිදු කරන ආකාරය**

| දිස්ත්‍රික්කය | අලෙවිය හා පරිභෝජනය සඳහා | % | පරිභෝජනය සඳහා පමණක් | % | සහල් සැකසුමේ නො යෙදෙන | % | මුළු සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 87 | 47.3 | 63 | 34.2 | 34 | 18.5 | 184 | 100 |
| පොළොන්නරුව | 44 | 54.3 | 30 | 37.0 | 07 | 8.7 | 81 | 100 |
| කුරුණෑගල | 36 | 37.9 | 55 | 57.9 | 04 | 4.2 | 95 | 100 |
| පුත්තලම | 05 | 55.6 | 03 | 33.3 | 01 | 11.1 | 09 | 100 |
| මුළු සංඛ්‍යාව | 172 | **46.6** | 151 | **40.9** | 46 | **12.5** | 369 | 100 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

පසු අස්වනු තාක්ෂණ ආයතනය සහල් සැකසීමේ නව තාක්ෂණය ලබාදීම තුළින් අරමුණු කිහිපයක් ඉටුකර ගැනීමට බලාපොරොත්තු විය. එම අරමුණු ඔස්සේ, ඒවා කොතෙක් දුරට සාක්ෂාත් කර ගැනීමට හැකි වී ද යන්න විමසුමට භාජනය කරන ලදී.

## 5.2 ග්‍රාමීය මට්ටමේ උසස් තත්ත්වයේ සහල් නිපදවීම

ඉහත වගු අංක 5.1 අනුව අලෙවිය හා පරිභෝජනය සිදු කරන නියැදි සාමාජිකත්වය 172ක් වන අතර පරිභෝජනයට පමණක් සිදු කරන ප්‍රමාණය 151කි. ඒ අනුව, සමස්ථ නියැදියේ 323 දෙනෙක් එනම්, 87.5%ක ප්‍රතිශතයක් ගුණාත්මක තත්ත්වයේ සහල් පරිභෝජනයේ යෙදී සිටිති. අලෙවිය සඳහා (172) යොමු වී ඇති සාමාජිකත්වය තුළින් ද තවත් විශාල පාරිභෝගිකයන් සංඛ්‍යාවක් මෙම සහල් පරිභෝජනයට යොමු වී සිටිති. මෙම වැඩසටහන ගම්මාන තුළ පරිභෝජනය සඳහා පමණක් හඳුන්වාදීම තුළ වැදගත් වන්නේ ගුණාත්මක තත්ත්වයේ සහල් පරිභෝජනය වැඩි කර ගත හැකි බවයි. මෙම තත්ත්වය යටතේ ඉහත අරමුණු ඉටු කර ගැනීමට පසු අස්වනු තාක්ෂණ ආයතනයට හැකි වී තිබේ.

## 5.3 ග්‍රාමීය මට්ටමේ ස්වයංරැකියා අවස්ථා බිහි කිරීම

අලෙවිය සහ පරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කරන සමස්ථ නියදි ප්‍රමාණය 172ක් වන අතර එය මුළු නියැදියේ 46.6%ක ප්‍රතිශතයකි. මේ අනුව, නව තාක්ෂණය හඳුන්වා දී වර්තමානයේ අලෙවිය යෙදෙන ප්‍රතිශතය 50%කට ආසන්නව වී ඇති අතර මෙම පිරිසගේ ජීවන මාර්ගය උසස් කරලීමට සහල් කර්මාන්තය දයක වී තිබේ. මෙම කර්මාන්තය ස්වයංරැකියාවක් ලෙස සිදු කිරීමේ දී ප්‍රධාන ආදයම් මාර්ගය ලෙස හා ද්විතියික ආදයම් මාර්ගයක් ලෙස යොද ගැනීම දක්නට ලැබුණි (වගු අංක 5.2).

**වගු අංක 5.2: ප්‍රධාන ආදයම් මාර්ග හා ද්විතියික ආදයම් මාර්ග**

| රැකියා මාර්ගය | අනුරාධපුර N=87 | පොළොන්නරුව N=44 | කුරුණෑගල N=36 | පුත්තලම N=5 | මුළු සංඛ්‍යාව N=172 |
|---|---|---|---|---|---|
| ප්‍රධාන රැකියාව | 40 | 31 | 22 | 04 | 97 (56.3%) |
| ද්විතියික රැකියාව | 47 | 13 | 14 | 01 | 75 (43.6%) |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012


කර්මාන්තය සිදු කොට අලෙවිය සඳහා යොදවන කර්මාන්තකරුවන්ගෙන් 56%ක (සමස්ථ නියැදියේ 26%) ප්‍රමාණයක මෙය ප්‍රධාන රැකියාව ලෙස සිදු කරන අතර 44%ක ප්‍රතිශතයක් (සමස්ථ නියැදියේ 20%) ද්විතියික රැකියාවක් ලෙස සිදු කරයි. මේ අනුව, අපට පැහැදිළි වන්නේ සහල් සැකසුම් කර්මාන්තය ස්වයංරැකියාවක් ලෙස සාර්ථකත්වයක් ලබා ඇති බවයි.

## 5.4 කාන්තාවන් සඳහා සුදුසු ස්වයංරැකියාවක් වීම

වගු අංක 5.2ට අනුව ස්වයං රැකියාවක් ලෙස එනම්, තමන්ගේ ප්‍රධාන රැකියාව ලෙස සමස්ථ නියැදියේ 97 දෙනෙකු යෙදී සිටින අතර එම ප්‍රමාණයේ කාන්තා නියෝජනය 62%කි. පිරිමි

නියෝජනය 38%ක් වේ. වැඩි කාන්තා නියෝජනයක් මේ කර්මාන්තය සඳහා යොමු වී ඇති බව මෙමගින් පැහැදිලි වේ (වට ප්‍රස්ථාර 5.1).

**වට ප්‍රස්ථාර අංක 5.1: ස්වයංරැකියාවක් ලෙස කාන්තා පිරිමි නියෝජනය**




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

වර්තමානයේ කාන්තාවන්ගේ වගකීම හා භූමිකාව සීඝ්‍ර වෙනසකට පත් වී ඇති අතර ඵලදායී ලෙස දක්ෂතා ප්‍රයෝජනයට ගැනීමට නිසි මග පෙන්වන්නේ නම්, ඔවුන් ජාතික සංවර්ධනයේ ප්‍රබල සම්පතක් බවට පත් කර ගත හැකි ය. ගොවීන් සමග කළ ගොවි සාකච්ඡාවල දී ද පැහැදිලි වූයේ නිසි මග පෙන්වන්නේ නම්, සහල් සකස් කිරීම කාන්තාවකට පහසුවෙන් කළ හැකි ස්වයං රැකියාවක් බවයි. වී ගොවියාගේ ආදයම් තත්ත්වය ඉහළ නැංවීමේ ලා සහල් සැකසුම් කර්මාන්තය කාන්තාවන් සඳහා සුදුසු රැකියාවක් ද යන්න විමසුමට ලක් කරන ලදී.

මෙම සහල් සැකසුම කාන්තාවන්ට සුදුසු ස්වයංරැකියාවක් බව සමස්ථ නියැදියේ 85% (312) කගේ මතය විය. මේ තත්ත්වය සනාථ කිරීමට පුත්තලම දිස්ත්‍රික්කයේ සමස්ථ නියැදි ප්‍රමාණය ද, අනුරාධපුරය 88%ක් ද, කුරුණෑගල 80%ක් ද, පොළොන්නරුව 82%ක් ද ඉදිරිපත් විය. මෙම සනාථ කිරීමේ දී ප්‍රධාන කරුණු තුනක් පිළිබඳ ප්‍රමුඛව දත්ත ලබා ගැනීමට හැකි විය (වගු අංක 5.3).

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

වගු අංක 5.3: කාන්තාවන්ට සුදුසු ස්වයංරැකියාවක් ද

| සතුට කිරීමට හේතු වූ කරුණු | පුත්තලම N=9 | | අනුරාධපුර N=184 | | කුරුණෑගල N=81 | | පොළොන්නරුව N=95 | | මුළු සංඛ්‍යාව N=369 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| ගේ දොර රාජකාරී සිදු කරන ගමන් නිවසේ සිට කළ හැකි ආරක්ෂාකාරී ස්වයංරැකියාවක් | 9 | 100 | 142 | 77.1 | 79 | 97.5 | 82 | 86.3 | 312 | 84.6% |
| පවුලේ ශ්‍රමය යොදා ගනිමින් කළ හැකිවීම | 5 | 55.6 | 96 | 52.2 | 49 | 60.5 | 48 | 50.1 | 198 | 53.7% |
| කාන්තාවට පවුලේ ආර්ථිකයට දායක විය හැකි රැකියාවක් | 6 | 66.7 | 169 | 91.8 | 75 | 92.6 | 85 | 89.5 | 335 | 90.8% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

කාන්තාවට ගේ දොර රාජකාරී සිදු කරන ගමන් නිවසේ සිට කළ හැකි ආරක්ෂාකාරී ස්වයං රැකියාවක් බව සමස්ථ නියැදියේ 85%කගේ මතය විය (වගු අංක 5.3). මෙවැනි ස්වයං රැකියාවක් තුළින් කාන්තාවට පවුලේ ආර්ථිකයට දායක විය හැකි අතර (91%), ඇයට සමාජ වටිනාකමක් ද හිමි වේ. මෙහි දී, ඇයගේ ඇඳුම් පැළඳුම් සඳහා යන වියදම ඉතිරි වන අතර දරුවන්ගේ අධ්‍යාපනය යහපත් තත්ත්වයකට පත් කිරීමට හැකි වේ. අධ්‍යාපනයක් නො ලද කාන්තාවකට වුව ද කළ හැකි ස්වයංරැකියාවක් වන අතර ඇයට පවුල් ආර්ථිකයට දායක විය හැකි (91%) අතර ඇයගේ ආරක්ෂාව ද තහවුරු වේ.

තවදුරටත් දත්ත ලබා ගැනීමේ දී පැහැදිලි වූයේ සමස්ථ නියැදියේ 15%ක ප්‍රතිශතයක් මෙය කාන්තාවකට නුසුදුසු බව සඳහන් කිරීම යි. සහල් සැකසුමේ සියලුම කාර්යයන් කාන්තා ශ්‍රමයෙන් පමණක් සිදු කළ නො හැකි ය. වී මිලට ගැනීමේ කටයුතු, වී තම්බා බෑම, නැවත ගෝනි කර ගබඩා කිරීම, පෙඟවීමට ගෙන යාම වැනි කරුණු එසේ ඇයට තනිව කර ගත නො හැකි රාජකාරී විය. සුළුවෙන් බැරලයක් දෙකක් කර ගැනීමේ හැකියාව කාන්තාවට පවතින බව ද අලෙවිය සඳහා සහල් සැකසීම සිදු කිරීමට ඇයට නො හැකි බව ද ගොවි සාකච්ඡා වල දී හෙළි විය. තව ද, වර්තමාන ජීවන රටාව හමුවේ ඇයට දරුවන්ගේ අධ්‍යාපන කටයුතු තුළ මෙවැනි කාර්යයක් සඳහා යොමු වීමට ප්‍රමාණවත් කාලයක් නොමැති බවට ද අදහස් ප්‍රකාශ විය. කෙසේ වෙතත්, කාන්තාවට සුදුසු ස්වයංරැකියාවක් බව, දත්ත ලබා ගැනීමේ දී බහුතර මතය ප්‍රකාශ විය.

### 5.4.1 සහල් සැකසුම් කාර්යාවලියේ වගකීම් බෙදී යාම

සහල් සැකසුම සිදු කිරීමේ දී ශ්‍රම මූලික වූ කාර්යයන් කිහිපයක් එක දිගට කළ යුතු ය. ඒ සඳහා බිරිඳ සහ ස්වාමියා අතර වගකීම් කිනම් අයුරින් බෙදී යන්නේ ද පිළිබඳව දත්ත ලබා ගැනීමට හැකි විය (වගු අංක 5.4). මෙහි දී, සහල් අලෙවිය සිදු කළ නියැදි සාමාජිකත්වයේ කර්මාන්තකරුවන් 172කගේ දත්ත ලබා ගන්නා ලදී.

වගු අංක 5.4: වගකීම් බෙදී යාම

| වගකීම | බිරිඳ | | ස්වාමියා | |
|---|---|---|---|---|
| | ප්‍රතිචාර | ප්‍රතිශතය (%) | ප්‍රතිචාර | ප්‍රතිශතය (%) |
| වී මිල දී ගැනීම | 75 | 44 | 98 | 57 |
| ප්‍රවාහනය | 58 | 34 | 26 | 74 |
| තැම්බීම | 154 | 90 | 79 | 46 |
| වතුර ඇරීම | 161 | 94 | 68 | 40 |
| වේලීම | 106 | 58 | 146 | 85 |
| ගබඩා කිරීම | 80 | 47 | 120 | 70 |
| කෙටීම | 128 | 74 | 68 | 40 |
| මුදල් පාලනය | 144 | 84 | 43 | 25 |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

★ *(මෙහි දී ප්‍රතිශත ගණනය කොට ඇත්තේ ප්‍රතිචාර සංඛ්‍යාව මත නොව ප්‍රතිචාර දක්වූ ගොවීන් සංඛ්‍යාව මත ය. එම නිසා, ප්‍රතිශත එකතුව 100ට සමාන නොවේ)*

වගු අංක 5.4 පරීක්ෂා කිරීමේ දී පැහැදිළි වන්නේ, වී මිල දී ගැනීම (57%), ප්‍රවාහන කටයුතු (74%), ගබඩා කිරීම් (85%), වී කෙටීම (70%) යන කාර්යයන් සඳහා වැඩි වගකීම පුරුෂ පක්ෂයට හිමි වී ඇති බවයි. වී සේදීම හා ජලය ඇරීම (90%), වී වේලීම (94%), අලෙවිය (74%), මුදල් පාලනය (84%) වැනි කටයුතු වල කාන්තාව ප්‍රමුඛත්වයක් ගෙන තිබුණි. මේ අනුව, සහල් සැකසුම් කර්මාන්තය කාන්තාවන්ට වඩාත් සුදුසු ස්වයංරැකියාවක් වී ඇති බව මේ තුළින් තහවුරු වේ.

සහල් සැකසුම් කාර්යාවලියේ සමස්ථය පිළිබඳ සැලකීමේ දී පැහැදිළි වන්නේ, නිවසේ ස්වාමියා/බිරිඳ ඇතුළු නිවැසියන්ගේ පූර්ණ සහයෝගය මේ සඳහා අනිවාර්යයෙන් අවශ්‍ය බව ය. එසේ නො පැවති ස්ථානවල සහල් සැකසුම් ගම්මාන අසාර්ථක තත්ත්වයට පත් වූ බව ගොවි සාකච්ඡාවල දී මෙන් ම දත්ත ලබා ගැනීමේ දී ද පැහැදිළි විය. කුලී ශ්‍රමය ලබා ගැනීම තුළින් ලබන මෙම සහල් සැකසුම් කාර්යය තුළින් ලාභ ප්‍රතිශතය ඉතා අඩු බව තවදුරටත් කරුණු අනාවරණය විය.

## 5.5 සහල් සැකසුම් ගම්මාන වැඩසටහන සහ වී අලෙවි ගැටලුව

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය වී වගා කරන දිස්ත්‍රික්ක ආශ්‍රිතව ඇති කිරීමත් සමඟ එම ප්‍රදේශවල පැවති වී අලෙවි ගැටලු කෙරෙහි ද යම් කිසි බලපෑමක් සිදු කොට ඇති බව නිරීක්ෂණ දත්තවලින් හඳුනා ගැනීමට හැකි විය.

සමස්ථ නියැදියේ 58%ක් කර්මාන්තකරුවන්ගේ අදහස වූයේ සහල් ගම්මාන වී අලෙවියට විසඳුමක් බව ය. දිස්ත්‍රික්ක වශයෙන් මේ පිළිබඳ විමසීමේ දී පුත්තලම 52%ක්, අනුරාධපුර 63% ක්, පොළොන්නරුව 54%ක්, කුරුණෑගල 48%ක් ලෙස මේ බව සනාථ කරන ලදී. මෙයට හේතු ලෙස කරුණු රාශියක් සඳහන් විය.

මෙම සහල් සැකසුම් කර්මාන්තය ගම්මානවල සිදු වන විට එම ගම්මානවලින් වෙළෙඳපොළට සපයන වී යම් ප්‍රමාණයකින් අඩුවීමක් සිදු වේ. මේ හේතුව නිසා සහල් සැකසුම නො කරන පිරිසට ද වී අලෙවි කොට යම් කිසි මිලක් ලබා ගත හැකි ය. වී අලෙවි කිරීමට පවතින තරඟය අඩුවීමක් මේ තුළින් සිදු වේ. සහල් සැකසුම සිදු කරන පිරිසක් ගම තුළ සිටින විට ගමේ වී නිෂ්පාදකයින්ට තමන්ගේ වී ගමේ සිටින සහල් සැකසුම්කරුවන්ට අලෙවි කර ගැනීමට හැකියාව ලැබේ. මේ නිසා ද සහල් සැකසුම හරහා යම් කිසි ප්‍රමාණයකින් වී අලෙවි ගැටලුවට විසඳුමක් ලැබේ. තව ද, වී මිලෙහි පවතින ඒකාධිකාරය බිඳ හෙළීමට සුළුවෙන් හෝ මෙම කර්මාන්තයට හැකි වී ඇති බව සාකච්ඡාවල දී කරුණු හෙළි විය.

සිද්ධි අධ්‍යයන තුළින් ද ගම්මානවල සහල් සැකසුම්කරුවන් සිටීම ගමේ පවතින වී අලෙවියට විසඳුමක් බව පැහැදිළි විය. මැදිරිගිරියේ එක් සහල් සැකසුම්කරුවෙකුට මාසයකට අවශ්‍ය වී කිලෝග්‍රෑම් ගණන 70,000 කි. ඉතාම කුඩාවට මෙම තාක්ෂණය යටතේ බැරල්වලින් ආරම්භ කොට මහා පරිමාණ ව දියුණු වී ඇති මොහු ගමේ වී නිෂ්පාදනයෙන් 25%ක් මිල දී ගැනීම සිදු කරයි (සිද්ධි අධ්‍යයනය 4).

එසේ වුව ද, වී අලෙවිය තුළ යම් යම් ගැටළු පැවතිය ද, මෙම වැඩසටහන එයට සාර්ථක විසඳුමක් ලෙස නො දකින පිරිසක් ද හඳුනා ගැනීමට හැකි විය. ඊට හේතුව වී ඉතා අඩු මිලට හෝ ලබා ගැනීමට ගැණුම්කරුවන් සිටින අතර සහල් අලෙවි කර ගැනීමේ දී පාරිභෝගිකයන් සොයා ගැනීම දුෂ්කර වීමයි.

## 5.6 විරැකියාවට සහල් සැකසුම් ගම්මාන විසඳුමක් වේ ද ?

ග්‍රාමීය ව පවතින විරැකියාවට සහල් සැකසුම් ගම්මාන විසඳුමක් වේ ද යන්න පිළිබඳව දත්ත ලබා ගන්නා ලදී. ගොවීන් සමඟ සාකච්ඡාවල දී සහ ප්‍රශ්නාවලි දත්ත ලබා ගැනීමේ දී මේ පිළිබඳ කරුණු රාශියක් අනාවරණය විය.

**වගු අංක 5.5: ග්‍රාමීය ව පවතින විරැකියාවට සහල් සැකසුම් ගම්මාන විසඳුමක් වේ ද ?**

| හඳුනාගත් කරුණු | පුත්තලම N=9 | අනුරාධපුර N=184 | කුරුණෑගල N = 95 | පොළොන්නරුව N= 81 | මුළු සංඛ්‍යාව හා ප්‍රතිශතය N=369 |
|---|---|---|---|---|---|
| 1 ඕනෑම අයකුට පහසුවෙන් කළ හැකි ස්වාධීන රැකියාවක්වීම | 6 | 110 | 82 | 42 | 240<br>65% |
| 2 තමාගේම වී වලින් සුළුවෙන් ආරම්භ කොට දියුණු විය හැකි රැකියාවක් | 4 | 84 | 64 | 67 | 219<br>59.3% |
| 3 අඩු මහන්සිය හා වැඩි ලාභය, හොඳ රැකියාවක් | 6 | 66 | 82 | 87 | 241<br>65.3% |
| 4 අධ්‍යාපන තත්ත්වයක් අවශ්‍ය නොවීම. උනන්දුව/කැපවීම මත කළ හැකිවීම | 5 | 112 | 76 | 46 | 239<br>64.8% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

සහල් සැකසුම් ගම්මාන පිහිටුවීමත් සමඟ එම ප්‍රදේශවල විරැකියාව කෙරෙහි ද යම් ආකාරයක බලපෑමක් කොට තිබේ. වී වගාව ප්‍රධාන රැකියාව වශයෙන් ජීවතින ප්‍රදේශවල පුද්ගලයින් රැකියා නියුක්ත වන්නේ වසරේ එක් කාලයකට පමණක් වන අතර ඉතිරි කාලය තුළ රැකියාවක නියැලෙන්නේ නැත. එවැනි ප්‍රදේශවල සහල් සැකසුම් ගම්මාන ස්ථාපිත කිරීම හේතුවෙන් ගොවීන්ට වසර පුරාම රැකියා නියුක්තියක් හඳුනාගත හැකි ය. පුහුණුව සඳහා තෝරා ගන්නා ලද පිරිසෙන් සියලුදෙනාම සහල් සකස් කිරීම සිදු නො කළ ද යම් පිරිසක් මේ වන විටත් සහල් සකස් කිරීම අලෙවිය සඳහා සිදු කරමින් පවතී. මේ ව්‍යාපෘතිය මඟින් රැකියාවක් සපයා ගන්නා ලද අය සිටින නිසා මෙය යම් ආකාරයකින් විරැකියාවට විසඳුමක් යැයි කිව හැකි ය.

සහල් සැකසුම් ව්‍යාපෘතිය හරහා ග්‍රාමීය ප්‍රදේශවල රැකියා විරහිත තත්ත්වයෙන් පසු වුව ද, ගමෙන් පිටත රැකියාවක් සොයා යාමට හැකියාවක් නැති කාන්තාවන්ගේ විරැකියා තත්ත්වයට සුවිශාල බලපෑමක් සිදු කොට ඇත. ඉතා අඩු කාලයක් තුළ අඩු ශ්‍රම ප්‍රමාණයක් යොදවා (65%) යම් ලාභයක් ලැබීමට හැකි රැකියාවක් වශයෙන් සහල් සැකසුම මෙම ප්‍රදේශවල කාන්තාවන් අතර ජනප්‍රිය රැකියාවක් වී තිබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සහල් සැකසුම් ගම්මාන ඇති කිරීමෙන් විරැකියාවට විසඳුමක් වූ අවස්ථා කිහිපයක් හඳුනාගත හැකි විය. (උදා: බමුණාකොටුව, සඳගල යන සහල් සැකසුම් ගම්මාන) සහල් සැකසුම සඳහා තමන්ගේම වී මෝල් පවත්වා ගෙන යන, තමාගේ කුඹුරු වලින් ප්‍රමාණවත් තරම් වී ලබා ගැනීමට හැකි පුද්ගලයන්ට එය විරැකියාවට විසඳුමක් වී තිබේ. කැපවීම, උනන්දුව, උත්සාහය පවතී නම් මෙම කාර්යය කර ගෙන යා හැකි හොඳ ස්වයංරැකියාවක් (65%) බව

ගොවීන්ගේ අදහස විය. බමුණාකොටුව ගම්මානයේ දී තරුණයන් දෙදෙනෙකු මේ සඳහා යොමු වී තිබුණි. ඒ අය විසින් බැංකු ණය ලබා ගෙන වී මෝල් දෙකක් ද, නවීන තාක්ෂණය යටතේ පිහිටුවා ඇත. මේ හේතු නිසා මේ අයට ස්වයංරැකියාවක් ලෙස ඉදිරියට යාමේ හැකියාව ලැබී තිබේ.

පොළොන්නරුව ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන රැකියා මාර්ගය වන්නේ ගොවිතැනයි. වී ගොවිතැන් කිරීම මෙන් ම ගොඩ ගොවිතැන යන මාර්ග දෙකම යල සහ මහ යන කන්න දෙකේ දී පමණක් සිදු කරනු ලැබේ. එහි දී, ගොවිතැන එක් කාලසීමාවකට සීමා වුවත් සහල් සකස් කිරීම අවුරුද්ද පුරාම කර ගෙන යාමේ හැකියාවක් පවතී. ඒම නිසා, කෘෂිකර්ම කටයුතු නොමැති කාලවල දී ඇතිවන ඌන රැකියා නියුක්ති තත්ත්වයන් මඟ හැරීම කෙරෙහි සහල් සකස් කිරීමේ කර්මාන්තය මහත් උපකාරී වී තිබේ.

සහල් සකස් කිරීමේ කර්මාන්තය සිදු කර ගෙන යාමේ දී අඩු අධ්‍යාපනයක් ඇති පුද්ගලයන්ට පහසුවෙන් කළ හැකි රැකියාවක් නිසා (65%) එය විරැකියාවෙන් පෙළෙන්නන්ට ඉන් මිදෙන්නට කිසියම් දුරකට උපකාරී වී තිබේ.

තව ද, ග්‍රාමීය මට්ටමෙන් පවතින විරැකියාවට මෙය විසඳුමක් ද නැද්ද යන්න සොයා බලන විට පෙනී යන කරුණු ගණනාවකි. එනම්, විරැකියාවට පිළියමක් ලෙස පෙනී ගියත්, එහි දී අලෙවිය සඳහා හොඳ වෙළෙඳපොළක් නැතිනම් එය සාර්ථක විසඳුමක් නොවන බවයි. එම නිසා, බොහෝ ප්‍රදේශවල සහල් අලෙවිය සඳහා විශාල ගැටළු මතු වී තිබුණි. ඒ හරහා විරැකියාවට මෙය විසඳුමක් ලෙස ද පෙන්විය නො හැකි ය. තව ද, ග්‍රාමීය මට්ටමෙන් සත්‍ය ලෙසම විරැකියාවක් පවතිනවා ද යන්න ද ගැටලුවකි. ග්‍රාමීයව වෙසෙන පිරිස් කුමන හෝ රැකියාවක නිරත වේ. එනම් ගොවිතැන, කෘෂි කම්කරු, කෘෂි නොවන කම්කරු ආදියයි. එවිට සමස්ථයක් ලෙස ග්‍රාමීය ව විරැකියාව දැකීම අවම වේ. විරැකියාව පැවතිය ද එය ඉතා සුළු තරුණ පිරිසක් අතර පමණක් දක්නට ලැබෙන්නකි. එහි දී, සමහර අවස්ථාවල දී මෙම කර්මාන්තය කිරීමට අකමැති තරුණ පිරිසක් සිටිති. මෙම කරුණු අනුව විරැකියාවට හොඳ විසඳුමක් ලෙස මෙම ගම්මාන ඇති කිරීම සාර්ථක වී නොමැති බවට ද ගොවි සාකච්ඡාවල දී කරුණු අනාවරණය විය.

මෙම සහල් සැකසුම එදා සිට වර්තමානය දක්වා ක්‍රියාත්මක කිරීම තුළ ගොවි සාකච්ඡාවලින් වැදගත් අදහස් කිහිපයක් මතු විය. මෙම සහල් සැකසුම් ගම්මාන විරැකියාට විසඳුමක් නොවේ.

- තරුණ පරපුර මෙම කර්මාන්තයට අකමැතිවීම
- වී මිල ඉහළ යන කාල පරාසයන් හි මෙම කාර්යය කිරීමට අපහසුවීම
- සහල් සැකසුම මහා පරිමාණ කර්මාන්තකරුවන් සමඟ තරඟ කිරීමට ඇති නො හැකියාව නිසා එක දිගට කළ නො හැකි වීම.
- සුළු පරිමාණයෙන් සිදු කිරීමේ දී ලැබෙන ලාභ ප්‍රතිශතය ඉතා අවම වීම.

පුස්
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

➢ අමතර සුළු ලාභයක් ලැබීමට මිස කිසිදු ආදායම් මාර්ගයක් නොමැති අයෙකුට ජීවත්වීමට සුදුසු හොඳ රැකියාවක් නොවීම.

➢ සමස්ථයක් වශයෙන් ගෙන සලකා බලන විට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නිසි ක්‍රමවේදයක් නො පැවතීම, කර්මාන්තකරුවන්ගේ ගැටලු පිළිබඳ අවධානයක් යොමු නො කිරීම, ආදී තත්ත්වයන් තුළ මෙය විරැකියාවට විසඳුමක් වී නැත. එසේ වුව ද, බොහෝ දෙනෙකුට අමතර ආදායම් මාර්ගයක් වී තිබේ.

සහල් සඳහා නිසි වෙළෙඳපොළක් නොමැතිවීම නිසා මෙය විරැකියාවට විසඳුමක් නොවේ. මෙම කරුණු සමඟ ගොවි සාකච්ඡාවල දී තවදුරටත් හෙළි වූයේ මෙය අමතර ආදායමක් ලබා ගත හැකි එනම්, ද්විතියික රැකියාවක් ලෙස හඳුන්වාදීම වැදගත් බව යි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මෙම ගම්මාන දෙස පොදුවේ ගෙන බලන කළ පෙනී යන්නේ විරැකියාවට විසඳුමක් ලෙස යොදා ගැනීමට නො හැකි වී ඇති බවයි. ඊට හේතුව වන්නේ විශාල වශයෙන් තම කුඹුරු කර ගෙන යාමට අවශ්‍ය වැසි ජලය නොමැතිකම නිසා කන්න කිහිපයක් පාළුවට ගොස් පැවතීමයි. එබැවින්, ඔවුන්ට මෙම සහල් සැකසුම විරැකියාවට විසඳුමක් ලෙස යොදා ගැනීමට හැකියාවක් නැති බව ගම්‍ය විය. එමෙන් ම, කුඹුරු තිබෙන අයට ද ඇති වී තිබෙන ගැටලුකාරී තත්ත්වය නම් තමන්ගේ කුඹුරු වලින් ලබා ගන්නා ආදායම කුඹුරු කිරීමට වන ණය පියවීම සඳහා යොදා ගැනීමට සිදු වීමයි. එවිට සහල් සැකසුම් අලෙවිය දක්වා කරනවා නම් වී පිටතින් ගැනීමට සිදු වේ. එබැවින්, එය ගැටලුකාරී තත්ත්වයකි. නිශ්චිතව වී ලබා ගැනීමට වෙළෙඳපළක් සහ මුදලක් නොමැතිකම නිසාවෙන් මෙය විරැකියාවට විසඳුමක් ලෙස යොදා ගත නො හැකි ය.

## 5.7 සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩු වී ද?

සහල් සැකසුම් ගම්මාන සඳහා අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල හා පුත්තලම යන දිස්ත්රික්කවලින් 2193 දෙනෙකු පුහුණු කොට ඇති අතර නියැදිය සඳහා ඉන් 15%ක ප්‍රතිශතයක් ලබා ගන්නා ලදී.

**වගු අංක 5.6: සහල් සැකසුමට පුහුණු කළ අය**

| දිස්ත්‍රික්කය | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 146 | 65 | 129 | 254 | 448 | 145 | 1187 |
| පොළොන්නරුව | 10 | 14 | 71 | 165 | 64 | 39 | 363 |
| කුරුණෑගල | 25 | 30 | 129 | 86 | 203 | 145 | 618 |
| පුත්තලම | - | 15 | - | 10 | - | - | 25 |
| | 181 | 124 | 329 | 515 | 715 | 329 | 2193 |

මූලාශ්‍රය: පසු අස්වනු තාක්ෂණ ආයතනය, 2012

ගම්මාන තුළ සහල් සැකසුමට පුහුණු කිරීමේ දී එක් පුහුණු කිරීමකට 20 දෙනෙකුට ආසන්න පිරිසක් සම්බන්ධ වී ඇත. ගම්මාන කිහිපයක් එකතු කොට පුහුණු කළ අවස්ථාවල එම ප්‍රමාණය වැඩි වී තිබේ. මේ පුහුණුවට සමහර ගම්මානවල පුහුණුලාභීන් හය හත් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් සහභාගි වී ඇත. දැනට සහල් සැකසුම සිදු කරන සැකසුම්කරුවන් ප්‍රමාණය කෙතෙක් ද? යන්න පිළිබඳ ද්විතියික දත්ත කිසිදු ස්ථානයකින් සොයා ගැනීමට නොහැකි විය. අධ්‍යයනයේ දී සොයා ගැනීමට හැකි වූයේ සහල් සැකසුමට යොමු වී ඇති පිරිස් වලින් පුහුණු කළ මුළු ප්‍රමාණයම එම කාර්යය සිදු නො කරන බව යි. මෙලෙස සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වූ කරුණු ගණනාවක් හඳුනා ගැනීමට හැකි විය (වගු අංක 5.7).

වගු අංක 5.7: සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු තියැදි ප්‍රතිචාර

| | සහල් සැකසුම්කරුවන් අඩුවීමට හේතු | පුත්තලම N=9 | අනුරාධපුර N=184 | කුරුණෑගල N=95 | පොළොන්නරුව N=81 | මුළු සංඛ්‍යාව N=369 |
|---|---|---|---|---|---|---|
| 1 | සහල් අලෙවියට නිශ්චිත වෙළෙඳපොළක් නොමැතිවීම | 5 | 160 | 86 | 79 | 330<br>89.4% |
| 2 | කර්මාන්තය සිදු කර ගෙන යාමට ණය මුදලක් ලබා ගැනීමට නො හැකි වීම | 1 | 102 | 69 | 54 | 226<br>61.2% |
| 3 | පිටතින් වී මිල දී ගැනීමේ දී වැඩි මිලක් හා බොල් වැඩිවීම | 5 | 86 | 89 | 64 | 244<br>66.1% |
| 4 | මහා පරිමාන කර්මාන්තකරුවන් සමඟ තරඟ කිරීමට ඇති නො හැකියාව | 1 | 134 | 94 | 75 | 304<br>82.4% |
| 5 | තමන්ගේ නිෂ්පාදන තිසි ප්‍රමිතියෙන් තොරවීම | 4 | 76 | 39 | 63 | 182<br>49.3% |
| 6 | මැදිහත් ව වැඩ කළ ආයතනවල පසු විපරම නැතිවීම හා තමන්ගේ උනන්දුව, උත්සාහය නොමැතිවීම | 2 | 121 | 85 | 68 | 275<br>74.5% |
| 7 | සහල් සැකසුමට අවශ්‍ය මූලික උපාංග නොමැතිවීම | 1 | 62 | 83 | 59 | 205<br>55.5% |
| 8 | වසර පුරාම කළ නො හැකි ලාභ අඩු කාර්යයක් වීම | 1 | 56 | 32 | 43 | 132<br>35.5% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

සහල් අලෙවිය සඳහා නිශ්චිත වෙළෙඳපොළක් නොමැති බව සමස්ථ තියදියේ 89%කගේ මතය විය. මෙලෙස වෙළෙඳපොළක් නොමැතිවීමට කරුණු රාශියක් බලපා තිබුණි. ගම්මානයේ විශාල සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාවක් සිටීම හා ඒ සියල්ලම ගම්මානය තුළම අලෙවි කිරීමට උත්සාහ දැරීම, ගම්මානයේ වී වගාවේ නියුතු පිරිස අධිකවීම නිසා ඒ අයට අලෙවි කිරීමට ඇති නො හැකියාව හා ගල් වැලි ඉවත් නො කළ අවස්ථාවල වෙළෙඳපොළ පවතින මිල සමඟ තරඟ කිරීමට ඇති නො හැකියාව වී අලෙවියට බාධා වී තිබේ. තව ද, වී මෝල් ඇති සහල් සැකසුම

තුළින් දියුණු වූ ගම්මානයේ කර්මාන්තකරුවන් හා වෙනත් ප්‍රදේශවලින් වී මෝල් හිමියන් ගම්මානය තුළ අලෙවිසැල් තුළට අලෙවි කිරීම නිසා මෙම කර්මාන්තරුවන්ට අලෙවි කිරීමට නිශ්චිත ස්ථානයක් නොමැතිවීම තවත් ප්‍රධාන ගැටලුවකි.

කර්මාන්තය සිදු කර ගෙන යාමට අවශ්‍ය ප්‍රමාණයේ ණය මුදලක් නිශ්චිත වේලාවට නො ලැබීම නිසා සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වූ බව ගොවීන් 61%කගේ මතය විය. ණය ලබා ගැනීමේ දී කණ්ඩායම් ක්‍රමයේ එක් අයෙකු ගෙවීම් පැහැර හැර ඇත්නම් තමාට ණය ලබා ගැනීම ගැටලුවක් වේ. අස්වනු නෙලන කාලයට සාමාන්‍යයෙන් වී මිල අඩු අගයක් ගත් නමුත් මේ කාලයට ණය මුදලක් ලබා ගත නො හැකිය. ණය මුදල ලැබෙන විට වී මිල ඉහළ ගොස් ය. වැඩි මිලට වී මිල දී ගෙන පවතින තරඟකාරී මිලට අලෙවි කිරීමෙන් පාඩු විඳීමට සිදු වී තිබේ.

පිටතින් වී මිල දී ගැනීමේ දී වැඩි මිල හා වී වල අපද්‍රව්‍ය පැවතීම නිසා සහල් සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වන බව 66%කගේ මතය විය. බහු අස්වනු නෙලීමේ යන්ත්‍ර භාවිතයෙන් අස්වනු ශුද්ධ කිරීමේ දී ඉහළ බොල් ප්‍රතිශතයක් අඩංගු වන බව ගොවි අදහසයි. ඒ නිසා, මෙම වී මිල දී ගැනීමෙන් තමන්ට පාඩු සිදුවූ අවස්ථා රාශියක් එම ගොවි සාකච්ඡාවෙන් හෙළි විය. තව ද, මෙලෙස බොල් ඇට සහිත වී ලබා ගෙන කෙටීමේ දී ඒවා කළු ඇට බවට පත් වේ. කළු ඇට පවතින නිසා අලෙවියට ගැටලු/බාධාවන් ඇති වේ.


තම නිෂ්පාදන නියම ප්‍රමිතියෙන් තොරවීම නිසා සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වන බව 49%කගේ මතය විය. බොල් වී භාවිතය නිසා කළු ඇට අඩංගු වීම, ගල්වැලි ඉවත් කිරීමට තාක්ෂණයෙන් හෙබි වී මෝල් ගම්මානය තුළ නොමැති වීම ප්‍රමිතිය අඩුවීමට හේතු වී ඇත. මැදිහත් වූ ආයතන පුහුණුවෙන් පසු තමන් වෙත නො පැමිණීම හා පසු විපරම සිදු නොවීම නිසා සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වූ බව 49%කගේ මතය විය. තමන්ට පුහුණුව ලබාදීම ඒ ඒ සමිති මඟින් සංවිධානය කළ ද, පුහුණුව අවසානයේ ඒ නිලධාරියා මාරු කළ අවස්ථා විය. තමනට හදිසි ගැටලුවක් පැමිණි විට උදව් කිරීමට කිසිදු අයකු නොමැතිවීම ද කර්මාන්තය ඉදිරියට කර ගෙන යාමට ගැටලු වී තිබුණි.

සහල් සැකසුමට අවශ්‍ය මූලික යෙදවුම් නොමැතිවීම, සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වූ බව 56%කගේ මතය විය. ගම්මානය තුළ ගල් වැලි ඉවත් කරන වී මෝලක් නොමැතිවීම නිසා දුර බැහැරක ගොස් එම කාර්යය සිදු කළ යුතු ය. සහල් කිලෝග්‍රෑම් එකක් ගල්වැලි ඉවත් කොට පිරිසිදු කිරීමට රු.4.00-4.50 අතර මිලක් ගෙවූ අවස්ථා ද විය. මෙවැනි තත්ත්ව යටතේ ලැබෙන ලාභ ප්‍රතිශත අඩු වී ඇත. තව ද, මෙම කර්මාන්තය වසර පුරා එක දිගට කළ නො හැකි ය. එසේ කිරීමට වී ගබඩා කොට සාමාන්‍ය තත්ත්වයේ හෝ වෙළෙඳපොළක් සකස් කොට ගත යුතු ය. එවන් අවස්ථාවක් නො ලද විට ස්වයං රැකියාවක් ලෙස මෙය කළ නො හැකි බව මතය විය. මහා පරිමාන කර්මාන්තකරුවන් සමඟ තරඟ කිරීමට නො හැකියාව නිසා සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වූ බව 82%කගේ ගොවි මතය විය. වසර පුරාම කළ නො හැකි ලාභ අඩු

කාර්යයක් නිසා සැකසුම්කරුවන් සංඛ්‍යාව අඩුවීමට හේතු වූ බව 35%කගේ මතය විය. මෙම සහල් සැකසුම් කර්මාන්තය සිදු කර ගෙන යාමේ දී ලබා ගත් තියැදිය තුළින් එහි සාර්ථක අසාර්ථකතාවය විමසීමට ලක් කරන ලදී.

දත්ත ලබා ගත් තියැදියේ හැසිරීම කෙසේ වී ද යන්න වට ප්‍රස්ථාර අංක 5.2 මගින් දක්වා ඇත.

වට ප්‍රස්ථාර 5.2: සහල් සැකසුම් කර්මාන්තය සඳහා තියැදියේ හැසිරීම




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

## 5.8 සහල් සැකසුම් ගම්මානවල සාර්ථකත්වය විමසීම

**ක්‍රමවේදය:**

සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය සාර්ථක ද යන්න විමසීමට අලෙවිය සිදු කරන තියැදි සාමාජිකත්වය යොදා ගන්නා ලදී. එහි දී, මුළු තියැදි ප්‍රතිශතයෙන් 47%ක් අලෙවියට අයත් වූ අතර කුටුම්භ සාමාජිකත්වය 172කි. මෙම සහල් සැකසුම සිදු කොට අලෙවියට යොදා ගත් ප්‍රතිශතය අනුරාධපුර 51% (87), පොළොන්නරුව 26% (44), කුරුණෑගල 21% (36) ක් සහ පුත්තලම 2% (5) දෙනෙකු විය. මෙහි දී, සාර්ථක/අසාර්ථක බව විමසීම සඳහා නිර්ණායක කිහිපයක් සලකා බලන ලදී.

### 5.8.1 නිර්ණායක කිහිපයක් මේ පිළිබඳ සලකා බැලීම

මෙම පිරිස කෙතෙක් දුරට මෙම කර්මාන්තය සාර්ථකව පවත්වා ගෙන යන්නේ ද යන්න පිළිබඳව විමසා බැලීමට යොදා ගනු ලැබූ ක්‍රමවේදය වූයේ නිර්නායක 18 යටතේ කරුණු සොයා බැලීම ය. මෙම යොදා ගත් නිර්ණායක පහත සඳහන් අයුරින් විස්තර කළ හැකි ය.

**1. සහල් සැකසුම් ගම්මානය තෝරා ගැනීම**

මෙම ගම්මානය තේරීම කිනම් ආකාරයෙන් සිදු වී තිබේ ද? ගම්මානය තුළ අමු ද්‍රව්‍ය ඇතුළු පහසුකම් තිබේ ද? අලෙවි පහසුකම් සපුරා ගත හැකි ද? මූලික කොටගත් කරුණු අනුව වර්ගීකරණය කෙරේ.

**2. ව්‍යාපෘතිලාභියා තේරීම**

මෙම ලාභියා තෝරා ගෙන ඇත්තේ කුමන පදනම මත ද? මේ සඳහා සහභාගිවීමට අයකු නොමැති නිසා තමන් අකමැත්තෙන් සහභාගි වී ද? දේශපාලන පදනමක් වී ද? වෙනත් සමිති නිලධාරියෙකුගේ බලපෑම මත සිදු වී ද යන්න කරුණු පිළිබඳ විමසන ලදී. තව ද, ගම්මානයේ සහල් සැකසුම සිදු කරන වෙනත් කර්මාන්තකරුවන්ගෙන් ද මේ පිළිබඳ විමසීම සිදු කරන ලදී.

**3. පුහුණුව ලබාදීම**

මේ පිළිබඳ කර්මාන්තකරුගෙන් වඩාත් සවිස්තර විස්තර ප්‍රශ්නාවලිය තුළින් ලබා ගන්නා ලදී. ඒ අනුව, පුහුණුව කිනම් ආකාරයෙන් ලබා දුන්නේ ද යන්න පහසුවෙන් හඳුනා ගැනීමට හැකි විය.

**4. ආයතන සබඳතා**

වැඩසටහන ආරම්භ කිරීමේ දී ආයතනික සබඳතාව වඩාත් හොඳින් පැවති ඇත. එසේ වුව ද, කාලය ගෙවීයත්ම විවිධ ගැටලු තත්ත්වයත් නිසා එම ආයතන සහල් කර්මාන්තකරුවන්ගෙන් ඉවත් ව තිබේ. මේ පිළිබඳව වඩාත් විමසිලිමත්ව අධ්‍යයනය කරන ලදී.

**5. තිරසර සාධක**

මෙම කර්මාන්තය සාර්ථකව සිදු කිරීමට කමත, බැරලය, ටැංකි, ජලය, දර සහ ලිප අනිවාර්ය වේ. මෙහි දී, කමත හා සෝදන ටැංකි වෙනුවට වෙනත් විකල්ප භාවිතා කොට තිබුණි. ඒ පිළිබඳ කරුණු සොයා සාර්ථක හෝ අසාර්ථක තත්ත්වය විමසීම සිදු කොට ඇත.

**6. තමාගේ වී තිබේ ද?**

තමාගේ වී පැවතීම මෙම කර්මාන්තය කර ගැනීමට වඩාත් පහසු වී ඇත. එසේ වුව ද, ණය ගෙවීමට අස්වනු ලබාගත් විගස අලෙවි කිරීමෙන් සැකසුමට වී ප්‍රමාණවත් වී නොමැත. පිටින් වී වැඩි මිලට ගැනීමට සිදුවීම නිසා ගැටලු රාශියක් උද්ගත වී ඇත. ඒ පිළිබඳ කරුණු සොයා වර්ගීකරණය කොට ඇත.

**7. වී මිල දී ගැනීම (මිල/දුර)**

වී මිල දී ගැනීමට ගම්මානයේ නොමැති නම් මිල දී ගැනීමට යා යුතු දුර, ලබා ගන්නා මිල, කිනම් කාලයක දී මිල දී ගන්නේ ද යන කරුණු පිළිබඳ මෙහි දී අවධානය යොමු කරන ලදී.

ප්‍රවාහන වියදම පිළිබඳව සැලකිලිමත් ව එය කර්මාන්තයේ දියුණුවට බලපා ඇති අන්දම පිළිබඳ විමසා ඇත.

**8. ණය ලබා ගැනීම**

ණය ලබා ගෙන ඇති කාරණා කවරේ ද? එමඟින් කොපමණ ප්‍රමාණයක් සහල් සැකසුමට යෙද වී ද? සහල් සැකසුමට පමණක් ණය ලබා තිබේ ද? ණය ලබා ගැනීමේ දී මතු වූ ගැටලු. මෙහි දී, කණ්ඩායම් ක්‍රමය යටතේ ණය ලබා ගැනීම සහ පුද්ගල ඇප මත ණය ලබා ගැනීමේ දී සිදු වූ දුෂ්කරතා අවශ්‍ය වේලාවට ණය මුදල් ලැබී ද යන්න විමසුමට ලක් කර ඇත.

**9. ශ්‍රමය ලබා ගැනීම**

සහල් සැකසුම සාර්ථකව කර ගෙන යාමට ශ්‍රම සම්පත කිනම් අයුරින් බලපා ඇත් ද? පවුල් ශ්‍රමය ප්‍රමාණවත් වී ද? කුලී ශ්‍රමය යොද ගත්තේ නම් ඒ සඳහා කොපමණ වියදමක් දැරීමට සිදු වී ද යන්න පිළිබඳ විමසන ලදී.

**10. වී ගබඩා පහසුකම්**

වී ගබඩා කිරීමේ දී විවිධ වූ ගැටලුවලට මුහුණ පා ඇති බව හඳුනා ගැනීමට හැකි විය. තම නිවසේ කාමර මේ සඳහා භාවිතා කොට තිබුණි. ගබඩා පහසුකම් නොමැති කර්මාන්තකරුවන් එදිනෙද වී මිලට ගෙන කර්මාන්තය කර ගෙන යන ලදී. ගබඩා කිරීමේ දී පුස්කෑමට ලක්වීම හා සත්ත්ව උවදුරුවලට භාජනය වී තිබුණි. මේ සියලු කරුණු පිළිබඳ විමර්ශනය කරන ලදී.

**11. වී මෝල්**

ගල් වැලි ඉවත් කරන, පොලිෂ් කිරීමට හැකි වී මෝලක් ගම්මානයක පැවතියේ නම් වී මෝල් පිළිබඳ ගැටලු නොවී ය. මෙහි දි, කර්මාන්තකරු සහල් සැකසුම සිදු කොට ගත් වී මෝල කුමන වර්ගයේ ද, ඒ තුළින් නියම ප්‍රමිතියෙන් යුතු සහල් සකසා ගත හැකිවී ද යන්න පිළිබඳ වර්ගීකරණය කරන ලදී.

**12. වී කෙටීමේ මිල**

සාම්ප්‍රදායික වී මෝල් භාවිතයේ දී ගල් වැලි ඉවත් නොවන අතර එසේ කිරීමට වෙනත් වී මෝල් වෙත ගිය කර්මාන්තකරුවන් විය. උදා: පොලොන්නරුව, විජයරාජපුර තමාට හිමි ඩීසල් මෝලෙන් වී කොටා ගල් වැලි ඉවත් කිරීමට වෙනත් මෝල් සඳහා ගිය අවස්ථා විය. මෙහි දී, පිටස්තර වී මෝල්වලට යාමේ දී අය කරන මිල එතරම් සාධාරණ නොවී ය. මෙම කරුණු පිළිබඳ සැලකීමෙන් සාර්ථක අසාර්ථක තත්ත්වය විමසා ඇත.

**13. සහල්වල ගුණාත්මක තත්ත්වය**

සහල්වල පවතින තත්ත්වය නිරීක්ෂණය කිරීමට හැකි විය. කළු ඇට පැවතීම නියම ආකාරයෙන් පොලිෂ් නොවීම වැනි කරුණු නිසා අලෙවියේ දී පාරිභෝගිකයන්ගේ ගැටලු ඇති වී තිබුණි. මේ පිළිබඳව සැලකිලිමත් ව සාර්ථකත්වය විමසා ඇත.

**14. සහල් අලෙවිය**

නිශ්චිත සහල් අලෙවි ස්ථානයක් නොමැති වීම ප්‍රධාන ගැටලු අතර විය. ගම්මානය පිහිටියේ නගරය ආශ්‍රිතව නම්, ගම්මානයේ කුඹුරු වපුරන පිරිස අඩුනම්, රජයේ හා පෞද්ගලික කාර්යාල සමඟ සම්බන්ධතා පවතී නම් අලෙවි ගැටලු අවම විය. මෙම සියලු කරුණු පිළිබඳ විමසීමට ලක් කරන ලදී.

15. **පසු අස්වනු තාක්ෂණ ආයතන පසු විපරම**

පසු අස්වනු තාක්ෂණ ආයතනය මෙම පුහුණුව ලබා දුන් පසු පසු විපරම් සිදු කලේ ද, ඒ ඒ අවස්ථාවේ පවතින ගැටලුවලට ලබාදුන් විසඳුම් කවරේ ද යන්න විමසන ලදී.

**16. වෙනත් ආයතන පසු විපරම**

පසු විපරම හොඳින් පැවතීම කර්මාන්ත සාර්ථකවීමට හේතු වී තිබුණි. වර්ල්ඩ් විෂන් ආයතනය, කෘෂි උපදේශක, සමෘද්ධි නිලධාරීන්, ගොවි සංවිධාන නිලධාරීන් පසු විපරමේ නිරතවීමක් දක්නට ලැබුණි. මේ පිළිබඳ වඩාත් විමසිලිමත්ව සාර්ථකත්වය විමසන ලදී.

**17. ප්‍රචාරණය**

කර්මාන්තකරුවන් අතර ප්‍රධාන ගැටලුවක් වූයේ සහල් පිළිබඳව ප්‍රචාරණය නියම අයුරින් සිදු නොවීම ය. මෙම සහල්වල පවතින ගුණාත්මක තත්ත්වය හඳුනන්නේ පුහුණුවීම් ලබා ඇති අය පමණි. මේ පිළිබඳ පුළුල් ප්‍රචාරයක් ලබා දෙන්නේ නම් අලෙවිය පහසු වේ. ඒ ඒ කර්මාන්තකරු තම නිෂ්පාදන අලෙවියට යොදා ගත් ප්‍රචාරණ ක්‍රමවේද ඇගයීමට ලක් කරන ලදී.

**18. අනෙකුත් වී මෝල් සමඟ පවතින තරඟය**

මෙහි දී, ගම්මානයේ තවත් වී මෝල් තිබේ ද? ඒවායේ අලෙවිකරණ සහල් වර්ග මොනවා ද? ඒවායේ ගුණාත්මක තත්ත්වය කෙසේ ද? අලෙවිකරණ මිල ගණන් කවරේ ද යන්න පිළිබඳ විමසිලිමත් විය. මෙම මහා පරිමාන කර්මාන්තකරුවන්ගෙන් මෙම සුළු කර්මාන්ත සහල් සැකසුම්කරුවන්ට වක්‍රව හා සෘජුව බලපාන ගැටලු පිළිබඳ තවදුරටත් විමසන ලදී.

ඉහත නිර්නායකවලට බර තැබීමක් සිදු කොට ලකුණු ලබාදීම තුළින් අති සාර්ථක, තරමක් හොඳින් කර්මාන්තය කර ගෙන යාම සහ අසාර්ථක ලෙස කර්මාන්තකරුවන් හඳුනා ගැනීමට හැකි විය.

වගු අංක 5.8: අලෙවිය සිදු කරන කර්මාන්තකරුවන්ගේ සාර්ථක/අසාර්ථකභාවය

| දිස්ත්‍රික්ක | අති සාර්ථක | | සාර්ථක | | අසාර්ථක N=172 | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| පුත්තලම | - | - | 3 | 1.7 | 2 | 1.2 |
| අනුරාධපුරය | 6 | 3.5 | 62 | 36.0 | 19 | 11.0 |
| කුරුණෑගල | 5 | 2.9 | 27 | 15.7 | 4 | 2.3 |
| පොලොන්නරුව | 5 | 2.9 | 28 | 16.3 | 11 | 6.4 |
| | 16 | 9.3% | 120 | 69.8% | 36 | 20.9% |

මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත, 2012

*★ (ප්‍රතිශත ගණනය කිරීමේ දී N=172 අනුව ගණනය කිරීම් සිදු කොට ඇත)*

සමස්ථ නියැදියේ අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන කුටුම්භ සංඛ්‍යාව 172කි. එනම් ප්‍රතිශතයක් ලෙස 47%ක් වන අතර මෙම ප්‍රතිශතයෙන් 9%ක් අති සාර්ථකව මෙම කර්මාන්තය සිදු කර ගෙන යති. තරමක් සාර්ථක තත්ත්වයෙන් 70 %ක ප්‍රතිශතයක් කර්මාන්තය ගෙන යන අතර 21% ක් අසාර්ථක වී ඇත.

**සමස්ථ නියැදිය අනුව, මෙම ප්‍රතිශතයන් පහත අයුරින් වෙනස් වේ.**

සාර්ථක වූ කර්මාන්තකරු ප්‍රතිශතය - 37%
අසාර්ථක වූ කර්මාන්තකරු ප්‍රතිශතය - 10%
පරිභෝජනය සඳහා පමණක් සහල් සැකසුම සිදු කරන - 41%
සහල් සැකසුමේ නො යෙදෙන ප්‍රතිශතය - 12%

සමස්ථ නියැදිය සැලකීමේ දී 41%ක ප්‍රතිශතයක් පරිභෝජනය සඳහා ගුණාත්මක තත්ත්වයේ සහල් නිෂ්පාදනයට පෙළඹී සිටිති. අලෙවිය සඳහා යොමු වූ ප්‍රතිශතයෙන් 37%ක් සාර්ථකව අලෙවිය සිදු කරමින් කර්මාන්තය සිදු කරයි. මේ අනුව, පරිභෝජනය මුල් කොට ගත් අලෙවි මාර්ගයකට යොමු කළ යුතු ස්වයංරැකියාවක් බව පැහැදිලි වේ.

2005 වර්ෂයේ දී, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන ලද මෙම සහල් සැකසුම් ගම්මාන වැඩසටහන මේ වනවිට තවත් දිස්ත්‍රික්ක කිහිපයක ව්‍යාප්ත කොට ඇත. මෙහි සාර්ථක, අසාර්ථක බව අධ්‍යයනය කිරීමට තෝරා ගන්නා ලද අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම යන දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති සෑම සහල් සැකසුම් ගම්මානයකම කර්මාන්තකරුවන් සමඟ කළ පොදු සාකච්ඡාවල දී පහත සඳහන් කරුණු පිළිබඳව අනාවරණය කර ගැනීමට හැකි විය.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

## 5.9 කර්මාන්තකරුවන්ගේ ආකල්ප

**1. කැමති පුද්ගලයන් සහභාගි වීම**

සහල් සැකසුම් ගම්මාන ආරම්භ කිරීමේ වැඩසටහන හරහා මුල් අවස්ථාවේ දැනුවත් කිරීම් සිදු කරන්නේ ඒ සඳහා කැමති පුද්ගලයන්ට ඊට සහභාගී වන ලෙසිනි. මෙයට අමතරව, සහල් සැකසුමෙන් ලැබෙන ප්‍රතිලාභ සහ එයට සම්බන්ධ වීමේ දී ලබා දෙනු ලබන ආධාර පිළිබඳව ද ඔවුන් දැනුවත් කරයි. නො මිලයේ ලබා දෙන ඕනෑම දෙයක් ලබා ගැනීමට ඕනෑම පුද්ගලයෙකු සූදානමින් සිටින්නේ ය යන මූලික මානසික තත්ත්ව මත පිහිටා සහල් සැකසුම හා සම්බන්ධ වූ පිරිස අධිකවීම තුළ මූලික පුහුණුව ලැබූ බොහෝ පිරිස අලෙවිය සඳහා සහල් සැකසුමෙන් ඉවත් වී සිටිති..

**2. මහා පරිමාණ සහල් සැකසුම්කරුවන් සමඟ තරඟ කිරීම**

සහල් සැකසුම් වැඩසටහන ගොවීන්ට ඉහළ ආදායමක් ලබාදීම අරමුණු කොට ගනිමින් ආරම්භ කළ ද තවමත් මහා පරිමාණ සහල් සැකසුම්කරුවන් සමඟ ගැටෙන්නට, ඔවුන් හා තරඟ කිරීමට හැකියාවක් නැතැයි යන විශ්වාසය ගොවීන් තුළ පවතී. මෙකී විශ්වාසය ගොවීන් එම මහා පරිමාණ සහල් සැකසුම්කරුවන්ට තරඟයක් නොදීම පරාජය භාර ගැනීමට තරම් පසුබට වීමකි. වර්තමාන සමාජ සැකසුම් රටාව අනුව ගම්මාන තුළ ද සාමූහිකව නැඟී සිටීමේ ක්‍රමවේදය නතර වී ඇත. කෙසේ හෝ තනිවම තමාගේ වැඩ කටයුතු පමණක් කර ගැනීමට උත්සාහ දැරීම හේතුවෙන් දියුණුවීමේ අවස්ථා ගම්මාන තුළ වැසියන්ට අහිමි වී ඇත. සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ආශ්‍රිතව ද මෙම ලක්ෂණය ප්‍රබලවම හඳුනා ගත හැකි ය. එක් අයෙක් තනිවම දියුණුවීමට උත්සාහ දැරීමේ ප්‍රතිඵලය ලෙස සියලුදෙනාටම සහල් සකස් කිරීම අඛණ්ඩව කර ගෙන යාමට නො හැකි වී ඇත.

**3. තම ජීවිත කාලය තුළ ම ණයකරුවෙකු ලෙස ජීවත් විය යුතු පුද්ගලයෙක් ලෙස සිතීම**

තවත් ආකාරයකින් ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ ගොවි සමාජය විසින් පවත්වා ගෙන යනු ලබන සුවිශේෂී සංස්කෘතියක් හඳුනාගත හැකි ය. ගොවියා යනු, තම ජීවිත කාලය තුළම ණය කරුවෙකු ලෙස ජීවත් විය යුතු පුද්ගලයෙක් ලෙස සිතයි. යම් ආදායමක් ලැබුනත්, නො ලැබෙන බව කීම ඔවුන්ගේ ලක්ෂණයකි. වසරේ එක් කාලයක් තුළ තමන් වි නිෂ්පාදනය කර අඩු මිලට හෝ තම අස්වැන්න අලෙවි කිරීමට ගොවීහු උත්සාහ දරති. මෙකී සංස්කෘතියෙන් පිටතට යාමට ඔවුන් අකමැති ය.

**4. අතිශයින්ම යැපුම් මානසිකත්වයකට වී ගොවියා පත් ව සිටීම**

ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ පුද්ගලයා යැපුම් ජීවන රටාවකට හුරු වී සිටී. ඔවුන්ගේ සියලු කටයුතු වෙනුවෙන් ඔවුන් උත්සාහවන්ත වනවාට වඩා ඒ වෙනුවෙන් පවතින රජය මැදිහත් විය යුතු ය. වී ගොවිතැන සඳහා අවශ්‍ය බීජ, පොහොර හා අනෙකුත් රසායන ද්‍රව්‍ය රජය මඟින් සැපයිය යුතු ය. අවසානයේ එම ගොවීන්ගේ නිෂ්පාදනය ද රජය විසින් මිල දී ගත යුතු ය යන

අතිශයින් ම යැපුම් මානසිකත්වයකට වී ගොවියා පත් ව සිටියි. ඔවුන්ට හඳුන්වා දෙන ලද සහල් සැකසුම් කර්මාන්තය සම්බන්ධයෙන් ද මෙවැනි ම මානසික තත්ත්වයක් ඔවුන් සතුව පවතී.

සහල් නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය කමත, වී තම්බන බැරලය, වී පොඟවන ටැංකි, ටෙන්ට් ආදී පහසුකම් රජයෙන් ලබාදිය යුතු ය. සහල් සකස් කිරීමට අවශ්‍ය වී ද රජයෙන් සපයා දිය යුතු ය. ඔවුන් සකස් කරන ලද සහල් ද රජය විසින් මිලට ගත යුතු ය. ලේබල් කරන්නේ නම් ඒවා ද රජය විසින් සම්පාදනය කළ යුතු ය. එපමණකින් නො නැවතී පසු විපරම් කරමින් ඔවුන් සමඟ සිටිය යුතු ය. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය සිදු නොවීය යනු සහල් සැකසුම පමණක් නොව වෙනත් කුමන කර්මාන්තයක් වුව ද ඉදිරියට පවත්වාගෙන යාම ගැටලුවකි.

### 5. අවදානමක් භාර ගැනීමට ඇති අකමැත්ත සහ ආත්ම ධෛර්යයක් නොමැතිකම

ශ්‍රී ලාංකේය ග්‍රාමීය ජනතාව අවදානමක් භාර ගැනීමට තරම් ශක්තියකින් යුක්ත නොවන පිරිසක් ලෙස තවමත් කටයුතු කරති. මේ හේතුව නිසාම අලුතින් ආර්ථික කටයුත්තක් ආරම්භ කර එය සාර්ථක වේ ද, අසාර්ථක වේද යන තීරණය මත මානසික ගැටුමකින් පසුව ඔවුන් ගත හැකි සරලම තීරණය ක්‍රියාවට නංවයි. එනම්, නව ආර්ථික කටයුත්ත පිළිබඳ අදහස අත්හැර දැමීමකි. සහල් සැකසුම් කර්මාන්තය ස්ථාපිත කරන ලද මෙම ගොවි ගම්මාන වල ද මෙම ලක්ෂණය පැහැදිළිව ම හඳුනාගත හැකි විය. මෙලෙස අවදානමක් භාර ගැනීමට ඇති අකමැත්ත සහ ආත්ම ධෛර්යයක් නොමැතිකම නිසාම සහල් සැකසුම් කර්මාන්තය ගොවීන් විසින් අත්හැර දැමූ අවස්ථා හමු විය. ඔවුන් ලබාගත් ආධාර භාවිතා කරමින් තම පරිභෝජන අවශ්‍යතාවය පමණක් සපුරා ගන්නා අතර සුපුරුදු ආකාරයට වී අලෙවි කිරීම දිගටම සිදු කර ගෙන යයි.

වෙනත් රැකියාවක නිරත වී සහල් සැකසුමෙන් ලබන ආදායමට වඩා වැඩි ආදායමක් ලැබීමට හැකි බව සිතුව ද වෙනත් රැකියාවක් සඳහා වැයවන කාලය සහ ශ්‍රම ප්‍රමාණය පිළිබඳව ඔවුන් නො සිතයි. එපමණක් නොව, සහල් සැකසුම්කරුවන් සමඟ ද ඔවුන් සන්සන්දනය කර ඔවුන් සමඟ තරඟකාරීව කටයුතු කිරීමට පෙළ ඹේ. මෙම තත්ත්වය තුළ තමන්ට ගැළපෙන ප්‍රමාණය ඉක්මවා සහල් නිෂ්පාදනය කිරීමට යාමෙන් ඔවුන්ට පාඩු සිදු වේ. මේ තුළ කර්මාන්තය සම්බන්ධයෙන් කලකිරීමකට පත් ව එය අත්හැර දැමීමට පෙළඹුන කර්මාන්තකරුවන් ද දත්ත ලබා ගැනීමේ දී හමු විය.

### 6. කර්මාන්තකරුවන් තුළ ඉවසීමක් නොමැතිකම

පුද්ගලයින් තුළ ඉවසීමක් නොමැතිකම නිසා ද පුහුණුව ලැබූ කර්මාන්තකරුවන්ගෙන් වැඩි පිරිසක් සහල් සැකසුම් කර්මාන්තය අත්හැර දමා ඇත. පුද්ගලයෙක් යම් කර්මාන්තයක් ආරම්භ කර ඉන් යම් කිසි ලාභයක් ලැබෙන තෙක් බලා සිටීමට අකමැති ය. ඔවුන් කර්මාන්තය ආරම්භ කළ දින පටන් ලාභයක් බලාපොරොත්තු වෙයි. අනෙක් අතට, සහල් සැකසුම් කර්මාන්තය තුළ සිදුවන මිල උච්ඡාවචනය වීම ඉවසීමට තරම් හැකියාවක් සමහර කර්මාන්තකරුවන්ට නැත. සහල් පමණක් නොව, ඕනෑම භාණ්ඩයක මිල උච්ඡාවචනය වීම සාමාන්‍ය සිද්ධියකි. එසේ වුව ද, ගොවියා

අපේක්ෂා කරත්තේ සැමවිටම අමු ද්‍රව්‍ය මිල පහත බැස තම නිෂ්පාදනය ඉහළ මිලකට අලෙවි කර ගත හැකි ක්‍රමවේදයකි. මෙය කිසිසේත් ම සිදුවිය නො හැක්කකි. මිල ඉහළ යන කාලයට සතුටින් භාර ගන්නා සේම මිල පහත බසින කාලයට සතුටින් ඉවසා දරා ගැනීමට ගොවියා ශක්තිමත් නොවීම තුළ සහල් සැකසුම් කර්මාන්තයෙන් ඉවත් වූ ගොවීන් හඳුනා ගැනීමට හැකි විය. නිෂ්පාදනය සඳහා යොදවන ලද මූලික වියදම්වල සිටම ලාභය අවශ්‍ය වේ. මහා පරිමාන කර්මාන්තයක ආරම්භය සුළු පරිමාණයෙන් සිදු කිරීම බව තේරුම් ගැනීමට ඔවුන් අකමැති ය. සහල් සැකසුම් ගම්මාන සාර්ථකවීමේ දී කරුණු රාශියක් එක් ව පැවතීම බලපා තිබුණි. පසුවිපරම, අවශ්‍ය වේලාවට ණය ලබා ගැනීමට හැකිවීම, තමාගේම වී පැවතීම, තමා සතු වී මෝලක් පැවතීම, තමා සතු ප්‍රවාහන පහසුකම් පැවතීම, ශ්‍රමය ලබා ගැනීමට හැකි වීම, තමන්ගේ කැපවීම, වී සහතදයී මිලට ලබා ගත හැකි වීම, තමන් විසින් සකසා ගත් වෙළෙඳපොළක් වීම යන හේතු අඩු වැඩි වශයෙන් බලපෑම් මත සහල් සැකසුම්කරුවන් සාර්ථක/අසාර්ථක තත්ත්ව ඇති බව සිද්ධි අධ්‍යයන තුළින් කරුණු පැහැදිළි විය. ඒ ඒ දිස්ත්‍රික්කවල සාර්ථකව හා අසාර්ථකව කර්මාන්තය සිදුකර ගෙන යන සහල් සැකසුම් ගම්මාන හා කර්මාන්තකරුවන් පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයන් මෙතැන් සිට ඉදිරිපත් කෙරේ.

## 5.10 සිද්ධි අධ්‍යයනය

**පළමු වැනි සිද්ධි අධ්‍යයනය (Case study)**

**පසු විපරම නිරතුරු සිදු කිරීම කර්මාන්තය සාර්ථකවීමට හේතු වී ඇත**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | - | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | ගිරිබාව |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | - | පැරකුම්පුර |
| ගම්මානය | - | ගුරුළුපිටිගම |

මෙම සහල් සැකසුම් ගම්මානය 'වර්ල්ඩ් විෂන්' ආයතනයේ මඟපෙන්වීම යටතේ ආරම්භ කරන ලද්දකි. මෙම ආයතනය විසින් ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගම්මාන 35 තුළ "ග්‍රාමීය සංවර්ධන සේවා සමිතිය" යන නමින් සංවිධාන 35ක් පිහිටුවා තිබේ. මෙම සමිති තුළින් ණය ලබාදීම, ගෙවල් සාද ගැනීම සඳහා ආධාර කිරීම ඇතුළු දුප්පත් ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ කටයුතුවල නියැලී සිටී. ඉහත සමිති 35හේ ම එකතුව තුළින් "සීමා සහිත ඇපෙන් සීමිත ජනතා සංවර්ධන සමාගම" නමින් සමාගමක් පිහිටුවා ඇත. ඉහත ගම්මාන සඳහා පිහිටුවා ඇති සමිති 7ක්, එක් කලාපයක් ලෙස කලාප 5ක් ස්ථාපිත කොට මෙම කලාප 5 සභාපතිවරු ඉහත සමාගම් අධ්‍යක්ෂක මණ්ඩලයට පත් කොට තිබේ.

සමිති සාමාජිකත්වයේ ඉල්ලීම මත සහල් තම්බා අලෙවිය තුළින් ගෘහස්ත ව ආදායමක් ඉපැයීමට කාන්තාවන් 'වර්ල්ඩ් විෂන්' ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, පසු අස්වනු තාක්ෂණ ආයතන (IPHT) හරහා මෙම සහල් සැකසුම සමිති සාමාජිකත්වයට හඳුන්වා දී තිබේ. ගුරුළුපිටිය ගම්මානයට පැමිණ මෙම පුහුණුව ලබා දී ඇති අතර 2008-සාමාජික 10, 2009-සාමාජික 09, 2010-සාමාජික 6ක් ලෙස සාමාජිකත්වය 25 දෙනෙකු මෙම කාර්යයට පුහුණු කොට ඇත. මෙම සියල්ලගෙන් ම දැනට 20 දෙනෙකු මේ කාර්යයේ නියැලී සිටින අතර ඉතිරි පස්දෙනා පරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කර ගනී. මේ සියලු අයට බැරලය සහ වී පෙඟවීමේ ටැංකි බැඳ ගැනීම සඳහා සිමෙන්ති උර 10ක් ද නොමිලයේ සපයා ඇත. තමාගේ වියදමින් කමත, ටැංකි හා ලිප සාද ගැනීම සිදු කර ඇත.

ආරම්භයේ තමාගේ වී වලින් සහල් සැකසුම සිදු කර ඉදිරියට යාමට ණය මුදලක් ලබා දී ඇත. ඉහත සඳහන් කළ සංගමයෙන් ලක්ෂ හතරක මුදලක්, ග්‍රාමීය සමිතියට ලබා දී තිබේ. ග්‍රාමීය සමිතිය මඟින් අවශ්‍යතා අනුව ණය මුදල් නිකුත් කොට ඇත. මෙම 20දෙනාගෙන් එක් අයෙකු රු.40,000.00ක මුදලක් ලබාගත් අතර ඉතිරි අය ඊට අඩුවෙන් ණය මුදල් ලබා ගෙන තිබේ. ණය මුදල ලබාගෙන ඇත්තේ කණ්ඩායම් ක්‍රමය අනුගමනය කිරීමෙනි.

- තමාගේම වී භාවිතා කරයි.
- ප්‍රදේශයේ වැඩි පුරම වගා කරන්නේ නාඩු වන අතර ඉල්ලුම ද ඇත්තේ එම වී සඳහා ය.
- ණය මුදල භාවිතා කොට වී ලබා ගෙන ඇති අතර වී වගාව සඳහා ණය ගෙවීම් ද මේ මඟින් සිදු කර ඇත.
- සහල් සැකසුම මඟින් ලබන ආදායම වී වගාවේ කෘෂි රසායන ඇතුළු වරින් වර අවශ්‍ය වන මුදල් අවශ්‍යතා සඳහා යොදවා තිබේ.
- පුහුණුව ලබාගත් පසු 'වර්ල්ඩ් විෂන්' ආයතනය විසින් පත් කොට ඇති සජීවීකාරක විසින් පසු විපරම සිදු කරනු ලබන අතර ඒ තුළින් කර්මාන්තකරුගේ උනන්දුව වැඩි වී තිබේ.
- අලෙවි මාර්ග ලෙස විවිධ මාර්ගයන් උපයෝගී කර ගෙන තිබුණි. තම අසල්වැසියන්, රාජ්‍ය ආයතන, තමා විසින් පවත්වා ගෙන යනු ලබන වෙළෙඳසැල් හා තම ඥතීන් ආශ්‍රයෙන් පිට පළාත්වලට යැවීම සිදු කර ගෙන ඇත. තව ද, පුත්තලම කරා යන ලොරි සහ පුත්තලම පොළට ද මේ සහල් අලෙවිය සිදු කොට තිබේ. කෙසේ වෙතත්, මේ අයට අලෙවිය ගැටලුවක් වී නො තිබුණි.

**දෙ වැනි සිද්ධි අධ්‍යයනය (Case study)**

**'වර්ල්ඩ් විෂන්' ආයතනය මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන සාර්ථකවීම**

එච්.එම්. ඉන්ද්‍රානි මැණිකේ, සජීවී කාරක, බඹරේ සහල් ගම්මාන (පිරිපුන් සහල්), දු.අ. 071-3557016

**සහල් සැකසුම ආරම්භය - 2011**

'වර්ල්ඩ් විෂන්' ආයතනය විසින් සී/ස බඹරේ ග්‍රාමීය සංවර්ධන සේවා සමිතිය ආරම්භ කරන ලදී. 1990 වර්ෂයේ කුඩා කණ්ඩායම ආරම්භ කොට 2000 වර්ෂයේ සමිතියක් ලෙස පිහිටුවන ලදී. 2001 වර්ෂයේ ලියා පදිංචිය සිදු වී ඇත. 'වර්ල්ඩ් විෂන්' ආයතනය විසින් සහභාගිත්ව ගැමි විමසුම වැඩසටහන තුළින් (PRA) සිදු කොට ගමේ පවතින ගැටලු හඳුනාගෙන තිබේ. මෙහි දී,

- වී සඳහා නිශ්චිත මිලක් නොමැතිවීම, උස්සානවලට ජලය නොමැතිවීම
- ගොවීන්ගේ පවතින අධික ණය ගැතිභාවය, පොලියට ගැනීමට පෙළඹී සිටීම

ගමේ ජනතාව විශාල වශයෙන් කුඹුරු වැඩ කිරීම සඳහා පොලියට ගැනීමට පෙළඹී සිටීමේ තත්ත්වයක් තිබුණි (කෘෂි රසායන ඇතුළු සියලු දේ ණයට, කුඹුරු උකස් කොට ඇත). ගම්මානයේ මුදල් ඇති පවුල් කිහිපයකට ගම්මානය යට වී තිබුණි. මෙම පිරිස ණයට දී අඩු මිලකට අස්වනු ලබා ගෙන ඇත. ගොවියා සදහටම ණය හරිත පුද්ගලයෙකු බවට පත් කර ගෙන තිබුණි. මේ තත්ත්වය යටතේ 'වර්ල්ඩ් විෂන්' ආයතනය සමිතිය මගින් ණය වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. ආයතනයේ ව්‍යාපෘති හා රජය සම්බන්ධ ව්‍යාපෘති මෙම 'වර්ල්ඩ් විෂන්' සමිති හරහා සිදු කොට තිබේ. හඳුනාගත් වී අලෙවි ගැටලුවට විසඳුම් ලෙස වර්ල්ඩ් විෂන් ආයතන සමිතිය මගින් වී මිලට ගෙන ගබඩා කොට ඇත. රු.700/-කට ගත් වී මිටියක් (කිලෝග්‍රෑම් 64) රු.900/-කට අලෙවි කොට මිටියකින් රු.200/-ක ලාභයක් ලබා ඇත. මේ තුළින් විශාල ලාභ ප්‍රතිශතයක් සමිතිය විසින් උපයා ගෙන තිබේ.

ඉන් පසු, වගා ක්‍රම හඳුන්වාදීම යටතේ ඉඟුරු වගාව ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකර්ම උපදේශක (AI ) මෙම සමිතියට උපදෙස් දී ඇත. මෙහි දී, කෘෂිකර්ම උපදේශක සමග වී අලෙවි ගැටලුව සාකච්ඡා කොට ඇති අතර එහි දී IPHT ආයතනයේ සහල් සැකසුම් පිළිබඳ වැඩසටහනක් පවතින බවට සමිතිය දැනුවත් කර ඇත. මේ අනුව, මෙම වැඩසටහන 'වර්ල්ඩ් විෂන්' ආයතනය හරහා කෘෂිකර්ම උපදේශක මූලිකත්වයෙන් ගම්මානයට රැගෙන ඒම සිදු කොට තිබේ.

මේ අවස්ථාවේ ඇමරිකන් කෘෂි සංවර්ධන වැඩසටහන (USAD) ආයතනය මෙයට සම්බන්ධ වී ඇත.ඒ අනුව ඇමරිකන් කෘෂි සංවර්ධන වැඩසටහන, 'වර්ල්ඩ් විෂන්' ආයතනය, IPHT, කෘෂිකර්ම උපදේශක (AI) මේ සියල්ලගේම එකතුවෙන් මෙම සහල් සැකසුම් වැඩසටහන මෙම ගම්මානය තුළ ක්‍රියාත්මක විය.

මෙහි ආරම්භයේ දී ගම්මානයේ සාමාජිකයන් 13කට බැරල් එකක් නො මිලයේ හා පසු අස්වනු තාක්ෂණ ආයතන පුහුණුව පමණක් ලබා දී ඇත. කර්මාන්තය සාර්ථක ව සිදු කර ගෙන යන අයට වී වේලීමට කමතක්, පෙඟවීමට ටැංකි දෙකක් සඳහා ද්‍රව්‍යමය ආධාර ලබා දී ඇත.

**වර්තමාන තත්ත්වය**

මෙම 13 දෙනාගෙන් 3 දෙනෙකු අලෙවිය සිදු කරන අතර ඉතිරි 10 දෙනා පරිභෝජනය සඳහා කර්මාන්තය සිදු කරයි. 'වර්ල්ඩ් විෂන්' ආයතනය සමිතිය හරහා රු.25,000/-ක ණය මුදලක් ලබා දෙන අතර මේ නිසා අස්වනු නෙලන කාලයට කර්මාන්තකරුවන්ට පොලියට නො ගැනීමට අවශ්‍ය වී නොමැත. හොඳ කර්මාන්තකරුවන්ට රු.50,000/- දක්වා ණය නිකුත් කිරීම ද සිදු කොට ඇත. ගමේ සියලු ම අයට වී ඇති නිසා ගම තුළ අලෙවිය ඉතා සුළු වශයෙන් පවතී. හොඳ වෙළෙඳපොළක් සොයා ගැනීම කර්මාන්තකරුගේ උත්සාහය මත රඳා පවතී.

**මෙම ගම්මානය සාර්ථක තත්ත්වයේ පවතින බව ලබාගත් දත්ත අනුව පැහැදිලි විය.** එයට හේතු ලෙස කර්මාන්තකරුවන්ගේ පවතින උනන්දුව/උත්සාහය හා කැපවීම ඉතා වැදගත් වී ඇත/මේ සමඟ ම වෙනත් ආදයම් මාර්ගයක ට යොමු වී සිටීම.

'වර්ල්ඩ් විෂන්' ආයතනය විසින් ගම්මානයේ පවතින සමිතිය හරහා වී මිල දී ගැනීමට/ණය පියවීමට ණය මුදලක් ලබාදීම පසු විපරම සිදු කිරීම සඳහා සජීවීකරුවකු පත් කර තිබීම තුළින් නිරතුරු පවතින ගැටලු සාකච්ඡා කිරීමට හැකියාව කිසියම් හෝ අලෙවි මාර්ගයක් සොයා ගෙන තිබීම.

තමාට ම අයිති වී මෝලක් තිබීම සාර්ථක ය. වී කෙටීමේ මිල/තමාටම හිමි ය. පිට අය වී මෝලට එයි. ඒ අනුව අලෙවි කිරීමේ හැකියාව පවතී. වී මෝල් අමතර ආදයමකි. තමන්ට ම කඩයක් පැවතීම අලෙවි ගැටලුවට විසඳුමක් වී තිබේ. ගෙදර සාමාජිකයෙකු රජයේ හෝ පෞද්ගලික රැකියාවක් කරයි. ඒ ස්ථානවල අලෙවි පහසුකම් සකසා ගෙන ඇත.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ

තෙ වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**තමාගේ ම වී පැවතීම, තමා සතු වී මෝලක් පැවතීම, වාහන පහසුකම් පැවතීම, නිරතුරු කැපවීම, පසු විපරම, නිවසේ අය සම්පූර්ණ සහාය ලබාදීම වැඩසටහන සාර්ථකවීමට හේතු වී තිබේ.**

සහල් සැකසුම් කර්මාන්තකරු ඉන් අගය එකතු කළ නිෂ්පාදන කරා යොමුවීම
එම්.එම්. නලින් ධම්මික කුමාර
අංක 94, රජ ඇලපාර
අරලගංවිල
පොළොන්නරුව

අරලගංවිල නගරයේ සිට රජගල පාරේ කිලෝමීටරයක් පමණ දුරින් ප්‍රධාන පාරට මුහුණලා කුමාර මහතාගේ නිවස සහ කඩ කාමර පේළි පිහිටා තිබේ. ඔහු මුලින් ම මහවැලි අධිකාරියේ මෙහෙයවීමෙන් පුහුණුවක් ලබා ගෙන සහල් සකසා වෙළෙඳපළට ඉදිරිපත් කිරීම සිදු කර ඇත. මෙහි දී, වී කෙටීම සඳහා කිලෝමීටර් හතරක් පමණ දුර ගමන් කිරීමට සිදුවීම ඔහුට පැවති ප්‍රධාන ගැටලුවක් විය.

ඉන් පසුව, සමෘද්ධිය මෙම සහල් සැකසීම හා ඊට අදාළ පුහුණුවීම් පසු අස්වනු තාක්ෂණ ආයතනය හරහා ලබා දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සමෘද්ධි බැංකුව විසින් ගමට වී මෝලක් ලබාදීමට යෝජනා විය. ඒ අනුව, තමා සතු ඉඩමක් එම කාර්යයට පවරා දුන් අතර සමෘද්ධි සංගමය විසින් රුපියල් ලක්ෂ අටක ආයෝජනයක් සිදු කොට තම කඩ කාමරයක නවීන වී මෝලක් සවි කරන ලදී. සමෘද්ධි සංගමය සතු එම වී මෝලේ භාරකරු ලෙස තමා කටයුතු කරන අතර සහල් සැකසුම් කර්මාන්තයට සම්බන්ධ සහල් සැකසුම්කරුවන්ට සහන මිලක් (රු.1.25) යටතේ වී කෙටීම සිදු කෙරේ. අනෙකුත් අය සඳහා සාමාන්‍ය වෙළෙඳපළ මිල මට්ටම අය කිරීම සිදු කරයි.

තමා මෙම මෝලෙන් වී කොටා අලෙවි කිරීම කාලයක් තිස්සේ කර ගෙන ගිය ද, සහල් සඳහා පාලන මිලක් නියම කිරීමත් සමඟ වී මිල වැඩි වන විට පවා සහල් මිල වැඩි කළ නො හැකි වාතාවරණයක් යටතේ සහල් සැකසීමෙන් ලැබෙන ලාභ ප්‍රතිශතය ක්‍රමක්‍රමයෙන් අඩු වන්නට විය. එබැවින්, තමා සහල් නිෂ්පාදනය නතර කරන ලදී.

ඉන් පසු, සහල් සැකසීම වෙනුවට සහල් පිටි නිෂ්පාදනය කෙරෙහි නැඹුරුවීම සිදු විය. මෙම පිටි නිෂ්පාදනයෙන් මසකට රු.15,000/-ක පමණ ආදායමක් ලබා ගන්නා අතර හාල් මෝලේ කටයුතුවල නිරතවීම, ඊට අමතරව කඩ කාමර කුලියට දීම වැනි විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ ආදායම් ලබයි. මේ අනුව, මසකට රු.35,000 - රු.40,000 අතර ආදායමක් ලබා ගැනීමට තමාට හැකි බව ප්‍රකාශ කරන ලදී. මෙයට අමතරව, තමා සතු කුඹුරු අඳයට වගා කිරීමට දී ඇති අතර එයින් ද කන්නයකට වී බුසල් 60ක් පමණ ද අඳය වශයෙන් ලැබේ. තම පරිභෝජනයට අවශ්‍ය සහල් මෙම පසු අස්වනු තාක්ෂණය යටතේ සකස් කර ගන්නා අතර තමාගේ පිටි නිෂ්පාදන කර්මාන්තය තවදුරටත් දියුණු කර ගැනීමට අදහස් කොට සිටියි.

## සිව් වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**තමාගේම වී පැවතීම, තමා සතු වී මෝලක් පැවතීම, වාහන පහසුකම් පැවතීම, තිරතුරු කැපවීම, පසු විපරම, තිවසේ අය සම්පූර්ණ සහාය ලබාදීම වැඩසටහන සාර්ථකවීමට හේතු වී තිබේ.**

ජේ.ඒ. රංජනී, නො. 767, ට්‍රැක් 9, දිවුලංකඩවල, මැදිරිගිරිය, දුරකථන අංකය: 071-0947126
ඇය සහල් සැකසුම් ගම්මාන සමිතියට බැඳී ඇත්තේ 2009.02.16 වන දී ය. මෙම ගම්මානයේ පවතින වනිතා කටයුතු සමිතිය මෙය සංවිධානය කොට ඇත. ගොවිජන ප්‍රාදේශීය නිලධාරී හා කෘ.ප.නි.ස. මැදිහත් ව පසු අස්වනු තාක්ෂණ ආයතනය හරහා මෙමම වැඩ සටහන ක්‍රියාත්මක කොට තිබේ.
ආරම්භයේ දී පසු අස්වනු තාක්ෂණ ආයතන කුඩා බැරලයක් මඟින් මේ කාර්යය සිදු කොට ඇති අතර වර්තමානයේ දිනකට වී මිටි 50ක් තැම්බීමට හැකි ආකාරයේ ටැංකියක් යොදා ගෙන ඇත. ආරම්භක අවස්ථාවේ නාඩු වර්ගයේ සහල් අලෙවිය සිදු කොට ඇති අතර මේ වන විට සම්බා, නාඩු, සුදු කැකුළු හා රතු කැකුළු සහල් නිෂ්පාදනය දක්වා දියුණුවක් ලබා තිබේ.. දැනට ලොරියේ රියදුරු සමඟ සේවකයන් පස් දෙනෙකු සේවයට යොදා ඇත. සහල් අලෙවිය සඳහා තමාගේ ම නාමය යෙදූ පොලිසැක් භාවිතා කරයි.

| | | |
|---|---|---|
| දිනකට තම්බන වී මිටි ගණන | = | මිටි 50 (කිලෝ 3200) |
| වී කිලෝ එක මිල | = | රු. 23.40 |
| මෙම ප්‍රමාණයෙන් ලැබුන සහල් | = | කිලෝ 2250 |
| සහල් කිලෝ එකක් අලෙවි මිල | = | රු. 4 1 |
| සහල් අලෙවියෙන් ලැබුන ආදායම | = | රු. 92,250.00 |
| වී මිල දී ගැනීම | = | රු. 74,880.00 |
| වී මිටි 50 සඳහා ශ්‍රම දින 4 (4x80) | = | රු. 3,200.00 |
| විදුලි බිල | = | රු. 400.00 |
| සහල් කෙටීමේ වියදම (80x2250) | = | රු. 1,800.00 |
| උර සඳහා (28x45) | = | <u>රු. 1,260.00</u> |
| මුළු වියදම | = | රු. 81,540.00 |
| හාල් අලෙවියෙන් ලැබෙන මිල | = | රු. 92,250.00 |
| ලාභය (වී මිටි 50) | = | රු. 10,710.00 |
| මාසයකට තම්බන වී මිටි ගණන | = | 800 |
| මාසයක් තුළ ලබන ලාභය | = | 8 00/50 x 10710=රු. 171360.00. |

මෙයට අමතර ව, බොල් වී තම්බා අලෙවි කිරීම ද මෙම තැනැත්තිය විසින් සිදු කරනු ලබයි. තම ස්වාමියා මේ සඳහා මුල් වී කටයුතු කරන අතර වැඩිමහල් පුතා පූර්ණ සහයෝගය ලබා දෙයි.

**බොල් වී**

| | | |
|---|---|---|
| මාසයකට කොටන බොල් වී මිටි ගණන | = | 400 |
| බොල් මිටියක මිල | = | රු. 50.00 |
| බොල් සඳහා යන වියදම (400x50) | = | රු. 20,000.00 |
| බොල් ගෙන ඒමේ කුලිය (400x75) | = | රු. 10,000.00 |
| වෙනත් අමතර වියදම් (400x50) | = | රු. 30,000.00 |
| මුළු වියදම | = | රු. 60,000.00 |
| බොල් මිටියකින් ලැබෙන කැඩූ ඇට කිලෝ ගණන | = | කිලෝ 14 |
| කපා ඇට කිලෝ එකක මිල | = | රු. 20.00 |
| මාසයක කොටන මිටි 400 ක් | = | රු. 400x20 x14 |
| ලැබෙන ආදායම | = | රු. 112,000.00 |
| ලැබෙන ලාභය | = | රු. 52,000.00 |



**වී කුඩු**

| | | |
|---|---|---|
| කුඩු කිලෝ එකක මිල | = | රු. 15.00 |
| කුඩු වලින් ලැබෙන මිල | = | රු. 15,000.00 |

මේ අනුව

| | | |
|---|---|---|
| මාසයකට හාල් අලෙවියෙන් ලබන ලාභය | = | රු.171,360.00 |
| බොල් ඇට අලෙවියෙන් ලබන ලාභය | = | රු. 52,000.00 |
| කුඩු අලෙවියෙන් ලබන ලාභය | = | <u>රු. 15,000.00</u> |
| මාසයක මුළු ලාභ ප්‍රමාණය | = | **<u>රු.238,360.00</u>** |

*තමාගේම වී මෝල, වාහන ඇතිව පිටස්තර ප්‍රදේශවලට අලෙවි කරයි. බැංකු සමඟ සුහද සම්බන්ධතාවයක් ගොඩ නඟා ගෙන ඇත.*

**පස් වැනි සිද්ධි අධ්‍යයනය (Case study)**

**තමාගේම වී සහ වී මිල දී ගැනීමට හැකියාව පැවතීම, වී කෙටීම සඳහා තමාටම මෝලක් පැවතීම, ස්වශක්තියෙන් නැඟී සිටීමට හැකියාව පැවතීම හා පසු විපරම නිරතුරු සිදු කිරීම කර්මාන්තය සාර්ථකවීමට හේතු වී ඇත**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | - | අනුරාධපුර |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | පලාගල |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | - | පැරකුම්පුර |
| ගම්මානය | - | අලුත්ගල්කිරියාගම |

ඒ.එච්. ධම්මිකා හේරත් මහත්මිය සහල් සැකසුම් ව්‍යාපාර දැනට තරමක් දුරට සාර්ථකව කර ගෙන යනු ලබයි. මහවැලි කාන්තා සමිතිය හරහා "රිල්ෆ්" ආයතනය මැදිහත් වී කණ්ඩායමක් මඟින් සහල් සැකසුම සඳහා සම්බන්ධ වී ඇත. පුහුණුව ලබා දී ඇත්තේ පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟිනි.

මෙහි දී, මෙම සහල් සැකසුම්කාරිය තමාගේ ම වී මෝලක් පවත්වා ගෙන යයි. එම නිසා, වී කෙටීම සඳහා යන වියදම අවම කර ගත හැකි වී ඇත. එම මෝල හරහා ගම්වැසියන්ගේ වී ද කොටනු ලබයි. එසේ ම, එහි සහල් අලෙවි කිරීම ද සිදු කරයි. එම නිසා, අලෙවි දුෂ්කරතා බොහොමයක් මගහැරී ඇත. එසේ වුව ද, ප්‍රදේශයේ වී අස්වනු නෙලන කාලයට සෑම කෙනෙකුටම පාහේ සුළු ප්‍රමාණයක් හෝ වී පැවතීම නිසා එම කාලයට සහල් අලෙවි කිරීමේ දුෂ්කරතා පවතී. මෙම සහල් සැකසුම්කරු ප්‍රදේශයේ බහුලව ඉල්ලුම ඇති නාඩු සහල් වැඩිපුර නිෂ්පාදනය කරන අතරම සම්බා ද සුළු ප්‍රමාණයෙන් හෝ නිෂ්පාදනය කරයි.

යෙදවුම් උපකරණ පිළිබඳව සලකා බලනවිට කමත, බැරලය, ලිප ආදී යෙදවුම් උපකරණ පවතී. එසේ වුව ද, වී පොඟවන ටැංකියක් නොමැතිවීම ගැටලුවක් බවට පත්වී තිබේ. එකවර විශාල ප්‍රමාණයක් වී පෙඟවීම, වතුර නැවත නැවත මාරු කිරීම ආදිය සඳහා එය අපහසු වී ඇත. කෙසේ වෙතත්, මෙම ගම්මානයේ අනිකුත් සහල් නිපදවන්නන් සමඟ සසඳ බලන විට දැනට සාර්ථකව කර ගෙන යන බව පෙනේ. සාර්ථක වීමට හේතු ලෙස දක්නට ඇත්තේ තමාගේම කුඹුරුවල වී පැවතීම, වී මිල දී ගැනීමට හැකියාව පැවතීම, වී කෙටීම සඳහා තමාටම මෝලක් පැවතීම හා තමාගේ ස්වශක්තියෙන් නැඟී සිටීමට දිරිමත් වීම හා කණ්ඩායම මෙහෙය වන්නා තුළ ඇති දිරිමත් කිරීම ලෙස දැක්විය හැකි ය.

මෙම සහල් සැකසුම්කරුගේ යෝජනා අනුව ඔවුන්ට වසර පුරා නිශ්චිත මිලක් හා සහල් අලෙවියට නිශ්චිත ස්ථානයක් අවශ්‍ය බව පෙනේ.

ගම්මානවල මෙවැනි එක් අයෙකු හෝ සිටීම ලබා දුන් පුහුණුවේ සාර්ථකත්වය පෙන්වන්නකි. සියල්ලන්ටම අලෙවිය සඳහා යොමු විය නො හැකි අතර කිහිපදෙනෙකු ඉදිරියට යාම තුළින් පසු අස්වනු තාක්ෂණ ආයතනයේ අරමුණු ඉටුවීමට එය හේතු පාදක වේ.

## හය වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**නිශ්චිත වෙළෙඳපොළක් පැවතීම හා තමන්ගේ උනන්දුව උත්සාහය කැපවීම ව්‍යාපාරය සාර්ථක වීමට හේතු වී ඇත.**

**ඩී. සුනිල් ජයලත් මයා, ඉසුරු සිරි හාල් මෝල, අංක 2 ජනපදය, ගිරිතලේ**

ගිරිතලේ අංක 2, ජනපදයේ පදිංචි සී. සුනිල් ජයලත් මහතා වයස අවුරුදු 40 ක් වන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ දක්වා ඉගෙනීම ලබා ගත්තෙකි.

පසු අස්වනු තාක්ෂණ ආයතනය මගින් මෙම තාක්ෂණය හඳුන්වා දුන් 2005 වර්ෂයේ දී එම ආයතනයේ පුහුණුව හා ණය සහනාධාර යටතේ මෙම කාර්යයට යොමු වී ඇත. ආරම්භයේ බැරලය මගින් මෙම කාර්යය සිදු කොට වර්තමානය වන විට මහා පරිමාන සහල් මෝල් හිමිකරුවකු හා වාහන අයිතිකරුවකු බවට පත්ව සිටී.

2005 කණ්ඩායමේ දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් මූලික ණය මුදලක් ලබා දිනකට වී කිලෝ 1500ක් පමණ සිදු කොට තිබේ. කළුතර හා නාගොඩ ප්‍රදේශවල සිටින තම හිතවතෙකු මාර්ගයෙන් මෙම සහල් අලෙවිය ආරම්භයේ සිදු කර ඇත. පිටස්තර වී මෝල්වල තම ඇති බෑග්වල සහල් පැක් කිරීම සිදු කර ඇත්තේ ආරම්භක අවස්ථාවේ ය.

තමාට හොඳ අලෙවි මාර්ග පවතින විට ලක්ෂ පහක ණය මුදලක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ලබා ගෙන 'ස්ටීම්' වී මෝලක් සවි කර ඇත. තමාගේ නමින් අසුරණ මුද්‍රණය කරන ලද අතර ඒ තුළින් ප්‍රචාරණයක් ඇති විය. තමාගේ සහල් හොඳ බවට ලද ප්‍රසිද්ධිය තුළින් කළුතර අලෙවිසැල් හතරක් සහ මීගොඩ අලෙවි සැලක් හඳුනා ගෙන තිබේ. මෙම අලෙවිසැල් සඳහා වාෂ්ප බොයිලේරු භාවිතය සිදු කරන අතර බැරල් භාවිතය අතහැර දමා තිබේ.

ඉහත වෙළෙඳසැල් පහක් සඳහා මාසයකට සහල් කිලෝ 7500 x 5ක් තමාගේ වාහනයෙන් යවන අතර මාසයකට කිලෝ 750ක් මීරිගම අලෙවිසැලකට ප්‍රවාහනය කරනු ලැබේ.

තමන් විසින් කුඹුරු අක්කර පහක වී වගා කරන අතර මෙම සියලුම වී ප්‍රමාණයන් සහල් සැකසුමට යොදවා ගනී. මෙයට අමතර ව, ගම්මානය තුළ ගොවීන්ගෙන් වී ලබා ගැනීම සිදු කරයි. මෙම ගම්මානය තුළ කුඹුරු අක්කර 600-700ක් අතර ප්‍රමාණයක් පවතී. සාමාන්‍ය අස්වැන්න අක්කරයකට බුසල් 100ක් පමණ වන අතර ගම්මානය තුළ කන්නයකට බුසල් 6000ක් පමණ නිෂ්පාදනය වෙයි. ගම්මානය තුළ වී අස්වැන්නෙන් 25%ක ට වැඩි ප්‍රතිශතයක් මොහු විසින් මිල දී ගනු ලබයි.

මෙම ගම්වාසීන්ට වී අලෙවිය පිළිබඳ ගැටලු නැත. තමන් විසින් අවශ්‍ය ගොවීන්ට ණය මුදල් පවා ලබා දෙන අතර ඒ සඳහා ඉතාම සාධාරණ මිලක් ගෙවීමට සූදානම් ය. වී මිල කෙතරම් ඉහළ ගිය ද එය තමනට ගැටලුවක් නොවන බව පවසන සුනිල් මහතා මිල වැඩි වීම පාරිභෝගිකයින්ගෙන් අය කිරීම සිදුවන බව පවසයි. මාසයකට වී කිලෝ 70,000ක් පමණ සහල් බවට පත් කරයි. සාමාන්‍යයෙන් වර්ෂයට මාස 8-10ක් අතර පමණ මේ ආකාරයට වැඩ කරන බව සඳහන් විය. වී කිලෝ 12000ක් තමා ගබඩා කොට තබා ගන්නා අතර වර්ෂා කාලයට වැඩ කිරීමට හැකි වේලන යන්ත්‍රයක් මොහු සතුව පවතී.

සහල් අලෙවියට අමතරව වී කුඩු අලෙවියෙන් ද මෙම කර්මාන්තකරු තම ආදායම තවදුරටත් සරු කර ගෙන ඇත. මෙම ව්‍යාපාරය සාර්ථකවීමේ දී පසු අස්වනු ආයතනයෙන් ලබා ගත් පුහුණුව එම ආයතනයේ ලබා දුන් සහයෝගය පිළිබඳ ඒ මහතා ගෞරවාන්විත ව සිහිපත් කරයි.

**නිශ්චිත වෙළෙඳපොළක් පැවතීම හා තමන්ගේ උනන්දුව, උත්සාහය, කැපවීම ව්‍යාපාරය සාර්ථක වීමට හේතු වී ඇත.**

### හත් වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**සහල් සැකසුම සඳහා ඇති පුහුණුව ප්‍රමාණවත්වීම, පුද්ගලයා සතුව පවතින උනන්දුව, කැපවීම, සහල් සැකසුම වෙනුවෙන් මුදල් යෙදවීමට තවත් ආර්ථික මාර්ග පැවතීම, සහල් සැකසුමට යොදා ගත හැකි වෙනත් පුහුණුවීම් පැවතීම ස්වශක්තියෙන් නැඟී සිටීමට හැකියාව පැවතීම, කර්මාන්තය සාර්ථකවීමට හේතු වී තිබේ.**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | - | පුත්තළම |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | දංකොටුව |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | - | දංකොටුව |
| සහල් සැකසුම් ගම්මානය | - | මයිලන්කුලම |
| සමිතියේ නම | - | ගොවි ශක්ති" සමිතිය |

අධ්‍යයනයට ලක් කරන ලද පහළ බූජ්ජම්පල ගමේ ප්‍රථමයෙන් පිහිටුවා ඇතේත් "ගොවි ශක්ති" නම් ගොවි සමිතියකි. පසුව මාදම්පේ කෘෂිකර්ම කලාප කාර්යාලයේ මූලික උපදෙස් මත සහල් සැකසුම සඳහා කැමැත්තක් දක්වන පුද්ගලයින් දහ දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකට අනුරාධපුර පසු අස්වනු තාක්ෂණ ආයතනයෙන් පැමිණි නිලධාරියෙකු විසින් ඒ සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී ඇත. ඒ අනුව, යමින් ආරම්භයේ දී පුද්ගලයින් දහදෙනෙකු පමණ මෙම සහල් සැකසුම් කර්මාන්තය සමඟ සම්බන්ධ වී ඇත. ඔවුන්ගෙන් වර්තමානය වන විට, මෙම කර්මාන්තයේ නිරත වන්නේ අටදෙනෙක් පමණ වේ. එම පිරිස අතුරෙන් ද, සාර්ථක ලෙස සහල් සැකසුමේ නිරත වන්නේ එක් කර්මාන්තකරුවෙක් පමණි. එම පුද්ගලයා සතුව පවතින උනන්දුව, කැපවීම, සහල් සැකසුම සඳහා ඇති පුහුණුව ප්‍රමාණවත්වීම, සහල් සැකසුම වෙනුවෙන් මුදල් යෙදවීමට තවත් ආර්ථික මාර්ග පැවතීම, සහල් සැකසුමට යොදා ගත හැකි වෙනත් පුහුණුවීම් පැවතීම ආදිය හේතුවෙන් ඔහුගේ ව්‍යාපාරය සාර්ථක වී තිබේ.

මෙම පුද්ගලයා සතුව ගම්මානය තුළ මෙන් ම අසල්වාසී ගම්මානවල ද අලෙවි මාර්ග පවතී. බොහෝ අය පුද්ගලික හැඳුනුම්කම් මාර්ගයෙන් කාර්යාලවල අලෙවියට පහසුකම් සලසා ගෙන තිබේ. මෙවැනි කර්මාන්තකරුවන් සඳහා අදාළ ආයතන විසින් පසු විපරම සිදු කොට තවදුරටත් අලෙවි මාර්ග සලසාදීම වැදගත් බව හඳුනා ගැනීමට හැකි විය.

අට වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**නිශ්චිත අලෙවි මාර්ග නොමැති වීම කර්මාන්තය අසාර්ථකවීමට හේතු වී ඇත**

එච්.එම්. රෝහිනී හේරත්
කුසුම් සහල් සැකසුම් ගම්මානය
180/1, කුසුම් පෙදෙස
දිවුලන්කඩවල
මැදිරිගිරිය

මෙම ගම්මානය 2008 වර්ෂයේ පසු අස්වනු තාක්ෂණ ආයතනය යටතේ ආරම්භ කොට ඇත්තේ සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ මෙහයවීම යටතේ ය. ආරම්භක අවස්ථාවේ දී රු.4800/- ක් අය කොට බැරල් එකක් ලබාදීම සිදු කොට ඇත. මේ යටතේ දහදෙනෙකු පුහුණුව ලබා තිබේ.

විවිධ ගැටලු සහගත තත්ත්ව යටතේ මේ කණ්ඩායම සහල් සැකසුම සිදු කොට ඇති අතර 2012 වර්ෂයේ ආරම්භයේ 'දිවිනැගුම' යටතේ යලි නව ආරම්භයක් සිදු වී ඇත. මේ යටතේ කමත් විශාල කර, ජල ටැංකි ලබා දී තිබේ. මේ සඳහා රු.40,000/-ක මුදලක් එක් අයෙකුට ලබා දී ඇති අතර ඉන් රු.20,000/-ක් ආපසු ගෙවීමේ පදනම මත ය. 2005-2012 වර්ෂවල සහල් සැකසුම සඳහා පුහුණුව ලැබූ මුළු සංඛ්‍යාව 35කි. වර්තමානය වනවිට එම ප්‍රමාණය අලෙවිය හා පරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කරන හය දෙනෙකු දක්වා අඩු වී තිබේ.

- 2008 වර්ෂයේ ආරම්භයේ දී මෙම සහල්වලට හොඳ ඉල්ලුමක් පැවති ඇත. 2009-2010 වර්ෂය වන විට ගම්මාන තුළ පුද්ගලික අයිතිය යටතේ නව වී මෝල් ඉදි වී තිබේ. ගුණාත්මක තත්ත්වයට වඩා මිල පිළිබඳ උනන්දුවක් දක්වන හා පාරිභෝගිකයන් හමුවේ මෙම මෝල්වලින් අඩු මිල සහල්වලට ගම්වාසීන් පුරුදු වී ඇත. මෙම අලුත් සහල් මෝල් සමඟ තරඟ කිරීමට කර්මාන්තකරුවන්ට නො හැකි වී තිබේ. කිලෝ 60ක වී මිටියක් අලෙවියෙන් ලැබිය හැකි මුදල රු.1600/-ක් බව පවසන මෙම ගම්මාන සහල් සැකසුම්කරුවන් එය සහල් බවට පත් කර අලෙවියෙන් රු.2000/-ක් ලැබිය හැකි බව පවසයි. නිරායාසයෙන් ස්වයංරැකියා මාධ්‍යයක් ගම තුළ නිර්මාණය වී තිබේ. තව ද, වී කිලෝ 64ක මිටියක් තම්බා, වේලා දීමට රු.200/-ක මිලක් අය කෙරේ. මෙය පූර්ණ ලාභදායී ක්‍රියාවක් බවට කරුණු අනාවරණය විය. මෙම ගම්මානයන් හි සහල් සැකසුම් කරන කිහිපදෙනෙකු මෙම ක්‍රමයට වී තම්බා, ශ්‍රමයට මිලක් ලබා ගෙන තිබුණි.

මෙම ගම්මානවල ගොවීන් සමඟ කළ සාකච්ඡාවල දී නිශ්චිත අලෙවි මාර්ග කිහිපයක් පිළිබඳව කරුණු ඉදිරිපත් විය.

- මෙම සහල් කුඹුරු අඩු ප්‍රදේශවල අලෙවිය සඳහා යැවීමට කටයුතු කළ යුතු ය.
- වැඩසටහන හඳුන්වා දුන් ආයතන මැදිහත්වී වෙළෙඳපොළ සොයාදීම කළ යුතු ය.
- සමුපකාරය හෝ වෙනත් රාජ්‍ය ආයතනයක් සහල් මිලට ගැනීම සිදු කළ යුතු ය.

වී අලෙවිය හා සහල් අලෙවිය පිළිබඳ අවබෝධයක් මෙම කර්මාන්තකරුවන් සතු ය. නිශ්චිත අලෙවි මාර්ග පවතී නම්, ආදායම් ඉපැයිය හැකි හොඳ ස්වයං රැකියා මාර්ගයක් නිසා වගකිව යුතු අංශ මේ පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු බවට ද කරුණු අනාවරණය විය.

## නව වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**වී සහනදායී මිලකට ලබා ගැනීමට නො හැකිවීම කර්මාන්තය අසාර්ථකවීමට හේතු වී ඇත**

දිස්ත්‍රික්කය - කුරුණෑගල

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගිරිබාව

ගොවිජන සේවා මධ්‍යස්ථානය - පැරකුම්පුර

ගම්මානය - සිවල්ලවගෙදර

පසු අස්වනු තාක්ෂණය ආයතනය මඟින් පුහුණුව ලැබූ මෙම සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය කොතෙක් සාර්ථක වී තිබේ ද යන්න පිළිබඳව අප සාකච්ඡාවට බඳුන් කරන ලදී. ඔවුන්ගේ අදහස් විමසා බලන කළ අපට ගම්‍ය වූයේ මෙම පුහුණුව නිසි ආකාරව ලැබී ඇති බවකි. සිවල්ලවගෙදර පසිඳු ගොවි කාන්තා සමිතියේ කාන්තාවන්ගේ ඉල්ලීම් මත කෘෂිකර්ම උපදේශක නිලධාරී විසින් (AI) ස්වයං රැකියාවක් ලෙස හඳුන්වා දී ඇත. මෙම පුහුණුව සඳහා කැමති පිරිසකට සහභාගීවීමට අවස්ථාව උදා වී තිබේ. ප්‍රථමයෙන් එම පුහුණුවට 14 දෙනෙකු සහභාගී වී ඇත. එසේ වුව ද, බැරල් 11ක් පමණක් තිබෙන බැවින් ප්‍රායෝගික පුහුණුවට ගොස් තිබෙන්නේ 11 දෙනෙකු පමණි. මෙම සහල් සැකසුම කර ගෙන යාමට ගොවි සංවිධානය හරහා රු.25,000ක් ලබා දෙන බව පවසා තිබේ. එහෙත් එම මුදල මෙම පිරිසට ලැබී නොමැත.

මෙම පිරිස මෙම සහල් සැකසුම ආරම්භ කළ ද, එය සාර්ථකත්වයට පත් නො වුනි. තම පරිභෝජනයට පමණක් ආරම්භයේ දී සුළු වශයෙන් සහල් සැකසුම කර තිබේ. එසේ වුවත්, මේ වන විට මුළුමනින් ම සහල් සැකසුම නතර කර ඇත. ඒ සඳහා බලපා තිබෙන ප්‍රධාන ගැටලුව නම් වී ලබා ගැනීමේ අසීරුතාවය යි. මොවුන්ට කුඹුරු තිබුණ ද ඒවායින් නිසි පරිදි අස්වැන්න ලබා ගැනීමේ ගැටලු පවතී. ඊට හේතුව නම් අවශ්‍ය ප්‍රමාණයට වැසි ජලය නොමැතිකම නිසා කුඹුරු කර ගෙන යාමට නො හැකි වීමයි. මේ වනවිටත් කුඹුරු කර ගැනීමට ප්‍රමාණවත් තරම් ජලය නොමැතිකම නිසා නතර කොට තිබේ. ප්‍රධාන වශයෙන් ම, මොවුන්ගේ සහල් සැකසුම වී ලබා ගැනීමේ අසීරුතාව නිසා මඟ නතර වී තිබෙන බව නිරීක්ෂණ දත්තවලින් තහවුරු වීය. සහල් සැකසුම සිදු කිරීමේ දී දුර බැහැරකින් ප්‍රවාහන ගාස්තු ද ගෙවා ගනිමින් වී ගෙන ඒම සිදු වී ඇත. එසේ කිරීමෙන් සහල් සැකසුමෙන් ලැබෙන ලාභයක් නොමැත. එබැවින්, සහල් සැකසුම නතර කිරීමට සිදු ව තිබේ.

මෙම පිරිසට සහල් සැකසුම සඳහා වී සහනදායී මිලකට ලබා ගැනීමට යම් පියවරක් ගතහොත් යළිත් එය අලෙවිය දක්වා වර්ධනය කර ගැනීමට කැමැත්තක් තිබෙන බව පවසයි. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හරහා තමන්ට සහනදායී මිලකට වී ලබා දෙන්නේ නම් යළිත් සහල් සැකසුම කළ හැකි බව මෙම පිරිසගේ අදහස විය. වී ලබා ගැනීමේ දී ප්‍රවාහන වියදම ද අඩුකර ගැනීම සඳහා ගම තුළ දී ම තමන්ට වී මිලයට ගැනීමට වැඩපිළිවෙලක් සකස් කිරීම පිළිබඳව ද මොවුන්ගේ යම් බලාපොරොත්තුවක් තිබේ.

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො,ප.පු.ආ
HARTI

දහ වැනි සිද්ධි අධ්‍යයනය (Case study)

**ගල් වැලි ඉවත් නොවීම නිසා අලෙවි කර ගැනීමේ ගැටලු හේතුවෙන් කර්මාන්තය අසාර්ථකවීම**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | - | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | ගිරිබාව |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | - | පැරකුම්පුර |
| සහල් සැකසුම් ගම්මානය | - | කුඹුක්වැව |
| සමිතියේ නම | - | සඳලිය කාන්තා සමිතිය |

සඳලිය කාන්තා සමිතිය, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වනිතා කටයුතු අංශය මඟින් පිහිටුවා තිබුණි. මෙම සමිතිය මඟින් පසු අස්වනු තාක්ෂණ ආයතනය හරහා මෙවැනි ව්‍යාපෘතියක් ආරම්භ කරන බවට සාමාජිකත්වය දැනුවත් කොට ඒ සඳහා කැමති අයට සහභාගි වන ලෙසට දැනුවත් කොට ඇත. අනුරාධපුරයේ පසු අස්වන තාක්ෂණ ආයතනයෙන් ගමට පැමිණ ලබාදුන් පුහුණුව ඉතාමත් සාර්ථක බව සාමාජිකත්වය පවසයි.

ආරම්භයේ දී (2011) බැරල් ලබා ගැනීමට මුදල් තිබෙන අය හත්දෙනෙකු ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කර ගන්නා ලදී. පුහුණුව ලබාදීම ආරම්භක කාල සීමාවේ දී සහල් සැකසුම සාර්ථකව සිදු කෙරී ඇත. මේ වන විට මුළුමනින් ම අලෙවියට සහල් සැකසුම නතර කොට, වර්තමානය වන විට තම පරිභෝජනයට පමණක් සහල් සකස් කිරීම සිදු කරයි. පසු අස්වනු තාක්ෂණ ආයතනයේ පුහුණුව ලබාදීම ආරම්භයේ සාර්ථකව සිදු කෙරී ඇත. එසේ වුව ද, ඉන් පසුව සහල් සැකසුම පිළිබඳ පසු විපරමක් සිදු නොවීම ගැටලුකාරී වී තිබේ. මෙම ගම්මාන කර්මාන්තකරුවන්ට සහල් සැකසුමට අවශ්‍ය උපකරණ වල හිඟයක් පවතින අතර ඒවා ලබා ගැනීමට මූල්‍යමය ශක්තියක් නොමැති බව පෙනී යයි.

මෙම පිරිසට පවතින ප්‍රධාන ගැටලුව ගල් වැලි ඉවත් කරන මෝලක් ගම තුළ නොමැති වීමයි. ගල් වැලි ඉවත් කරන ලද මෝලක් ගමෙන් පිටත කිලෝමීටර් 7ක පමණ දුරකින් පිහිටා ඇත. එසේ වුවත්, එම මෝලෙන් කොටනු ලබන්නේ මෝල් හිමියාගේ වී පමණි. සහල් සැකසූ පසු ගල් වැලි ඉවත් නොවීම නිසා අලෙවි කර ගැනීමේ ගැටලු මතු වී තිබේ. මෙම පිරිසට තමන්ගේ වී ලබා ගැනීම ද ගැටලුවක් වී තිබේ. ඊට හේතු වී ඇත්තේ වැසි ජලය නොමැතිකම නිසා කුඹුරු කර ගැනීමට ඇති අපහසුව ය.
සහල් සැකසුම නැවත අලෙවිය දක්වා වර්ධනය කර ගැනීමට තවදුරටත් ඉදිරිපත් කරන යෝජනා පහත සඳහන් වේ.

i ගල්වැලි ඉවත් කරන පොලිෂ් කළ හැකි වී මෝලක් ගම්මානයට ලබාදීම

ii සහල් සැකසුමට අවශ්‍ය මූලික ද්‍රව්‍ය ලබා ගැනීමට සහන පොලියට ණයක් ලබාදීම

iii ජල හිඟය හේතුවෙන් තම කුඹුරුවල අස්වනු ලබා ගත නො හැකි නිසා පිටතින් වී ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීම

iv නිරතුරු පසු විපරම සිදු කිරීම

**ඒකොලොස් වැනි සිද්ධි අධ්‍යයනය (Case study)**


**සහල් නිෂ්පාදනයට අවශ්‍ය වී ලබා ගැනීමට අපහසුවීම නිසා අසාර්ථකවීමට හේතු වී ඇත**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | - | පුත්තලම |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | දංකොටුව |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | - | දංකොටුව |
| සහල් සැකසුම් ගම්මානය | - | ස්මයිල්පුරම් |

සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඇගයීම අධ්‍යයනයේ දී පුත්තලම දිස්ත්‍රික්කයේ මයිලන්කුලම, ස්මයිල්පුරම් නම් ග්‍රාමය ද අධ්‍යයනයට ලක් විය. 'World Vision' නම් රාජ්‍ය නොවන සංවිධානයේ උපරිම දයකත්වයෙන් ගමේ 35 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකට මෙම සහල් සැකසීමේ කර්මාන්තයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබී තිබුණි. සියලු පහසුකම් සහිත වී මෝලක් ගම්මානය තුළ පිහිටුවා ඇත (ගබඩාව, කමත, වී තම්බන ලිප, පොගවන ටැංකි ආදී පහසුකම්) ඇත. එය සහල් සැකසුමට පුහුණුව ලැබූ සාමාජිකයන් 35 දෙනාට අයිති බව සලකයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණ ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමයි. 2011 වර්ෂය දක්වා අති සාර්ථක ලෙස පවත්වා ගෙන පැමිණ ඇත. එම වසරේ දී රජය මගින් ක්‍රියාත්මක කරන ලද තබ්බෝව වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය හේතුවෙන් මෙම ප්‍රදේශයට ජල සැපයුම අඩාල විය.

මේ නිසා, වී ගොවිතැන කර ගෙන යාමට නො හැකිවීම හේතුවෙන් සහල් සැකසුම් කර්මාන්තය නතර වී තිබේ. දැනට පවතින ප්‍රධාන ගැටලුව නියමිත අයුරු වී නො පැවතීමයි. වී මෝලේ සියලු පහසුකම් පවතින අතර දැනට ඉදි කරන ලද නාම පුවරුව ගලවා බිම දමා ඇත. වී කෙටීමේ උපකරණ තව නොබෝ දිනකින් දිරායාමේ තත්ත්වයකට පත් වේ.





**යෝජනා**

1. මෙම ඉදිකරන වී මෝලෙන් නිසි ප්‍රයෝජන ලබා ගැනීමට පිටස්තර ප්‍රදේශයකින් හෝ වී මිල දී ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම.

මේ තුළින් සාමාජිකත්වය 35 දෙනෙකුගේ ජීවනෝපාය මාර්ග උසස් වන අතර ගුණත්වයෙන් ඉහළ සහල් පරිභෝජන අවස්ථා ඉහළ යාම සිදු වේ.

# නිගමන සහ යෝජනා

කිසියම් සමාජයක පුද්ගලයන්ගේ ජීවන තත්ත්වයේ යහ පැවැත්ම රඳා පවතින්නේ ඔවුන්ගේ විවිධ අවශ්‍යතා කොතෙක් දුරට ඉටු කර ගත හැකි ද යන්න මතයි. වෙළෙඳපළට භාණ්ඩ හෝ සේවාවන් සැපයීම සඳහා කිසියම් පිරිවැයක් දැරීමට සිදු වන අතර පාරිභෝගිකයා භාණ්ඩය හෝ සේවාව වෙනුවෙන් ගෙවන මිලෙන් පිරිවැය පියවා ගෙන කිසියම් ලාභ ප්‍රමාණයක් ලබා ගැනීමට සපයන්නාට හැකි විය යුතු ය. වෙළෙඳපොළට භාණ්ඩය හෝ සේවාව සැපයීමට පුද්ගලයින් උනන්දු වන්නේ කිසියම් ලාභයක් උපයා ගත හැකිනම් පමණි. සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය තුළින් ද දිස් වූයේ කිසියම් ලාභයක් උපදවන කර්මාන්තකරුවන්, ඉදිරියට ගොස් ඇති බවයි. සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීම තුළින් මේ පිළිබඳ කරුණු රාශියක් හඳුනා ගැනීමට හැකි විය.

**6.1 සොයා ගැනීම්:**

1. අලෙවිය හා පරිභෝජනය සිදු කරන සමස්ථ නියැදි සාමාජිකත්වය 47% (172)ක් වන අතර පරිභෝජනයට පමණක් සිදු කරන ප්‍රමාණය 41%(151)කි. ඒ අනුව, සමස්ථ නියැදියේ .88% (323) ගුණාත්මක තත්ත්වයේ සහල් පරිභෝජනයේ යෙදී ඇත.

2. අලෙවිය සහ පරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කරන සමස්ථ නියදි ප්‍රමාණය 47% ක ප්‍රතිශතයකි. මේ අනුව, නව තාක්ෂණය හඳුන්වා දී වර්තමානයේ අලෙවිය යෙදෙන ප්‍රතිශතය 50%කට ආසන්නව වී ඇත.

3. අලෙවිය සඳහා යොදවන කර්මාන්තකරුවන් ගෙන් 56%ක (සමස්ථ නියැදියේ 26%) මෙය ප්‍රධාන රැකියාව ලෙස සිදු කරන අතර 44% ප්‍රතිශතයක් (සමස්ථ නියැදියේ 20%) ක ද්විතියික රැකියාවක් ලෙස සිදු කරයි. මේ අනුව පැහැදිළි වන්නේ ස්වයංරැකියාවක් ලෙස හඳුන්වා දීමට හැකි කර්මාන්තයක් බවයි.

4. අලෙවිය සහ පරිභෝජනය සඳහා සැකසුම සිදු කරන සමස්ථ නියදි (47%න්) ප්‍රමාණයෙන් කාන්තා නියෝජනය 62%ක් වන අතර පිරිමි නියෝජනය 38%ක් වේ. සහල් සැකසුම කාන්තාවන්ට සුදුසු ස්වයංරැකියාවක් බව සමස්ථ නියැදියේ 85% (312) ක මතය විය.

5. සමස්ථ නියැදියේ අලෙවිය සඳහා සහල් සැකසුම සිදු කරන කුටුම්භ සංඛ්‍යාව 172කි. එනම් ප්‍රතිශතයක් ලෙස 47%ක් වන අතර මෙම ප්‍රතිශතයෙන් 9%ක් අති සාර්ථකව මෙම කර්මාන්තය සිදු කර ගෙන යයි. තරමක් සාර්ථක තත්ත්වයෙන් කර්මාන්තය ගෙන යන 70 % ප්‍රතිශතයක් සිටින අතර අසාර්ථක වී ඇති පිරිස 21% කි.
(කර්මාන්තය සාර්ථකව පවත්වා ගෙන යන්නේ ද පිළිබඳ ව විමසා බැලීමට නිර්නායක 20 යොදා ගත් අතර සහල් සැකසුම් ගම්මානය තෝරා ගැනීම, ව්‍යාපෘතිලාභියා තේරීම, පුහුණුව ලබාදීම, ආයතන සබඳතා, තිරසාර සාධක, තමාගේ වී තිබේ ද?, වී මිල දී ගැනීම (මිල/දුර),

ණය ලබා ගැනීම, ශ්‍රමය ලබා ගැනීම, වී ගබඩා පහසුකම්, වී මෝල්, වී කෙටීමේ මිල, සහල් අලෙවිය, පසු අස්වනු තාක්ෂණ ආයතන පසු විපරම, වෙනත් ආයතන පසු විපරම, ප්‍රචාරණය, අනෙකුත් වී මෝල් සමග පවතින තරඟය).

**ව්‍යාපෘතියේ ක්‍රියාත්මක ක්‍රමවේදය**

6. ව්‍යාපෘතිලාභීන් තෝරා ගැනීමේ දී ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කිරීමක් සිදු කොට නොමැත. ඕනෑම ආයතනයකට පසු අස්වනු තාක්ෂණ ආයතනය හා සම්බන්ධ වී එම කර්මාන්තය සඳහා අවශ්‍ය පුහුණුව ඕනෑම ප්‍රදේශයකට ගෙන යාමේ හැකියාව පවතී. මේ හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණය (58%) ඉක්මවා යමින් කර්මාන්තකරුවන් බිහි වී තිබේ.

**පුහුණු වැඩසටහන්වල ඵලදායීතාවය**

7. පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් ලබාදුන් පුහුණුව, මෙම සහල් සැකසුම කාර්යය සාර්ථක කරලීමට වඩාත් ඵලදායී වූ බව සමස්ථ නියැදියේ 94%ක් කර්මාන්තකරුවන්ගේ මතය විය.
   - පසු අස්වනු ආයතනයේ එක් අරමුණක් වන්නේ, ගුණාත්මක තත්ත්වයේ සහල් පාරිභෝගිකයාට ලබාදීම ය. මෙම කර්මාන්තය තුළින් 85% වැඩි පිරිසක් ම පරිභෝජනය සඳහා සහල් සැකසුම සිදු කර ගනිති.

**ව්‍යාපෘතිය හා බැඳුණු ආයතනික සබඳතා**

8. සහල් සැකසුම් ගම්මාන වැඩසටහන හඳුන්වාදීමේ දී ආයතන සමාජ මෙහෙවරක් ඉටු කරනවාට වඩා තමන්ගේ ආයතනයේ ප්‍රසිද්ධිය වෙනුවෙන් කටයුතු කර ගැනීමක් හඳුනා ගත හැකි ය.

9. සහල් සැකසුම් ගම්මාන ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතියේ දී ආයතන ප්‍රතිපත්තිවල අඛණ්ඩ බවක් නොමැතිවීම ද ආයතනික වශයෙන් සිදුව ඇති ප්‍රධාන ගැටලුවකි.

10. මැදිහත්ව වැඩ කළ ආයතනවල පසු විපරම නොමැතිවීම කර්මාන්තකරුවන් අධෛර්යමත් වීමට හේතු වී ඇත (44.5%).

11. අස්වනු නෙලන කාලයට වී ගබඩා කිරීමට ණය මුදලක් ලබා ගැනීමට නො හැකි වීම කර්මාන්තකරුවන්ට (61.2%) ගැටලු වී ඇත.

**සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතියේ තිරසාර භාවය හා බැඳුණු සාධක**

12. සහල් සැකසුමට අවශ්‍ය මූලික උපාංග නොමැතිවීම කර්මාන්තය දිගටම සිදු කර ගෙන යාමට (42.5%) ගැටලු වී ඇත.

13. ප්‍රමිතියෙන් උසස් වී ලබා ගැනීමට නො හැකිවීම නිසා වී මිල දී ගන්නා කර්මාන්තකරුවන්ට පාඩු විඳීමට සිදු වී ඇත (පිටතින් වී මිල දී ගැනීමේ දී වැඩි මිලක් හා බොල් වැඩිවීම - (66.1%).
   - බහු අස්වනු නෙලීමේ යන්ත්‍රය භාවිතා (Combine Harvester) කිරීමේ දී පවතින බොල් ප්‍රමාණය ඉහළවීම හා තෙත ගතියෙන් යුතුවීම මෙයට හේතු වී ඇත.

14. ජලය නිසි අයුරින් නොමැති ගම්මාන සඳහා සහල් සැකසුම් ගම්මාන වැඩසටහන සාර්ථක නොවේ. නිසි අයුරින් වී සේදීම සිදු නොවන අතර බොල් වී වැඩි ප්‍රමාණයක් ඉතිරිවීම සිදු වේ. මේ හේතුවෙන් වැඩි කළු ඇට ප්‍රමාණයක් සහල්වලට එකතුවීම සිදු වේ - 58%.

15. ගල් වැලි ඉවත් කිරීමේ මෝල් නොමැතිවීම නිසා අලෙවියට බාධා එල්ල වී ඇත (කළු ඇට පැවතීම ද අලෙවියට විශාල තර්ජනයක් වී තිබේ).
   - කළු ඇට සෑදීම බොහෝ දුරට බොල් ඇට නියම ආකාරයෙන් ඉවත් නොවීම මත සහ ගොයමට සෑදෙන ලෙඩ රෝග තුළින් සිදුවන බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය.

16. වී කෙටීම සඳහා අය කරන මිල වැඩිවීම
   - සහල් පොලිෂ් කර ගල් වැලි ඉවත් කිරීම සඳහා රු.4.50ක මිලක් අය කරයි. මෙම මිල අලෙවි මිල වැඩිවීමට තදින්ම බලපා තිබේ. තව ද, මෙම මෝල්, ගල් වැලි ඉවත් කළ ද එය හරියට සිදු නොවීම ද ගැටලු වී තිබේ.

17. උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය සඳහා කුඩා හා මධ්‍යම පරිමාණ සහල් මෝල් වැඩි දියුණු කිරීම අවම තත්ත්වයක පවතී. ආරම්භය හා වර්තමානය දක්වා පැමිණීමේ දී නවීන තාක්ෂණය සහිත වී මෝල් ප්‍රමාණය 51%කින් වර්ධනය වී ඇත. එසේ වුව ද, එයින් මෙම ගොවීන්ට සහනයක් වී නොමැත.

**සහල් අලෙවියට නිශ්චිත වෙළඳපොළක්**

18. සකසන ලද සහල් අලෙවි කිරීමට නිශ්චිත වෙළෙඳපොළක් හෝ ස්ථානයක් නොවීම - 89.4%
   - කුඹුරු ඇති කර්මාන්තකරුවන්ට සහල් පිටතින් මිල දී ගැනීමට අවශ්‍ය නැත. ඒ නිසා, ග්‍රාමීය මට්ටමේ වෙළඳපොළක් සාද ගැනීමට අපහසු වී ඇත.

19. අවශ්‍ය ප්‍රමාණයට වඩා ගම තුළ පුහුණුව ලබාදීම නිසා සැකසුම්කරුවන් ගම්මානය තුළ වැඩිවීම (56.2%) අලෙවි කිරීමට බාධා වී ඇත.
   - සියලුම සහල් සැකසුම්කරුවන් සහල් අලෙවිය සඳහා තෝරා ගෙන ඇත්තේ තම ගම්මානයයි.

20. සහල් සැකසුම් ගම්මානවල සහල් සැකසුම එක දිගට සිදු නොවන අතර මේ නිසා ගැණුම්කරුවන් දුරස්වීම (42.4%) සිදුවී ඇත.

- කුඹුරු කාලයට සහ වැසි කාලයට මෙම කාර්යය නතර කිරීමට සිදු වී ඇත. එයට හේතුව කුඹුරු වැඩ කිරීම හා එයට උදව් කිරීමේ සිදුවීම ය. විශේෂයෙන් කාන්තාවන් ආහාර පාන සැකසීමේ කටයුතුවල නිරත .නිසා මෙම කාර්යය කෙටි කලකට නතර කිරීමට සිදු වේ. මේ හේතුවෙන්, තමන් අමාරුවෙන් සකසා ගත් අලෙවි ජාලය විනාශ වී යයි. යළි මෙම කාර්යයට එළඹෙන විට ගැණුම්කරුවෝ වෙනත් ස්ථානවලින් සහල් මිල දී ගැනීමට පෙළඹී සිටිති.

- වී මිල ඉහළ ගිය ද හාල් මිල ඉහළ නොයන අවස්ථා එමට ය. මෙහි දී, වී මිල දී ගෙන සහල් සැකසුම කරන සැකසුම්කරුවන්ට මෙම කාර්යයෙන් ඉවත්වීමට සිදු වී ඇත. එසේ තාවකාලිකව හෝ ඉවත් වීමේ දී තමන් සාදගත් අලෙවි මාර්ගය කැඩී බිඳී යනු ඇත. එවිට, තමන්ගේ සහල් මිල දී ගත් පාරිභෝගිකයන්, වෙනත් සහල්වලට හුරු වේ. මෙම තත්ත්වය සහල් අලෙවිකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවකි.

21. සුළු පරිමාණව සිදුවන මෙම කර්මාන්තකරුවන්ට මහා පරිමාණ සහල් මෝල් හිමියන් සමඟ තරඟ කිරීමට හැකියාවක් (82.4%) නොමැත.

- ගුණාත්මක තත්ත්වයට වඩා මිල සහ ප්‍රමාණය ගැන උනන්දුවන පාරිභෝගිකයන් හමුවේ මේ තත්ත්වය උදා වී තිබේ.

22. අලෙවියේ දී සහල් ණයට දීම ද කර්මාන්තය කර ගෙන යාමට (52%) ගැටලු වී ඇත.

- රජයේ රැකියා කරන අයට මෙන් ම කුමක් හෝ රැකියාවක නියුතු අයවලුන් මුදල් ලබා දෙන්නේ මාසයේ අවසානයට ය. සහල් ණයට ලබාගත් අලෙවි සැල් මෙම ණය මුදල් ලබා දීමේ දී දින 7-10 දක්වා කාල පරාසයක් ඒ සඳහා වැය කරයි.

23. තමන්ගේ නිෂ්පාදන නිසි ප්‍රමිතියෙන් තොරවීම නිසා අලෙවියට බාධා (49.3%) එල්ල වී ඇත.

24. වෙළෙඳපොළ පවතින මිලට වඩා අඩු මිලකට පාරිභෝගිකයා වෙත උසස් තත්ත්වයේ සහල් ලබාගත හැකි වී ඇත.

- සහල් අලෙවිය ගම්මානය තුළ සිදු කිරීමේ දී වෙළෙඳපොළ පවතින මිලට වඩා රුපියලක් හෝ දෙකක් වැඩියෙන් අලෙවිය සිදු කොට නගරයට ආසන්නව, පවතින මිලට වඩා රුපියලක් හෝ දෙකක් අඩුවෙන් අලෙවි කිරීමට සිදු වේ. විශාල වී මෝල් හිමියන් මහා පරිමාණයෙන් නගරය ආක්‍රමණය කිරීම මෙයට ප්‍රධාන හේතුව වී ඇති බව ගොවි සාකච්ඡාවල දී හෙළි විය.

25. වෙනත් ආදායම් මාර්ග පවතී නම්, සහල් සැකසුම් ගම්මානවල සාර්ථකත්වයක් දැකිය හැකි ය.

26. නාඩු සහල් නිෂ්පාදනය සඳහා වැඩි පිරිසක් (90%) පෙළඹී ඇත.

- තමන් විසින් නාඩු වී වර්ගය වගා කරන නිසා පාරිභෝගික වැඩි ඉල්ලුම, ප්‍රදේශය තුළ ද බහුල වී වර්ගය සොයා ගැනීමට ඇති පහසුව, අඩු මිලකට ලබාගත හැකිවීම, වැඩි ලාභ ප්‍රතිශතයක් ලබා ගැනීමට හැකිවීම, නාඩු සහල් පෝෂණ ගුණයෙන් ඉහළ බව, මේ සඳහා හේතු රාශියක් ගොවි සාකච්ඡා වලින් පැහැදිළි විය.

27. ගම්මානවල සහල් සැකසුම්කරුවන්, මෙම තාක්ෂණය යටතේ වී තම්බා වියළා දීමට කටයුතු කළ අවස්ථා විය. වී මිටියක්, එනම් කිලෝග්‍රෑම් 64ක් තැම්බීමට රු.200/-ක මුදලක් අය කරයි. මෙය සැකසුම්කරුවන්ට හොඳ ලාභදායී ක්‍රමයකි (උදා: දිවුලන්කඩවල, මැදිරිගිරිය).

## 6.2 නිගමන

1 ග්‍රාමීය මට්ටමෙන් ගෘහාශ්‍රිත සහල් වෙළෙඳපොළ ඇති කිරීමේ අරමුණ සැලකිල්ලට ගැනීමේ දී, සහල් සැකසුම් ගම්මාන සංකල්පය ශ්‍රී ලංකාවේ ගුණාත්මයෙන් යුත් සහල් නිෂ්පාදනය, වී අලෙවිය සහ රැකියා වියුක්තිකයන්ට ආදායම් උත්පාදනය යන අංශවල පවතින ගැටලූ ගණනාවකට විසඳුම් සපයන වඩාත් උචිත ක්‍රමවේදයක් වෙයි.

2 සහල් සැකසුම් ගම්මාන සංකල්පය ගම තුළට ඇතුළු වී ඇත්තේ සාම්ප්‍රදායික සහල් සැකසුම් ක්‍රම වල පවතින අඩුලුහුඩුකම් මඟ හරවා ගනිමින් ඉහළ ගුණාත්මයෙන් යුතු සහල් සැකසීමේ තාක්ෂණය, ඒ සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, කුඩා කණ්ඩායම් ඔස්සේ මූල්‍ය පහසුකම් සහ අලෙවිකරණයේ දී ඇති වන අභියෝග වලට මුහුණ දීමට හැකි නව්‍ය ක්‍රමවේදයක් ලෙසට ය.

3 ව්‍යාපෘතිලාභීන් තෝරා ගැනීමේ දී ක්‍රමවත් වැඩ පිළිවෙලක් අනුගමනය කිරීමක් සිදු කොට නොමැත. එම නිසා, ව්‍යාපෘතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලද ක්‍රමවේදයට වඩා වෙනස්, සහල් සැකසුම සිදු කළ හැකි පුද්ගලයන් තෝරා සිදු කරන ක්‍රමවේදයක්වීම වැදගත් වේ.

4 ගෘහාශ්‍රිත මට්ටමෙන් සහල් සැකසුම සිදු කිරීමේ විශාල වශයෙන් ක්‍රියාවලිය පුරාම පවුලේ ශ්‍රමය භාවිතා කිරීම මත රඳා පවතී.

5 කර්මාන්තයේ ලාභය තීරණය කරන ප්‍රධාන නිර්ණායකය වන්නේ නිතර වෙනස් වන වී මිලයි. මෙම ගැටලුවට එක් විසඳුමක් වන්නේ කර්මාන්තකරු විසින් ම නිපදවන වී

භාවිතා කිරීමයි. අස්වනු නෙලන කාලයේ වී ගබඩා කොට තබා ගැනීම, වෙනත් විකල්පයක් වුව ද, මූල්‍යමය සහ ගබඩා පහසුකම් නොමැති වීම එයට බාධාවකි.

6 ඉහළ ගුණාත්මයෙන් යුතු සහල් නිපදවීමට අත්‍යවශ්‍ය වන ගල් වැලි ඉවත් කිරීමේ මෝල් සමහර ගම්මානයන් හි තවමත් ස්ථාපිත කොට නොමැති වීම සහල් වල ගුණාත්මය කෙරෙහි අහිත කර ලෙස බලපා තිබේ. මෙම තත්ත්වයන් තුළින් පැහැදිළි වූයේ, උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය සඳහා සහල් මෝල් වැඩි දියුණු කිරීමක් මෙම වැඩසටහන හරහා සිදු නොවූ බවයි.

7 පසු විපරම නිරතුරු සිදු කිරීම කර්මාන්තය සාර්ථකවීමට හේතු වී තිබේ.

8 අකර්මන්‍යව පවතින පවුලේ ශ්‍රමය, විශේෂයෙන් කාන්තා ශ්‍රමය අර්ථාන්විත ආකාරයකට යොදවා ගැනීමේ හැකියාවක් පවතින, කෘෂි ආශ්‍රිත කර්මාන්තයක් ලෙස මෙම සහල් සැකසුම් ගම්මාන වැඩසටහන ඉහළ වැදගත්කමක් පෙන්නුම් කරයි.

## 6.3 නිර්දේශයන්

1. සහල් සැකසුම් ගම්මාන ක්‍රමයේ ප්‍රගතිය දෙආකාරයකින් විග්‍රහ කළ හැකි වේ.
   - යැපුම් මට්ටමේ දී ගුණාත්මක සහල් පරිභෝජනය දිරිගැන්වීම සඳහා ගුණාත්මක සහල් නිපදවීමේ තාක්ෂණය ප්‍රචලිත කිරීම.
   - වාණිජ මට්ටමේ දී සහල් සැකසුම් කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.

2. ගුණාත්මක තත්ත්වයේ සහල් පරිභෝජනය දිරි ගැන්වීම සඳහා මෙම තාක්ෂණය දිවයින පුරා ව්‍යාප්ත කළ යුතු අතර ඒ සඳහා ගුණාත්මක සහල් සැකසුම් ක්‍රමය පිළිබඳව කෘෂි ව්‍යාප්ති නිලධාරීන් හරහා ගම් මට්ටම දක්වා දැනුවත් කොට ග්‍රාමීය සංවිධානවල (ගොවි සංවිධාන, කාන්තා සමිති, රාජ්‍ය නොවන සංවිධාන හා ස්ථාපනය කළ සමිති) ඉල්ලුම මත පදනම් වෙමින් කණ්ඩායම් ප්‍රවේශයක් ඔස්සේ පුහුණු වැඩසටහන් දියත් කළ යුතු ය.

3. ගුණාත්මක සහල් සැකසීම වාණිජ මට්ටමේ කර්මාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගල ප්‍රවේශයක් අනුගමනය කළ යුතු අතර ඒ සඳහා පහත සඳහන් කරුණු වෙත අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ.
   - විභව කර්මාන්තකරුවන් හඳුනා ගැනීමේ දී ව්‍යවසායකත්ව කුසලතා සහිත සහල් සැකසීම කර්මාන්තයක් වශයෙන් පවත්වා ගෙන යාමට කැමැත්ත හා කැපවීම ඇති, ප්‍රාග්ධනය සපයා ගත හැකි පුද්ගලයන් තෝරා ඔවුන් මෙම කර්මාන්තය වෙත යොමු කිරීම.

- කර්මාන්ත සඳහා යොමු වූ පුද්ගලයන් පිළිබඳ පසු විපරම් කොට ඔවුන් මුහුණදෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා පියවර ගැනීම. උදා.: ණය පහසුකම් සැපයීම හා අලෙවි ගැටළු නිරාකරණය කිරීම.

4. කර්මාන්තකරුවන්ට අස්වනු නෙලන කාලයේ මෙන් ම අතරමැද කාලයේ දී ද වී මිල දී ගැනීමට ණය ලබාදීම අත්‍යවශ්‍ය තත්ත්වයකි. මෙය සහල් සකසන කණ්ඩායම තුළින් ම ඇති කිරීමේ ක්‍රමයක්, චක්‍රීය අරමුදලක් ආකාරයට ක්‍රියාත්මක ක්‍රමයක් හෝ බැංකු මඟින් ණය ලබා ගැනීමේ ක්‍රමයක් මඟින් කළ හැකි ය (කණ්ඩායම තුළ විධිමත් ණය ක්‍රමයක් මඟින්, වී මිල ගණන් අඩු කාලයට මිල දී ගැනීමේ අවකාශය ලබා දිය යුතු ය).

5. ගුණාත්මක සහල් නිෂ්පාදනයට අවශ්‍ය ප්‍රධාන අංගයක් වන්නේ නිෂ්පාදනවල ගල් වැලි ඉවත් කිරීමයි. එනිසා, ග්‍රාමීය මෝල් වලට එම උපකරණ ලබාදිය යුතු ය. මෙමඟින් ව්‍යවසායකයන්ට ඔවුන්ගේ නිෂ්පාදන වල ගල් වැලි ඉවත් කළ සහල් ලෙස ලේබල් කළ හැකි වීම නිසා නිෂ්පාදන ඉහළ මිලකට විකිණිය හැකි වෙයි. මෙම යන්ත්‍ර සහ උපකරණ මිල දී ගැනීමට බැංකු මඟින් පවතින පොළී අනුපාතයන්ට වඩා අඩුවෙන් ණය ලබා දීමට කටයුතු කළ යුතු ය.

6. ගුණාත්මක සහල් නිෂ්පාදන කර්මාන්තයේ අඛණ්ඩ වර්ධනය උදෙසා මෙන් ම ගුණාත්මක සහල් පාරිභෝජනය ජනප්‍රිය කරවීම සඳහා රාජ්‍ය ප්‍රචාරක වැඩසටහන්වල දී මෙම තාක්ෂණය ප්‍රචාරණය කිරීමට පියවර ගැනීම.

7. ප්‍රාදේශීයව සාර්ථකව කර්මාන්තය සිදු කරන කර්මාන්තකරුවන් හඳුනා සුපිරි වෙළෙඳසැල් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු ය. මේ අයගේ ජාතික මට්ටමේ සංවිධානයක් තුළින් මහා පරිමාණ කර්මාන්තකරුවන් සමඟ තරඟ කිරීමේ අවස්ථාව ලබා දිය යුතු ය.

රාජ්‍ය ආයතනයක් වී මිල දී ගනු වෙනුවට මෙම සැකසූ සහල් මිල දී ගත යුතු ය. එම සහල් වෙළෙඳපොළට නිකුත් කිරීම, ස.තො.ස. හෝ සමූපකාර සමිති හරහා සිදු විය යුතු ය.

ගොවිජන සේවා, සමෘද්ධි අධිකාරිය හෝ සමුපකාරය වී මිල දී ගෙන මෙම පුහුණුව ලැබූ අය හරහා ගුණාත්මක තත්ත්වයේ සහල් නිපදවා නැවත ඒ අයගෙන් සහල් ලබා ගැනීම සිදු කොට, එම සහල් සමෘද්ධිලාභීන් ඇතුලු අනෙකුත් පාරිභෝගිකයන්ට අලෙවි කළ යුතු ය. මේ තුළින් පෝෂණ තත්ත්වයෙන් උසස් සහල් ජනතාව වෙත බෙදා හැරෙන අතර නිරෝගී පරපුරක් බිහි වීමට අවශ්‍ය පසුබිම සැකසේ.

10. අලෙවිය සඳහා කිසියම් අයෙකු හෝ කිසියම් ආයතනයක් මැදිහත් විය යුතු ය. ආයතනය/ඔහු විසින් අලෙවි කාලය හඳුනා සහල් සැකසුම්කරුවන්ගේ සහල් එකතු කොට අලෙවිය සිදු කළ යුතු ය. මේ තුළින් තවත් පුද්ගලයෙකුට රැකියා අවස්ථා හිමි වේ.

11. සහල් සැකසුම් ගම්මාන සඳහා පසු විපරම් නිලධාරියෙකු පත් කිරීම අනිවාර්ය වේ. මෙම පසු විපරම් නිලධාරියා විසින් නව වෙළෙඳපොළ අවස්ථා උදකර දිය යුතු ය.
    - මෙවැනි කර්මාන්තයක් තුළ කර්මාන්තකරුවන් තවදුරටත් රඳවා ගැනීම සඳහා ආයතනික සහාය ඉතා අත්‍යවශ්‍ය සාධකයකි. සහල් සැකසුම් ගම්මාන වැඩසටහන හඳුන්වා දෙන ආයතන විසින් පසු විපරම සිදු කළ යුතු ය.

12. මෙම සහල් සැකසුම් කර්මාන්තය තරුණ පරපුර වෙත ආකර්ෂණීය ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දිය යුතු ය. විශේෂයෙන්, මේ සඳහා තෝරා ගත යුත්තේ දැනට සහල් සැකසුම් කර්මාන්තයේ නියැලී සිටින තරුණ කොටස් වේ. අනිවාර්යයෙන් පුහුණුවක්, නව තාක්ෂණය යටතේ වී මෝලක් සවිකර ගැනීමට උපදෙස් හා සහන පොලී පදනම මත ණය මුදල් ලබා දිය යුතු ය.

13. ග්‍රාමීය මට්ටමේ, උසස් තත්ත්වයේ සහල් නිෂ්පාදනය වර්ධනය වී ඇත්තේ බහුතරයක් පරිභෝජන අවස්ථා සඳහා වේ. සහල් නිෂ්පාදනය ව්‍යාපාරික මට්ටමෙන් ආරම්භ නොවිය යුතු අතර අවශ්‍ය අයට ඒ තත්ත්වයට පත්වීමට උදව් කළ යුතු ය.

    කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ගොවි කාන්තා වැඩසටහන් හරහා මෙම කර්මාන්තය දියුණු කළ යුතු ය. එවිට, ගුණාත්මක තත්ත්වයේ සහල් පරිභෝජනය වැඩි කළ හැකි වේ. ගුණාත්මක සහල් නිෂ්පාදනය යන අරමුණ ඔස්සේ මෙය සාර්ථක ව්‍යාපාරයක් බවට පත් ව ඇත. අවශ්‍ය අයට අලෙවිය සඳහා යොමු වී ව්‍යාපාරික තත්ත්වයට පත්වීමේ හැකියාව පවතී. අලෙවියට යොමු වී එය කර ගෙන යා නො හැකි කර්මාන්තකරුවෝ පසුව තම පරිභෝජනයට පමණක් නිපදවා ගනිති. හඳුන්වා දී ඇති බැරලය මඟින් ද මහා පරිමාන ව සිදු කළ නො හැකි අතර සාමාන්‍ය තත්ත්වයේ අලෙවියක් මේ තුළින් සිදු කළ හැකි බව ගොවි සාකච්ඡා වලින් හෙළි විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ගම්මානවල විශේෂත්වය හා සාර්ථකත්වයට හේතු වී ඇත්තේ කෘෂිකර්ම උපදේශක නිලධාරී අනිවාර්යයෙන් පසු විපරම සිදු කිරීම ය.

ඉහත සඳහන් කළ නිගමන හා යෝජනා තුළින් පැහැදිලි වන්නේ සහල් සැකසුම් ගම්මාන ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙන යාම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයේ සහල් පරිභෝජනය වැඩි දියුණු වන අතර එය 'මහින්ද චින්තන' සංවර්ධන ක්‍රියාදමය මල්ඵල ගැන්වීමට හේතු පාදක වන බවයි. ගුණාත්මක තත්ත්වයෙන් යුතු සහල් පරිභෝජනය දිරිගැන්වීම සඳහා මෙය වඩාත් උචිත ක්‍රමවේදයක් වන බැවින් ඉදිරියේ දී රටේ අනෙකුත් ප්‍රදේශවලට ද මෙය ව්‍යාප්ත කරවීම තුළින් දේශීය සහල් වෙළෙඳපොළ ප්‍රාදේශීයකරණය කිරීමට හැකියාව ලැබේ.

# REFERENCES


1. Cassam, M. and, Newman. C.L.(1983), *Sri Lankan Rice Industry;* Ronco Consulting Corporation, 1629 K Street, N.W. Suite 401, Washington, DC 20006.

2. Central Bank of Sri Lanka, (2005), *The Consumer Finances and Socio-Economic Survey Report* – 2003/04, Part I, Central Bank of Sri Lanka.

3. Central Bank of Sri Lanka, (2009-2011), *Annual Report*, Central Bank of Sri Lanka.

4. Department of Agriculture (2010), *Cost of Cultivation of Agricultural Crops* , (2009/2010 *maha*) Socio-Economics and Planning Centre, Department of Agriculture, Peradeniya Sri Lanka.

5. Department of Census and Statistics (2010), Paddy Statistics, Department of Census and Statistics, Colombo, Sri Lanka.

6. Gamawelagedara W.C., Wickramasinghe Y.M. and Dissanayake C.A.K *The Journal of Agricultural Science* (2011), Sri Lanka.

7. Hector Kobbekaduwa Agrarian Research and Training Institute, (2002-2006), Food Information Bulletin, Hector Kobbekaduwa Agrarian Research and Training Institute Colombo, Sri Lanka.

8. Institute of Post Harvest Technology, (2005-2012) Annual Report, *Anuradhapura District* Sri Lanka.

9. Institute of Post Harvest Technology *(2005), Status and Future Prospects of the Rice Processing as a Cottage industry in Anuradhapura District Sri Lanka.*

10. K. K. Sharmini, Weerakkody P.R, Epasinghe S. and Epakanda N.S.B. *Viability of Rice Processing at Household Level* (2008), Hector Kobbekaduwa Agrarian Research and Training Institute Colombo, Sri Lanka.

11. Palipane, K.B. (2003), *Milling and Quality Improvement in Rice* Congress 2000 edited by Abeysiriwardena D.S. , Dissanayake D.M.N. and Nugaliyadde L. Department of Agriculture Peradeniya, Sri Lanka.

12. Paddy Marketing Board, (1976), *A Plan to Assist the Private Rice Millers of Sri Lanka in Modernizing Their Rice Mill*, Paddy Marketing Board, Colombo, Sri Lanka.

13. Perera, H.E.M.(1975) *Survey of Re-Processing of Ration Rice in Sri Lanka.* Paddy Marketing Board, Colombo, Sri Lanka.

24258

තැ.පෙ. 1522
කොළඹ,
ශ්‍රී ලංකාව.

දු.අ. 94112696981
94112696437

ෆැක්ස් 9412692423.

විද්‍යුත් තැපැල්:library@harti.lk

වෙබ් : www.harti.gov.lk

ISBN 978-955-612-157-5
9 789556 121575

රු 380/-

National Digitization Project

*National Science Foundation*

Institute : National Science Foundation

1. Place of Scanning : Sanje (Private) Ltd, Hokandara
2. Date Scanned : 02/06/2017
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : Angelo Melvin Luwis

Signature : A. M. [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Information Officer

Name : Renuka Sugathadasa

Signature : K.P. Sugathadasa

Date : 02/06/2017

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*